





**ජපන් රජයෙන් ප්‍රදානය කළ පද්ධති දෙකෙන් ලැබුණේ එකයි. හේතුව රටේ වරදක්**

**2007 වසරේදී ඇමෙරිකාවෙන් මිලදී ගත් ඩොප්ලර් රේඩාර් පද්ධතියට වෙච්ච දෙයක් නෑ**

# ඩොප්ලර් රේඩාර් පද්ධතියක් ලැබිලත් වැඩක් නොගත් රටකට වූ විපතක්



**මෙම සටහන තබන විට විපත සිදු වී දින හයක් ගත වී අවසන් ය. මේ මොහොත වන විට රටේ පුරවැසියන් පහළොස් ලක්ෂ පනස්අටදහස් නවසිය දහනවයක් (15,58,919) ආධාර ලැබිය යුතු මට්ටමක පසුවෙමින් ඇත. ආපදාවෙන් සුරක්‍ෂා කිරීම පිණිස පිහිටුවන ලද මධ්‍යස්ථාන 1433ක පුද්ගලයන් දෙලක්ෂ තිස්දෙදහස් හත්සිය පනස් දෙකක් (232,752) අවතැන්ව ඇත. මෙම සටහන තබන අවස්ථාව වන විට විපතින් මරණයට පත් පිරිස 465 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර පුද්ගලයන් 366 දෙනකුට සිදු වූ දෙයක් නැත. මහපොළොවේ යථාර්ථයට අනුව ඉදිරියේදී ඔවුන් ද මරණයට පත් පිරිසගේ සංඛ්‍යාලේඛනවලට එක්වීමට නියමිතය. සමස්ත ව්‍යසනයේ ගැඹුර සහ ව්‍යසනය විසින් ඇති කරන ලද කම්පනය තේරුම් ගැනීමට ඉහත සඳහන් සංඛ්‍යාලේඛන වුවද ප්‍රමාණවත් ය.**

**2022 වසරේ අවසන් කිරීමට නියමිතව පැවැති රේඩාර් පද්ධතියේ වැඩ තවමත් ඉබි ගමනේ**

මේ සා විසල් ඛේදවාචකයක් සිදුව ඇති වටපිටාවක ඛේදවාචකයේ ‘තරම’ අවම කර ගැනීම පිණිස අදාළ අංශ විසින් කටයුතු නොකළ බවට ඇතැම් පාර්ශ්වයන් විසින් චෝදනා නඟමින් ඇත. මළමිනී මතින් හෝ බලය ඩැහැග ැනීමට මාන බලන කුජීත දේශපාලනඥයන් මෙන්ම ඔවුන්ගේ උසිගැන්වීම් මත ඇතැම් සාමාන්‍ය ජනතාව ද වත්මන් ආණ්ඩුව වැඩි බැරි ආණ්ඩුවක් ලෙස උලුප්පා දැක්වීමට රටම අමු සොහොනක් බවට පත් කළ මෙම ස්වාභාවික විපත යොදා ගන්නා ආකාරයක් දකින්නට ලැබෙන අතර උද්ගතව ඇති තත්ත්වය හමුවේ මෙරට ශිෂ්ට සම්පන්න ජනතාව එය කිසිසේත් අනුමත කරන බවක් දකින්නට නැත. ඊට හේතුව ලෙස බොහෝ දෙනෙක් පෙන්වා දෙන්නේ රට විපතට පත් මොහොතේ දේශපාලන සොම්බින්ගේ අපුල දනවන රංගන පසෙක ලා වැටුන රට යළි නඟාසිටුවීම වඩා වැදගත් වන බවත් ය.



ඉදිවෙමින් පවතින ඩොප්ලර් රේඩාර් පද්ධතිය

රටේ දිස්ත්‍රික් බහුතරයක් ආවරණය වෙමින් නිමාවට පත් වූ ඛේදවාචකය සම්බන්ධයෙන් කිඹුල් කඳුළු හෙළන විපක්ෂයේ දේශපාලනඥයන් හමුවේ මෙවෙලෙහි සඳහන් කළ යුතු යමක් ඇත. එනම් මෙරට දේශපාලනයේ ඓතිහාසික අත්වැරදීම් නොවන්නට මෙවන් විපතක් රට හමුවේ සිදුවන්නට ඉඩක් නොතිබූ බව ය. අප එසේ සඳහන් කර සිටින්නේ කරුණු කාරණා රැසක් සාක්ෂි වශයෙන් තබා ගනිමින් බව පළමුව සිහිපත් කළ යුතුය.

## ඩොප්ලර් රේඩාර් පද්ධතිය

මෙම රේඩාර් පද්ධතියේ ප්‍රධාන කාර්යය භාරයන් වන්නේ වායුගෝලයේ පවතින වර්ෂාපතනයේ පිහිටීම සහ වැසි සහිත ප්‍රදේශ නිවැරැදිව හඳුනා ගැනීමය. එහිදී වර්ෂාපතනයේ තීව්‍රතාව, වර්ෂාපතනයේ ප්‍රමාණය සහ එහි දරුණු බව තීරණය කළ හැකිය. එමෙන්ම සුළගේ වේගය සහ දිශාව මෙමගින් නිවැරැදිව තීරණය කළ හැකි අතර සුළි සුළං, ටොනේඩෝ සහ දරුණු කුණාටු වැනි තත්ත්වයන් සමඟ සම්බන්ධ වූ සුළං රටා හා චලනයන් හඳුනාගත හැකිය. සමස්තයක් ලෙස ගත් කල ඩොප්ලර් රේඩාර් පද්ධතියක් යනු කාලගුණික අනාවැකිවල නිරවද්‍යතාවය ඉහළ නැංවීම සහ දරුණු කාලගුණික තත්ත්වයන් පිළිබඳව පූර්ණ අනතුරු ඇඟවීමේ හැකියාව සහිත මෙවලමක් ලෙස නම් කළ හැකිය. ලෝකයේ දියුණු රටවල් මෙන්ම දියුණු වෙමින් පවතින රටවල් මෙම තාක්‍ෂණය මගින් ඒ ඒ රටවල කාලගුණ තත්ත්වයන් නිරීක්‍ෂණය කිරීම තුළ ස්වාභාවික විපත් අවම කර ගැනීම් ක්‍රියාවලියේ නිරතව ඇත. මෙරටට මුල්වරට ඩොප්ලර් රේඩාර් පද්ධතියක් ගෙන ඒම සම්බන්ධයෙන් පවතින වාර්තා මගින් තහවුරු කර සිටින්නේ 2007 වසරේදී ලෝක කාලගුණ සංවිධානය (WMO) සමඟ එක්ව පිහිටුවන ලද අරමුදලක් මගින් එම රේඩාර් පද්ධතිය මෙරට ස්ථාපිත කිරීමට කටයුතු කර ඇති බවත් විවිධ අක්‍රමිකතා හේතුවෙන් එම ව්‍යාපෘතිය අසාර්ථකව ගොස් ඇති බවත් ය. ඇමෙරිකාවෙන් ගෙන්වන ලද එම රේඩාර් පද්ධතිය ගොංගාලකන්ද නම් ස්ථානයේ සවි කිරීමට උත්සාහ කිරීමේදී මුහුණදීමට සිදුව ඇති ප්‍රායෝගික ගැටලු රැසක් ද එම ව්‍යාපාතිය අසාර්ථක වීම සඳහා බලපා ඇති බව ඒ සම්බන්ධයෙන් පවතින තොරතුරුවල සඳහන්ව ඇත. මෙරට තුළ ඩොප්ලර් රේඩාර් පද්ධතියක් සවිකිරීමේ ආරම්භක අවස්ථාව එලෙස අපතේ යන අතර ඒ සඳහා වන දෙවැනි උත්සාහය ආරම්භ වන්නේ 2017 වසරේදී ය. එහිදී ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනය (JICA) සහ ශ්‍රී ලංකා රජය අතර ඒ සම්බන්ධව ගිවිසුමක් අත්සන් කරන අතර එහිදී ඇති වූ එකඟතාවකට අනුව නව රේඩාර් පද්ධතීන් දෙකක් ජපානය විසින් මෙරටට ප්‍රදානය කිරීමට එකඟ වන අතර එම රේඩාර් පද්ධතීන් ස්ථාපනය කිරීම පිණිස තෝරාගනු ලබන්නේ පුත්තලම සහ පොතුවිල් යන ප්‍රදේශයන් ය. මෙම පද්ධතීන්





2021 වසර වන විට ඉදිකර අවසන් කිරීමට නියමිතව තිබුණ ද එයට ද උරුම වන්නේ මෙරටට පළමුව රැගෙන එන ලද රේඩාර් පද්ධතියට සිදුවූ විපතමය. නව රේඩාර් පද්ධතිය ස්ථාපනය කිරීමට යැමේදී සිදු වූ ඉඩම් තෝරා ගැනීමේ ප්‍රමාදය, ප්‍රමාණවත් ප්‍රතිපාදන ඒ සඳහා නොලැබී යැම, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ගැටලු සහ අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම් ආදිය හේතුවෙන් එම ව්‍යාපෘතිය රට තුළ සැබෑවක් බවට පත්වීම දිනෙන් දින කල්යන අතර එහි ප්‍රතිඵලය බවට පත්වන්නේ කලින් සැලසුම් කළ රේඩාර් පද්ධතීන් දෙක වෙනුවට එක් පද්ධතියක් පමණක් මෙරට ස්ථාපනය කිරීමය. එම එකඟතාව ඇතිකර ගනු ලබන්නේ 2022 වසරේදීය. මේ වන විටත් එහි ඉදිකිරීම් සිදුකරමින් පවතින අතර වත්මන් ආරක්‍ෂක ලේකම් එයාර් වයිස් මාර්ෂල් (විශ්‍රාමික) සම්පත් තුයියකොන්තා මහතා ඉකුත් ජූලි 05 දා පුත්තලම ඩොප්ලර් කාලගුණ රේඩාර් ව්‍යාපෘතිය නිරීක්‍ෂණය කර ඇත. එහිදී ආපදා කළමනාකරණ පද්ධති නවීකරණය කිරීම සහ ජපානය සමඟ ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම සඳහා වන ජාතික උත්සාහය ආරක්‍ෂක ලේකම්වරයා විසින් අගැයීමට ලක් කරන ලදී.



ඩොප්ලර් රේඩාර් පද්ධතිය ස්ථාපනය කිරීමට නියමිත භූමිය ආරක්ෂක ලේකම්වරයාගේ අධීක්ෂණයට ලක්වන අයුරු.

විවිධ අක්‍රමිකතා, අවිධිමත් සැලසුම් දේශපාලන අතපෙවීම් මත අදින් වසර 18කට පෙර මෙරට ස්ථාපිත කිරීමට නියමිතව පැවැති ඩොප්ලර් රේඩාර් පද්ධතිය නියමිත පරිදි ඉදිකොට එහි ප්‍රයෝජන රටට ලබා ගත්තේ නම් මෙවර සිදුවූ ස්වාභාවික ආපදාවෙන් සිදු වූ විපත් මෙතරම් ඉහළ යන්නේ නැත. දැන් අශ්වයා පැන ගොස් ඇති බැවින් ස්තාලය පිළිබඳ කතා අවැසි නැත. සිදු වූ විපත පිළිබඳ වත්මන් රජයට දොස් පවරන විපක්‍ෂය ඉහත සඳහන් රේඩාර් පද්ධතිය පිළිබඳ අවබෝධයෙන් ද නැද්ද යන්න පිළිබඳ අපි කියන්නට දන්නේ නැත. කෙසේ වෙතත් එම අවස්ථාව රට හමුවේ විවර නොකිරීමේ වරද එවකට පැවැති රජයන් විසින් භාර ගත යුතු බව බොහෝදෙනාගේ වැටහීම බවට පත්ව ඇත. එවැනි තත්ත්වයක් තුළ විපක්‍ෂය විසින් හෙළන කිඹුල් කඳුළු සම්බන්ධයෙන් කිසිවෙක් සංවේදී නොවන බව සංවේගයෙන් යුතුව මෙහි සඳහන් කළ යුතුව ඇත.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පැවසූ පරිදි ඉකුත් 27, 28 දෙදින තුළ රටේ බොහෝ ප්‍රදේශවලට ගිගුරුම් සහිත වැසි පතිත වන බව දැනුම් දෙන ලදී. එම දනුම්දීම සිදුකරනු ලැබුවේ ඉකුත් 26 වැනි දිනය. එහිදී වැඩිදුරටත් රතු නිවේදනයක් නිකුත් කරමින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කර සිටියේ උතුර, උතුරුමැද, නැගෙනහිර ඇතුළු දිවයිනේ තවත් ප්‍රදේශ කීපයකට මිලිමීටර් 150ට වඩා තද වැසි ඇතිවිය හැකි බවත් සෙසු ප්‍රදේශවලට මිලිමීටර් 100ක පමණ වැසි තත්ත්වයක් ඇතිවිය හැකි බව ය. තවද එම දෙපාර්තමේන්තුව සඳහන් කර සිටියේ එම දින කීපය තුළ පැයට කිලෝමීටර් 50 - 60 අතර තද සුළං ඇති විය හැකි බවය. එහෙත් එම නිවේදන තවදුරටත් නිවේදනවලට පමණක් සීමා කරමින් එම දින දෙක තුළ දිවයිනේ ඇතැම් ප්‍රදේශවලට මිලිමීටර් 500 ඉක්මවා යන වැසි ඇදවැටුන අතර සුළගේ වේගයද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් දත්තයන් ඉක්මවා යමින් වියරු ලෙස හමා යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රටේ ප්‍රදේශ රැසක අපේක්‍ෂා කළ ප්‍රතිඵල ඉක්මවා යන විපතක් සිදු වූ අතර එය නිමාවීමක් සමඟ විපතට පත් ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් දේශපාලන සුළිසුළං හමායන අතර විපක්‍ෂය ආණ්ඩුවට චෝදනා කරන්නේ ආපදා තත්ත්ව කළමනාකරණය කිරීමේදී ආණ්ඩුව යම් අසමත්කමක් පෙන්නුම් කරන බවකි. මෙහිදී අප සඳහන් කර සිටින්නේ මෙවන් විපත්තිදායක මොහොතකදී හෝ එකිනෙක මත වරද පටවමින් ක්‍රියා කිරීම ගෝත්‍රික ක්‍රියාවක් බවත් රටේ විපතට පත් මිනිස් ජීවිත සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේදී දේශපාලන පක්‍ෂ, පාට, භේද කිසිසේත්ම අදාළ නොවන බවත් ය.

රුවන් ජයවර්ධන

## යන එන පාරට කරන අපරාධය

වසර 20කට පෙර මෙම පාරට මායිම්ව ඉඩම මිලට ගෙන නිවාස සාදා පදිංචි විය. මෙම පොදු පාරට, ප්‍රධාන පාරේ සිට නිවාස තුනක් ඇත. ඉඩම උසාවි නියෝගයකින් මැන පළල අඩි 15 ද, දිගින් අඩි 150 පමණ ද තිබේ. මෙම ඉඩමට පාරට අයිති ඉඩම් හිමියන් දෙදෙනකු විසින් රබර් වත්තේ වතුර ද, අනෙක් අය ඔහුගේ නිවෙසේ වතුර ද පාරට හරවා පාර සෝදාපාළුවට ලක් කරයි. මෙය සිදුවන්නේ වසර දෙකක පමණ කාලයක සිටයි. මේ සම්බන්ධව එදා සිට පොලිසියට, මදුරාවල ප්‍රාදේශීය සභාවට ලිපි මගින් සහ පැමිණිලි මගින් දැනුම් දුන්නත් ස්ථානයට පැමිණ බලා අවවාද කර යයි. නමුත් ඔවුන් කිසිදු ප්‍රතිචාරයක් දක්වන්නේ නැත. පාර කොන්ක්‍රීට් කිරීමට කියා පරීක්ෂා කර බලා ගියත් මෙතෙක් එය ද සිදු වී නැත. නිවෙස් දෙකක අප කළ යුතු දෙයක් නොමැතිව අසීරුවෙන් ගමන් කරමි. ජන බලවේගය ආණ්ඩුව ආවාට පසු 2025.11.14 ලිපියක් ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කර ඇත. පොදු පාරක් ලෙස මිනුම් කටයුතු කර ඇති මෙම පාරට කොන්ක්‍රීට් කර ගැනීම සඳහා ද ස්ථිර විසඳුමක් ලබා ගැනීමට රජයේ නිලධාරීන්ගේ අවධානය යොමු වේවා.

**ධර්මරත්න - කෙසෙල්හේනාව, පාදාගල**

# දිට්වාට යට නොවුණ අපේ මිනිසත්කම



අද්‍යතන ලෝකය තුළ සිදුවෙමින් පවතින ශීඝ්‍ර වෙනස්වීම් හමුවේ මිනිස් සබඳතා වියැකී යන බවට චෝදනා නැගෙමින් පවතින අවස්ථාවකත් ශ්‍රී ලාංකේය සමාජය තුළ මුල්බැසගත් මානව දයාවත්, අන්‍යෝන්‍ය සහයෝගීතාවත් තවමත් එලෙසින් ම ජීවමාන බව පසුගිය දින කිහිපය තුළ දිවයිනට බලපෑ දිට්වා සුළි කුණාටුව හමුවේ තවදුරටත් පසක්වුණි. විදේශිකයන් ඇතුළු ලෝකයේ අනෙකුත් රටවල් සහ සංවිධානවල මහා පරිමාණ පරිත්‍යාග ක්‍රියාවන්ට නොදෙවෙනි වූ අපේ ම ගම් දනව්වල, නගරබද ජනතාවගේ සහ විදේශගතව සිටින ලාංකිකයින්ගේ මිනිසත්කම ඇගයිය යුතු කාලය එළැඹ ඇත.

මෙම උදාර ගුණාංගය හුදෙක් සද්භාවයක් පමණක් නොව එය ඈත අතීතයේ සිට ම අපගේ සංස්කෘතියේ සහ ජීවන රටාවේ ද මූලිකාංගයක් බවට පත් ව තිබේ. ලාංකේය ඉතිහාසය පුරාම ශ්‍රී ලංකාව නොයෙකුත් විපත්වලට මුහුණ පෑ අවස්ථාවන්හිදී අප රටේ ජනතාව එලෙස විපතට පත්වූවන්ට දක්වන ලද සහයෝගය අති මහත් ය. විශේෂයෙන් ම 2004 වර්ෂයේ ඇති වූ සුනාමි ව්‍යසනයේදී මුළු මහත් රටම ජාති, ආගම් හෝ පන්ති භේදයකින් තොරව එක් වී එකිනෙකාට පිහිට වූ ආකාරය ජාත්‍යන්තර සංවිධානවල විධිමත් ක්‍රමවේදයන්ට වුව නොදෙවෙනි වුණි. නිවාස, දේපළ සහ ආදරණීයයන් අහිමි වූ අපේ ම ජනතාවට නවාතැන් ලබාදීමට, තමන් සතු සීමිත සම්පත් පවා විපතට පත්වූවන් සමග බෙදාහදාගැනීමට මෙන් ම ඔවුන්ව මානසිකව සවිබලගැන්වීමට ද අපේ ම මිනිසුන් කටයුතු කරන ලදී. පසුගිය වසර කිහිපය තුළදී මෙරට මුහුණ දුන් ආර්ථික අර්බුදය හමුවේ පවා අගහිඟකම්වලින් පීඩා විඳි ජනතාව අතරින් ම ඉස්මතු වූ මානුෂීය ක්‍රියාකාරකම් වුව අපමණ ය.

ශ්‍රී ලාංකිකයන් යනු යමෙකු අසරණ වූ විට හෝ පොදු කටයුත්තක් ක්‍රියාත්මක වන අවස්ථාවක තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා පසෙකලා අන්‍යයන් උදෙසා කැපවීමට සූදානම් පිරිසක් බව දිට්වා හමුවේ මොනවට විශද වුණි. ජාති, ආගම්, භේද නොසලකා ගංවතුරට ලක්වූවන් අපේ ම මිනිසුන් මැදිහත්වී මුදාගැනීම සහ ඔවුන්ගේ ජීවිත බේරාගැනීමට කටයුතු කිරීම, ජනතාව විසින් ම ජනතාවට අනතුරු ඇඟවීම, විපතට පත්වූවන්ට සහන සේවා සැලසීම, ඔවුන් රැක බලා ගැනීම යනාදිය රජයට, ත්‍රිවිධ හමුදාවට, පොලීසියට හෝ ස්වේච්ඡා සංවිධානවලට සීමා නොවී ජනතාව පුද්ගලිකව මැදිහත් වී සිදු කරනු දැක ගත හැකි විය.

මෙම සියලු ක්‍රියා තුළින් පිළිබිඹු වන්නේ අපගේ සංස්කෘතිය තුළ තදින් මුල් බැසගෙන ඇති කරුණාව, මෛත්‍රිය සහ අන්‍යයන් පිළිබඳ සංවේදිතාවය යි. මේවා හුදෙක් රාජ්‍ය හෝ ජාත්‍යන්තර සංවිධාන මගින් මෙහෙයවන විධිමත් ක්‍රියාපටිපාටීන් නොවන නමුත් ජීවිත දහස් ගණනකට සැනසුම ගෙන දෙන අව්‍යාජ මානව බැඳීම් වේ. එබැවින් දිට්වාට දෙවැනි නොවුණු මෙම සරල, උදාර මිනිසත්කම් අප දේශයට ආලෝකයකි. අපගේ සංස්කෘතියේ මෙම උරුමය තවදුරටත් ඉදිරියට ගෙනයාම අප සැමගේ වගකීමක් බව අවධාරණය කළ යුතු ය.

**චමෝදා තත්සරණි,**
**ජනසන්නිවේදන අධ්‍යයනාංශය,**
**කැලණිය විශ්වවිද්‍යාලය.**

## කොටිකාවත්ත පාර කැළි කසළින් පිරේ


බළන්ගොඩ සිට ඇඹිලිපිටියටත් ඇඹිලිපිටිය සිට බළන්ගොඩටත් යෑමට ඇති කෙටි මාර්ගයක් වූ මොරතොට, නීලගම හරහා කෙටේතැන්න මාර්ගය මීට වසර කීපයකට පෙර කාපට් අතුරා සෑදූ ප්‍රධාන මාර්ගයකි.

එම මාර්ගයේ දෙපසට නොයෙකුත් අය විසින් නිවාසවලින්, කඩවලින් හා මාර්ගයේ ගමන් ගන්නා ඇතැම් අය විසින් කුණු කවර පිටින් විසිකර මාර්ගය දෙපසම කුණුවලින් පිරී ඇත. තවද රාත්‍රි කාලයේදී හිස් මත්පැන් බෝතල් බියර් ටින් ද තැනින් තැන දමා ගොස් ඇත.

රජය විසින් ලක්ෂ ගණනාවක් වියදම් කර සෑදූ මෙම මාර්ගයේ පාසල් සිසුන් හා අවට ගම්මානවල ජනතාව සිය ගණනක් පයින් හා වාහනවල ගමන් කරන අතර ඒ අයට සමහර තැන්වලදී නහය වසාගෙන යෑමට සිදුව තිබේ. ඒ කුණු කවරවලින් පිටවන දුර්ගන්ධය නිසාය. තවද මෙම කවරවල හෝ බෝතල්වල ටින්වල වැසි වතුර පිරීම නිසා ඩෙංගු වැනි රෝග බෝවීමට ද තෝතැන්නක් වී ඇත.

ගරු පරිසර ඇමැතිතුමනි, පැල්මඩුල්ල ප්‍රා. ස. සභාපතිතුමනි සෞඛ්‍ය අංශ අදාළ නිලධරයනි මේ පිළිබඳ සොයා බලන්නේ නම් අවශ්‍ය කටයුතු කරන්නේ නම් ඔබලාට ස්තුතිවන්ත වෙමු.

**අසේල සමන්ත ධර්මවර්ධන**
**නීලගම - කහවත්ත**




**ආර්ථික සාමාජික දේශපාලන රටට වැඩදායක අදහස් යෝජනා මෙන්ම ආයතනික වශයෙන් තමන්ගේ අත්දැකීම් අසාධාරණකම් හා ප්‍රදේශයේ වගකිව යුතු අයගේ අවධානයට ලක්විය යුතු අඩුපාඩු රටට කියන්න මේ පිටුවෙන් ඉඩකඩ වෙන් කෙරේ. වචන 400කට නොවැඩි වනසේ ඔබේ අදහස් දුරකථන අංකයද සමගින් මේ ලිපිනයට යොමු කරන්න**

**සංස්කාරක,**
**අපේ පිටුව - අංක 42, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත - කොළඹ 8.**



le,Ks ñáhdjf;ka fufia wefia'''

# වෙල්ල රැක ගන්න කාලය එළැඹ ඇත

කැලණිය ආසනයට යටත් පුරවැසියකු ලෙස මේ සටහන ලියන්නට සුදුසුම කාලය මෙය යැයි විශ්වාස කරමි.

හැමදාම ගංවතුරක් එන වෙලාවට කැලණියට වතුර දායි, ගංවතුර ගලයි, ගෙවල් දොරවල් දාලා යන්නැයි අවවාද අනුශාසනා ලැබෙයි.

අපි මෙය අත්විඳින්නේ වසර ගණනාවක සිටයි. ඒ නිසාම මේ කතාව දැන් ලිවිය යුතුමයි.

සමනොළ කන්දෙන් ආරම්භ වී මෝදර මෝය කටින් මහ සයුරට සම්ප්‍රාප්ත වන කැලණි ගඟේ ඉවුරු දෙකකි.

එක ඉවුරක් කැලණිය රජ මහා විහාරස්ථානය පැත්තේ ඇති දකුණු ඉවුරයි. අනෙක් පැත්ත නම් එගොඩ කැලණිය, කැලණිමුල්ල, සේදවත්ත, තොටළඟ යා කෙරෙන බටහිර ඉවුරයි.

ගලන හැම ගංවතුරකටම යට වෙන්නේ එගොඩ කැලණියේ බටහිර ඉවුරයි.

අවිස්සාවේල්ල, හංවැල්ල, කඩුවෙල, කැලණිමුල්ල, සේදවත්ත සුසාන භූමිය අසලින් දිවෙන සේදවත්ත - තොටළඟ මාර්ගය ඔස්සේ පිටාර ගලන කැලණි ගංගා කොමළී කැලණිමුල්ල, කඩුවෙල, සේදවත්ත, තොටළඟ පමණක් නොව, දැන් අංගොඩ, වැල්ලම්පිටිය, කොළොන්නාව, මාලබේ දක්වාම ව්‍යසන ඇති කරමින් ජල ගැලීමෙහි නිරත වේ.

ඉවුරේ අනිත් පැත්තේ ඉන්නා හුදී ජනයා අපි වෙමු. කැලණි රජමහා විහාරස්ථානය, පිලපිටිය, පෙතියාගොඩ, පට්ටිය හන්දිය, පැලියගොඩ, හතරේ කණුව තීරයේ වෙසෙන සියලු ජනතාව මේ දකුණු ඉවුරේ වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියෝ වෙති. මේ දකුණු ඉවුර ආරක්ෂා කරන එකම ආරක්ෂකයා වන්නේ මීට වසර ගණනාවකට පෙර ගං ඉවුරට එපිටින් නිර්මාණය කර ඇති මහා වේල්ල හෙවත් ‘කැලණියේ බන්ට්’ එකයි. මේ දැවැන්ත වේල්ල නිසා මෙහා ඉවුරේ ජීවත් වෙන දහස් ගණනක් මිනිසුන්ගේ ජීවිත සහ දේපළ ආරක්ෂා වී තිබේ. බන්ට් එක තිබ්බේ නැත්නම් එන එන ගංවතුරට මෙහා ඉවුරේ අපිද හාංසිය. මෙම විශ්මකර්මය කවුරුන් කවදා නිර්මාණය කළා දැයි නොදන්නා නමුත් ඒ නිර්මාණ නියමුවන්ට ජාති ජාතිත් පින් සිදු වන්නට අපි අදටත් කරදරයක් නැතුව ආරක්ෂාවෙන් සිටින්නෙමු.

ඒ නමුත් මෑත කාලයේ සිට මේ ඉවුර සමීපයේ සිදුව ඇති අනවසර ඉදි කිරීම්, අනවසර නිවාස සහ පදිංචි වීම් හේතුවෙන් මේ වටිනා ආරක්ෂක බැම්මට විශාල හානියක් සිදුව තිබේ. පැලියගොඩ පොලිසිය පිටුපස සිට කැලණි විහාරය දෙසට මේ වේල්ල දිගේ පාගමනින් යන ඕනෑම කෙනකුට සිය ගණනක් වන අනවසර පදිංචිකරුවන් විසින් මේ වේල්ලට කර ඇති විනාශය සියැසින් දැක ගත හැක.

ආණ්ඩු මාරු වුණත්, පාලකයෝ නායකයෝ වෙනස් වුණත්, වෙනස් නොවෙන, අනවසර පදිංචිකරුවන් විසින් අරක්ගෙන තිබෙන මේ වටිනා රක්ෂිතය රැක ගැනීම ජාතියේ වගකීමක් බව කියමි.

යම් හෙයකින් මේ දකුණු ඉවුර බිඳී ගියහොත් සේදවත්ත පැත්තෙන් මාලබේට ගලනවා සේ කැලණිය, පැලියගොඩ පැත්තෙන් තොරණ හන්දිය, නුවර පාර වසාගෙන මහ ජල කඳක් ඇති වන බව සත්‍යයකි. එය වළක්වාලීමට කිසිවකුට කළ නොහැකි වනු ඇත.

දේශපාලන අමනයන් විසින් සිය වාසි තකා පදිංචි කර ඇති මේ අනවසර පදිංචිකරුවන්, ලැයිම්කාරයන් විසින් විනාශ කර ඇති ‘කැලණිය බන්ට් එක’ ආරක්ෂා කිරීම අද නැත්නම් හෙට හෝ ‘කොන්ද පණ ඇති කුමන හෝ ආණ්ඩුවක්’ කළ යුතුව ඇති යුතුකමකි. වගකීමකි. සේවයකි.

මේ අනවසර පදිංචිකරුවන්ට විකල්ප නිවාස සපයා දී වහාම ඔවුන් ඉවත් කොට කැලණිය වේල්ල ආරක්ෂා කිරීමට පියවර ගැනීම ඉතාම අත්‍යවශ්‍ය කරුණකි. අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමත් සමඟම කැඩී බිඳී ඇති වේල්ල ඉවුරු පිළිසකර කිරීමද අනිවාර්යයෙන් කළ යුත්තකි. රජය, විපක්ෂය, ජනතාව එකමුතුව මේ අභියෝගය ජය ගැනීම කළ යුතුම දෙයකි. මේ සඳහා විරුද්ධ වන කවරෙකු වුව ඊළඟ ව්‍යසනයේදී සිදු වන මහා විනාශයක වගකිව යුත්තෙක් වනු අනිවාර්යය.

මහ පොළොවේ මෙන්ම ජනතා ජීවිතවල අගය දන්නා නායකයෙක්, ජනතා නියෝජිතයෙක් කැලණියට අවශ්‍ය වන්නේ එහෙයිනි. කැලණි රජ මහා විහාරයේ නායක හාමුදුරුවන් වුව කරන්නේ මහ වරදකි. ආණ්ඩුවටම හැම දේම භාර නොදී ඔබ වහන්සේ පෙරට එන්න. එය කැලණියේ ජනතාවට සුබ කටයුතු ලෙස සිදුවනු ඇත. සම්බුදුරජාණන් වහන්සේගේ පාද ස්පර්ශයෙන් පූජනීය වූ මේ උතුම් පුණ්‍ය භූමියත් එහි ජනතාවත් රැක ගත යුතු නොවන්නේද?

ඒ නිසා හැම ගංවතුරකදීම වැලි කොට්ට ලෝඩ් එකකින් හිල් වසා තාවකාලික පිළියම් කොට ආරක්ෂා කරන කැලණියේ බන්ඩ් එක තව වසර කිහිපයකට හෝ ස්ථිරව ආරක්ෂා කිරීමට වගකිව යුතු නිලධාරීන්ගේ, රජයේ, කැලණි පන්සලේ නායක හාමුදුරුවන්ගේ, පළාතේ දේශපාලකයන්ගේ සහ මහජනතාවගේ වගකීමක් බව යළි යළිත් ලියා තබමි.

මේ අනවසර පදිංචිකරුවන්ගේ නිවාස සඳහා අනුමැතිය ලබා දුන් දේශපාලකයන්, ලයිට් වතුර දුන් නිලධාරීන්, ප්ලෑන් පාස් කරපු පගාකාරයන් මෙන්ම අනවසර පදිංචිකරුවන් ද ඉදිරියේ ඇති වීමට නියමිත මහා ජන සංහාරයක කොටස්කරුවෝ වනු නිසැකය. එවන් මහා ව්‍යසනයකට පෙර සැමගේ හිත සුව පිණිස මේ සටහන ලියා පළ කරමි. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ජනාධිපති අනුර දිසානායක මැතිතුමාටත්, එතුමාගේ ඇමැතිවරුන්ටත්, මන්ත්‍රී කණ්ඩායමටත්, ගම්පහ දිස්ත්‍රික්කයේ සියලු දේශපාලකයන්ටත්, අදාළ නිලධාරින්ටත් මේ සඳහා නිසි පියවර ගැනීමට ඥානය පහළ වේවායි පතමි.

**සුදේශ් කරුණාතිලක**

## ජම්බුගහපිටිය මාර්ගය පිළිසකර කරන්න

මහනුවර, නවයාලතැන්න, ජම්බුගහපිටිය දක්වා දිවෙන මහා මාර්ගය දිනපතා රථවාහන දහසක් පමණ ගමන් ගන්නා ප්‍රධාන මාර්ගයකි. මාර්ගය අබලන් වී වසර ගණනාවකි. ප්‍රදේශවාසීන්ගේ දැඩි බලකිරීම් හමුවේ විටින් විට යම් යම් අලුත්වැඩියා කටයුතු කළත් ඒ සියල්ල තාවකාලික පිළියම්ය. එක් වැස්සක් ඇදහැලුන විට නැවතත් පාරේ වළවල් මතු වේ. කානු පද්ධතියේ ද නිසි නඩත්තුවක් නොමැත. මේ සියල්ලෙන් පීඩා විඳින්නේ දිනපතා මෙහි යන එන මගීන්ය. ඒ නිසා අප ඉල්ලා සිටින්නේ නිසි ප්‍රතිසංස්කරණයක් සිදුකොට මෙම මහා මාර්ගය පීඩාවකින් තොරව මගී ජනතාවට ගමන් කළ හැකි තත්ත්වයකට පත් කර දෙන ලෙසයි.

**පී. බණ්ඩාර**
**ජම්බුගහපිටිය**

## වැඩිහිටි දීමනාව ලබන අයකුටත් බදු කොළයක්

**මාගේ පියාගේ වයස අවු. 92ක් වේ. රජයේ සංස්ථාවක (ක්ලාක්) රැකියාව කර සේවයෙන් විශ්‍රාම ගොස් දැනට වසර 35කට වැඩි පැන්ෂන් එකක් ද නැත.**

**රජයෙන් ලැබෙන වැඩිහිටි දීමනාව රු. 5000 මුදල ඔහුට ලැබේ. ජීවත් වන්නේ දරුවන්ගෙනි. කිසිදු ආදායමක් නැත.**

**ඒත් මෙවන් පුද්ගලයකුට රජයට බදු ගෙවන්න කියා දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් බදු කොළ එවා ඇත. දින 14ක් ඇතුළත බදු නොගෙව්වොත් නීතියෙන් ක්‍රියා කරන බව දන්වා ඇත. රජයෙන් ආධාරයක් ගන්න අවු. 92ක් වෙච්ච පුද්ගලයෙක් කොහොමද රජයට බදු ගෙවන්නෙ. මෙහෙම බැලුවහම මළවුන්ටත් බදු කොළ යවා ඇති දැයි සැකයි. මේ ගැන සොයා බලන්න.**

**ප්‍රියානී**
**බණ්ඩාරගම**

## මේ ගැන දෙපාරක් සිතන්න

වර්තමානයේදී නවීන තාක්ෂණය නිසා ළමයින්ට ඇති වන නරක බලපෑම් කිව නොහැකි තරම්ය. මේ වන විට කුඩා දරුවන්ට පවා ‘ස්මාර්ට්’ ජංගම දුරකථනයක් තිබේ.

එහි ඇති හොඳ දේ සහ නරක දෙය තෝරා බේරා ගැනීමට ඔවුන්ගේ මනස දියුණු නැත. ළමයින් තුළ කුතුහලය පිරී පවතියි.

ඒ නිසා එපා යැයි පවසන දේ ඔවුන් අත්හදා බැලීමටත් සොයා බැලීමටත් කැමැතිය. මේ නිසා අන්තර්ජාලය ඔස්සේ දරුවන් අපයෝජනයට යොමු කර ගැනීම ඉතා පහසු කටයුත්තක් වී තිබේ.

දැයේ දරුවන් සියලු ආකාරයේ අපයෝජනවලින් ආරක්ෂා කර ගැනීමට ළමා ආරක්ෂක අධිකාරිය විසින් කටයුතු කරමින් පවතී. මෙවන් අවධියක ඔබේ හය හතර නොතේරෙන දරුවා අතට ස්මාර්ට් ජංගම දුරකථනයක් අත තැබීමට පෙර දෙපාරක් කල්පනා කළ යුතු අතර මන්ද යත් අන්තර්ජාලය ඔස්සේ දරුවන් ලිංගික හා මානසික අපයෝජනයට ලක් කිරීමට උත්සාහ ගනී.

මෙය වර්තමානයේ ඉතා ප්‍රබල ලෙස යොදා ගැනීම මහත් ඛේදවාචකයක් වී තිබේ.

**අසේල සමන්ත ධර්මවර්ධන**
**නීලගම - කහවත්ත**

## වාද්දූව - දෙහිවල වෙරළ තීරය Clean කරමු

දිනපතා මම දුම්රියෙන් වාද්දුව සිට දෙහිවල දක්වා රැකියාවට ගමන් කරන පුද්ගලයෙක්මි. දුම්රියේ යන විට වෙරළ තීරය දෙස බලන කල අනේ අපොයි කියා හිතෙනවා. ඒ අපේ රටේ මිනිසුන්ගේ හැසිරීම ගැන. වාද්දුවේ සිට අඟුලාන ස්ටේෂන් එක හරියට එනකම් වෙරළ තීරය දිගටම පොලිතීන් ගොඩවල්ය. ඒ වගේම ලී මෝල්වලින් ඉවත් කරන ලී කුඩු, දැව, පොතු කපලා ඉවත් කරන දැව සුන් ගොඩ ගසා ඇත.

වාද්දුව සංචාරකයන් නිතර ගැවසෙන සංචාරක පුරවරයකට අයත් වන වෙරළ තීරය මෙසේ අපවිත්‍ර කර තිබීම මොන තරම් අශෝභන දසුනක් ද. අපේ අගමැතිතුමිය ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන්වලට නිතර සහභාගි වන බව අප TV වැඩසටහන්වලින් දැක ඇත්තෙමු. කරුණාකර අගමැතිතුමියගේ අවධානය මේ ගැන යොමු කර වෙරළ තීරය ක්ලීන් කිරීමට පියවර ගන්නා ලෙස යෝජනා කරමි.

කළ යුතු කාර්ය වන්නේ වෙරළ තීරයේ භූගත ජලය ප්‍රයෝජනයක් ගන්නේ නැති නිසා බැකෝ යන්ත්‍ර යොදා ගෙන වැල්ලේ වළවල් හාරා වළ දමන එකයි. වෙරළ තීරය සුද්ද කරනවා කියා ප්‍රචාරය කළොත් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන අය බොහෝ ඇත. ඒ නිසා මෙයට දිනයක් නියම කර පුළුල් ප්‍රචාරයක් දී වැඩේ පටන් ගතහොත් අපේ ලස්සන වෙරළ තීරය ක්ලීන් කර ගත හැක.

තවද වෙරළේ ඇති කඩොලාන (වැටකේ පඳුරු) සමහරු ගිනි තබා විනාශ කර ඇත. මේ කඩොලාන ආරක්ෂා කර ගැනීමට මිනිසුන් දැනුවත් කළ යුතුය. එයට වෙරළ ආරක්ෂක බළකායක් පිහිටුවා ඒ මගින් කඩොලාන හා වෙරළ තීරය ක්ලීන් කර ගැනීමට මේ රජයේ නිලධාරීන්ගේ අවධානය යොමු වේවා.

**ජයසේකර**
**වාද්දුව**

## කුඩාවට පෙනෙන කුඩා තේ වතු හිමියන් ගැන

අද අප රටේ තේ කර්මාන්තය දිනෙන් දිනම පහත වැටෙමින් පවතින බව අප හට දැනෙන්නේ අර්ධ රාජ්‍ය වතුවලට වන කලදසාව දකින විටයි.

එය එසේ වෙද්දී අක්කර 2-3 ඇති කුඩා තේ වතු හිමියන් ගැන ද කනගාටුදායක තත්ත්වයක් උදා වී ඇති බව නොකියාම බැරිය.

එදා තේ දලු නෙළන්නියක් වෙනුවන් ගෙවූ දෛනික වේතනය රු. 800/= වුවත් අද වන විට රු. 1200/= තරම් ඉහළ දැමීමට සිදු වී ඇත. එමෙන්ම අනිකුත් වතු කම්කරු වැටුප රු. 2000/= දක්වා ඉහළ යෑම සමග මෙම ක්ෂේත්‍රයේ වියදම් ඉහළ යමින් පැවතුනත් අප හට අමු දලු කිලෝවක් සඳහා ගෙවන මිල රු. 150/= තරම් පහත වැටී තිබීම නිසා මෙය රැක ගන්නට අසීරු කරුණක් වී ඇත.

මීට අමතරව පොහොර හා බෙහෙත් මිල ඉහළ යෑමත් සමගම පොහොර යෙදීම අවම කරන්නට සිදු වී ඇත. මේ නිසා දලු අස්වැන්නද පහත වැටෙමින් පවතී. මේ ගැන අවධානය යොමු කර වැවිලි අමාත්‍යතුමනි මෙම කුඩා තේ වතු හිමියන් හට සාධාරණ වූ මිලකට පොහොර ලබා දීමට කටයුතු කර දෙන මෙන් මෙසේ ඉල්ලා සිටිමු.

**ජේ.පී. වික්‍රමසිංහ**




# ඉන්දියාවේ තරුණයෙක් අපට දුන් දායාදය

## රාගම රෝහලේ අක්මා සැත්කම් ඒකකය

**මීට වසර හය හතකට පමණ ඉහතදී අක්මාවේ සැත්කමක් සඳහා යා යුතුව තිබුණේ අසල්වැසි ඉන්දියාවටය. නැත්නම් අතේ මිල මුදල් යහමින් තිබුණානම් සිංගප්පූරුවට හෝ වෙනත් රටකට ගොස් එවැනි සැත්කමක් කර ගැනීමේ හැකියාව තිබිණි. එසේ හැකියාවක් නොතිබූ බොහෝ දෙනකුට සිදු වූයේ දුක් විඳ මෙරටදීම අවාසනාවන්ත ලෙස මරණයට පත් වීමටය. විශේෂයෙන්ම අක්මා රෝගවලට ගොදුරු වූ කුඩා දරුවන් විශාල පිරිසක් මෙනිසාම මරණයට පත්ව ඇත.**

නමුත් මීට දශක හතකට පමණ ඉහතදී ඉන්දියාවේ සිට තම මිත්තණියගේ අතේ එල්ලී මෙරටට ආ එම්.එච්. ඕමාර් නමැති නව හැවිරිදි දරුවා නිසා ශ්‍රී ලාංකිකයන්ට මුහුණදීමට සිදුවූ ඒ අවාසනාවන්ත ඉරණම වැළැකී ගොස් තිබේ. පිටරටකට නොගොස් එක් රුපියලක් හෝ වියදම් නොකොට ලංකාවේදීම අක්මා සැත්කමක් කර ගැනීමේ අවස්ථාවක් අද මේ ඕමාර් නමැති දරුවා නිසා උදාවී තිබේ.

එදා මේ කුඩා දරුවා ලංකාවට ආවේ තම පියාගේ ව්‍යාපාරික කටයුතු දැක ගැනීමටය. ඒ ගමනේ අවසානය වූයේ තම පියාගේ රෙදිපිළි ව්‍යාපාරය අතට ගත් තරුණ ඕමාර්ගේ මෙහෙයවීමෙන් දැවැන්ත රෙදිපිළි සහ ඇඟලුම් ව්‍යාපාර ජාලයක් ශ්‍රී ලංකාව තුළ බිහිවීමය.

ඉන්දියාවේ සිට පැමිණි මේ තරුණ ව්‍යාපාරිකයා ජාති ආගම් භේදයකින් තොරව මෙරට විශාල පිරිසකට රැකියා උත්පාදනය කළා පමණක් නොව තමන් අවංකව ඉපැයූ ධනය රටේ විවිධ කටයුතු සඳහා නොමසුරුව ප්‍රදානය කිරීමට තරම් කාරුණික පරිත්‍යාගශීලියකුද විය.

ඕමාර් නමැති මේ ධනවත් ව්‍යාපාරිකයා විසින් සිදු කරන ලද විවිධ පරිත්‍යාග හමුවේ උතුම්ම පරිත්‍යාගය ලෙස සැලකෙන්නේ රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහලට අනුබද්ධව ඉදි කර තිබෙන මහල් පහකින් සමන්විත ශ්‍රී ලංකාවේ ප්‍රධානම ළමා අක්මා බද්ධ මධ්‍යස්ථානයයි.

රජයකට කිරීමට අපහසු වූ සුවිසල් කාර්යයකට තමන් මහන්සියෙන් හරිහම්බ කළ පෞද්ගලික ධනයෙන් රුපියල් බිලියන දෙක හමාරක් තරම් වූ අති විශාල මුදල් සම්භාරයක් වැයකොට අංග සම්පූර්ණව ගොඩ නගන ලද "එම්.එච්. ඕමාර් අක්මා බද්ධ මධ්‍යස්ථානය'' ජනතා අයිතියට පැවරුණේ පසුගිය වසරේ මාර්තු මාසයේදීය. ඒ උතුම් පුණ්‍යකර්මය සියතින්ම රටට දායාද කළ මේ අපූරු දානපතියා ඉන් මාස කීපයකට පසුව ජීවිතයෙන් සමුගෙන තිබුණේ සුවහසක් වූ මෙරට අක්මා රෝගීන්ගේ සිත්සතන් තුළ ඔහු පිළිබඳව ගෞරවනීය වූ අමරණීය මතකයක් ඉතිරි කරමින්ය.

උතුරු කොළඹ ශික්ෂණ රෝහලට අනුබද්ධ මෙම අක්මා බද්ධ මධ්‍යස්ථානය තුළදී වැඩිහිටියන්ගේ මෙන්ම කුඩා දරුවන්ගේද අක්මා බද්ධ සැත්කම් සිදු කළද එය වඩාත් ප්‍රකට ශ්‍රී ලංකාවේ එකම ළමා අක්මා බද්ධ මධ්‍යස්ථානය ලෙසය. එසේම මේ ප්‍රතිකාර මධ්‍යස්ථානය නිහඬව තම සේවය සපයන ආයතනයකි. රටේ වැඩි පිරිසක් ඒ පිළිබඳව නොදනිති.

මීට වසර පහකට හයකට පමණ ඉහතදී ශ්‍රී ලංකාව තුළ රජයේ හෝ පෞද්ගලික අංශයේ රෝහලකින් අක්මා බද්ධයක් සිදු කර ගැනීම රෝගියකුට සිහිනයක් පමණක් විය. ඊට බලපෑ ප්‍රධානම හේතුව වූයේ අක්මා බද්ධයක් වැනි අතිශය සූක්ෂ්ම සැත්කමක් සඳහා දක්ෂ පළපුරුදු විශේෂඥ වෛද්‍යවරුන් අප රටේ සිටිය ද ඒ සඳහා ප්‍රමාණවත් ශල්‍යාගාර පහසුකම් රට තුළ නොතිබීමය. මේ නිසා එවැනි පහසුකම් සහිත අසල්වැසි ඉන්දියාවට හෝ වෙනත් රටකට ගොස් අක්මා බද්ධ සැත්කමක් කරගත හැකි වූවද ඒ සඳහා අවම වශයෙන් රුපියල් කෝටි දෙකකට ආසන්න මුදලක් මීට වසර පහ හයකට පමණ ඉහතදී වැය කළ යුතුව තිබිණි.

අපේ රටේ අසූව දශකයේ තරුණ පරපුර අතර අතිශයින්ම ජනප්‍රියව සිටි එක්තරා තරුණ ගායකයකුගේ අක්මා බද්ධයක් විශාල මුදලක් වැයකර මීට වසර කීපයකට ඉහතදී ඉන්දියාවේදී සිදු කළ අයුරුද ප්‍රසිද්ධ කරුණකි.

එදා එසේ රුපියල් කෝටි ගාණක් වැය කරමින් කිරීමට සිදුවූ එවැනි සැත්කමක් අද රුපියලක හෝ වියදමක් නොමැතිව අපේ රටේදීම කර ගැනීමේ පහසුකම් රාගම අක්මා බද්ධ මධ්‍යස්ථානය තුළින් රජය සපයා දීම සුවිශේෂී කරුණකි. ඕමාර් නම්වූ දානපති ව්‍යාපාරිකයාට පින්සිදු වන්නට මරණය යදිමින් සිටි අපේ රටේ අක්මා රෝගීන්ට නැවත ජීවිතය ලැබීමේ වාසනාව උදාකරදී ඇත.

අක්මා බද්ධ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ළමා අක්මා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය මෙරන්ති ප්‍රනාන්දු මහත්මිය විස්තර කළේ මෙසේය.

''මේ මධ්‍යස්ථානය ඉදිකරන්න කලින් අපි රාගම ශික්ෂණ රෝහලේ පවත්වාගෙන ගිය අක්මා බද්ධ ප්‍රතිකාර ඒකකයේ කටයුතු කරගෙන ගියා. අක්මා ආශ්‍රිත රෝග සම්බන්ධයෙන් රාගම ශික්ෂණ රෝහල ඒ වනවිටත් ලංකාව පුරාම ප්‍රසිද්ධියට පත්ව තිබුණා. විශේෂයෙන්ම සිරෝසිස් රෝගී තත්ත්වය හා සම්බන්ධ අක්මා රෝගවලට වගේම පිත්තාශයේ ගල් ඉවත් කිරීම සඳහා එහිදී ප්‍රතිකාර ලබා දුන්නා. ඒ වගේම වැඩිහිටියන්ගේ අක්මා බද්ධ කිරීම්වලටත් ප්‍රසිද්ධව තිබුණා.

මේ අතර කාලයේදී රට පුරාම රෝහල්වලින් අක්මා ආශ්‍රිත රෝගීන් අප වෙත එවන්න පටන් ගත්තා. නමුත් අපට එවැනි රෝගීන් විශාල පිරිසකට ප්‍රතිකාර ලබා දීම සඳහා රාගම ශික්ෂණ රෝහලේ පවත්වාගෙන ගිය ප්‍රතිකාර ඒකකය මදි වුණා. මේ නිසා අපට අවශ්‍ය වුණා මේ ඒකකය පැමිණෙන රෝගීන්ට සරිලන ආකාරයට වැඩිදියුණු කරන්න. මේ අතර කාලයේදී 2022 වසරේදී කුඩා දරුවන්ගේ අක්මා බද්ධ කිරීමේ ප්‍රතිකාර කටයුතුත් ආරම්භ කළා. ඊට පෙර මුදල් හොයාගෙන පිටරටට ගිහින් තමයි කුඩා දරුවන්ගේ සැත්කම් කළේ. මේ වන විට කුඩා දරුවන්ගේ අක්මා බද්ධ කිරීමේ සැත්කම් ලංකාවෙන්ම කරන්නේ මේ මධ්‍යස්ථානයේ පමණයි. මේ ස්ථානයට අමතරව කොළඹ ජාතික රෝහලේ සහ පේරාදෙණිය ශික්ෂණ රෝහලේ වැඩිහිටි අක්මා බද්ධ කිරීමේ සැත්කම් මේ වනවිට පවත්වාගෙන යනවා."


අක්මා සායනයක අවස්ථාවක්



එම්.එච්. ඕමාර් අක්මා බද්ධ මධ්‍යස්ථානය

කුඩා දරුවන්ට අක්මාව ආශ්‍රිත රෝග වැලඳෙන්නේ කුමක් නිසාදැයි අපි ඇයගෙන් විමසුවෙමු.

''වැඩිහිටියන්ට මත්පැන් පානය නැත්නම් අක්මාවේ කොලෙස්ටරෝල් තැන්පත් වීම කියන හේතුන් මත අක්මා රෝග හැදෙන්න පුළුවන්. ඊට අමතරව ජානගත රෝගත් බලපාන්න පුළුවන්. පුංචි දරුවන්ට අක්මා බද්ධ කිරීමට සිදුවන්නේ වැඩිපුරම පිත්ත නාලවල සිදුවන අකර්මණ්‍යතාවක් නිසායි. මේ රෝග ලක්ෂණ එළියට එන්නේ දරුවා ඉපදිලා මාස දෙක තුනක් යන විටයි. ඇස් කහ පැහැවීම සහ මල අවපැහැ වීම තමයි මේ රෝගී තත්ත්වයේ ආරම්භක ලක්ෂණ. මුත්‍රාත් තද කහ පැහැයෙන් යුක්ත වෙනවා. මේ රෝග ලක්ෂණ හඳුනා ගෙන ප්‍රතිකාර ලබා දෙන්න බැරි වීම නිසා සාමාන්‍ය රෝහල්වලදී කුඩා දරුවන් මරණයට පත් වීම සිදු වෙනවා. නමුත් මේ නව ඒකකය ආරම්භ කළාට පසුව එවැනි රෝගී දරුවන් 150ක පමණ පිරිසක් දිවයින පුරා පිහිටි රෝහල්වලින් අපි වෙත යොමු කරලා තිබෙනවා" යැයි ඇය සඳහන් කළාය.

''ආරම්භයේදී මේ ප්‍රතිකාර ඒකකයේ තිබුණ ඉඩ මදිකම නිසා එක රෝගියකු සැත්කමකට ලක් කරලා ටික දිනකින් සුවපත් වෙලා යනකල් තව රෝගියකු ඇතුළත් කර ගැනීම ප්‍රමාද වුණා. මේ නිසා ඒ අතර කාලයේදී රෝගීන් මරණයට පත් වීම සිදු වෙනවා. මේ තත්ත්වය අනුව අපේ කාර්ය මණ්ඩලයට තේරුම් ගියා තිබෙන ඒකකය ප්‍රතිකාර සඳහා ප්‍රමාණවත් නැති බව.

මේ අතර කාලයේදී තමයි අපට ඕමාර් මහතා ඇතුළු ඔහුගේ පවුලේ සාමාජිකයන් හමුවෙන්නේ. ඒ වන විටත් මේ ඒකකය වැඩිදියුණු කරලා හදන්න රජයෙන් පටන් අරන් තිබුණා. ඒ විදිහට හදන අක්මා බද්ධ මධ්‍යස්ථානයට අවශ්‍ය සියලුම වෛද්‍ය උපකරණ ලබා දෙන්න ඕමාර් මහතා ඇතුළු ඔහුගේ පවුලේ සාමාජිකයන් පොරොන්දු වී සිටියා. නමුත් මේ කාලයේ රටට ඇති වුණු ආර්ථික අර්බුදයත් එක්ක මේ ඒකකය හදන එක අතරමඟ නවතා දමන්න සිදු වුණා. ඒ බව දැනගත්ත ඕමාර් මහතා උපකරණ ලබා දෙනවාට අමතරව මේ ප්‍රතිකාර මධ්‍යස්ථානය අංගසම්පූර්ණව ඉදි කරලා දෙන්න කැමැත්ත පළ කළා. ඒ අනුව තමයි අංග සම්පූර්ණ 'එම්.එච්. ඕමාර් අක්මා බද්ධ මධ්‍යස්ථානය' අපේ රටට ලැබුණේ. කිසිම පැකිළීමක් නැතිව එතුමා අති විශාල මුදලක් මේ සඳහා වැය කර තිබෙනවා."

උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලයට මායිම්ව වෛද්‍ය විද්‍යාලයටම අයත් පර්චස් 20ක කුඩා බිම්කඩක වුවද ඉතා ක්‍රමානුකූලව ඉදිකර තිබෙන මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානය මහල් පහකින් සමන්විතය. එහි ඉහළම මහල අංග සම්පූර්ණ පහසුකම්වලින් සමන්විත ශ්‍රවණාගාරයකි.



සිව්වැනි මහල ශල්‍යාගාර දෙකක් සඳහා වෙන් කර ඇත. ඒ රෝගියාට සහ ඔහුට අක්මා කොටසක් ලබා දෙන පුද්ගලයාගේ සැත්කම් කටයුතු සඳහාය. තෙවැනි මහල දැඩිසත්කාර ඒකකයකින් යුක්ත වන අතර දෙවැනි මහල රෝගී ප්‍රතිකාර වාට්ටු සඳහා වෙන්කර ඇත. බිම් මහල රෝගීන් පරීක්ෂාවට සහ සායනික සේවාවන් සඳහාත්, කාර්යාල පහසුකම් සඳහාත් වෙන්කර ඇත. මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානය තුළ පවතින තවත් විශේෂත්වයක් වන්නේ පෞද්ගලික රෝහලක පවතින පිරිසුදු තත්ත්වයකින් පවත්වාගෙන යාමට කාර්ය මණ්ඩලය කටයුතු කිරීමය.

ගෙවී ගිය වසර පහක කාලය තුළදී මෙම ස්ථානයේදී කුඩා දරුවන් 35 දෙනකුට සාර්ථක අක්මා බද්ධ කිරීමේ සැත්කම් සිදුකර තිබේ. මේ වසරේ ගතවූ කාලය තුළ එවැනි සාර්ථක ළමා සැත්කම් 12ක් සහ වැඩිහිටි සැත්කම් 8ක් සිදුකර ඇත. මීට අමතරව අක්මාවේ තිබෙන පිළිකා සෛල පුලුස්සා දැමීමේ සැත්කම්ද මෙහි සාර්ථකව සිදු කෙරෙමින් පවතී.

අක්මා බද්ධයක් යනු අතිශය සංකීර්ණ සැත්කමකි. නිරෝගී පුද්ගලයකුගෙන් ලබා ගන්නා අක්මාවක කොටසක් රෝගියකුට බද්ධ කිරීම පැය 15ක් 16ක් වැනි දීර්ඝ වේලාවක් ගතවන අතිශය වෙහෙසකර ක්‍රියාවලියකි. අක්මාවක් බද්ධ කිරීමේදී ඒ සඳහා අවශ්‍ය සැත්කම් නූල් වර්ගයක් සඳහාම රුපියල් ලක්ෂයකට අධික මුදලක් වැයවන බව පැවසේ. ඒ අනුව බැලූ විට මෙවැනි සංකීර්ණ සැත්කමක් සඳහා වෛද්‍ය කාර්ය මණ්ඩලයක් දරන වෙහෙස වගේම ඒ සඳහා මෙරට නිදහස් සෞඛ්‍ය සේවාව යටතේ රජය කොපමණ මුදලක් වැය කරනවාදැයි සිතිය හැකිය.

''මේ සැත්කම් කිරීමේදී අපේ කාර්ය මණ්ඩලයත් සුවිශේෂී කැපකිරීමක් කරනවා. එයත් අගය කළ යුතුමයි. මොකද සමහර වෙලාවට එක සැත්කමක් සඳහා පැය 15ක් 16ක් පමණ ගත වෙනවා. ඉතින් ඒ වෙලාවට තමන්ගේ සුපුරුදු රාජකාරි වෙලාවෙන් එහා ගිය කැපකිරීමක් අපේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරනවා. ඒ වගේම ඒ කරනු ලබන සෑම සැත්කමක්ම ඔවුන්ටත් විශේෂ දැනුමක් ලබා දීමකුත් සිදු වෙනවා."

උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ වැඩබලන අධ්‍යක්ෂ ප්‍රියන්ත තෙන්නකෝන් මහතා යටතේ පාලනය වන 'එම්.එච්. ඕමාර් අක්මා බද්ධ මධ්‍යස්ථානයේ' ප්‍රධානියා ලෙස මෙරට ප්‍රකට අක්මා බද්ධ කිරීමේ විශේෂඥ වෛද්‍යවරයකු වන මහාචාර්ය රොහාන් සිරිවර්ධන මහතා කටයුතු කරයි. අක්මා බද්ධ සැත්කම් සඳහා ශල්‍ය, කායික, නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරුන් 10කගෙන් සමන්විත පුහුණු වෛද්‍ය මඬුල්ලකින්ද යුක්තය. මීට අමතරව උතුරු කොළඹ වෛද්‍ය පීඨයේ සහ රාගම ශික්ෂණ රෝහලේ සේවය කරන විශේෂඥ වෛද්‍යවරුන්ද මෙහි කෙරෙන සැත්කම් සඳහා සහභාගි වෙති. මීට අමතරව විස්සකින් පමණ සමන්විත පළපුරුදු හෙද කාර්ය මණ්ඩලයකින් සහ සාමාන්‍ය ලිපිකරු කාර්ය මණ්ඩලයකින්ද මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානය ක්‍රියාත්මක කෙරේ.

''ලංකාවේ කුමන හෝ රෝහලකින් අප වෙත යොමු කරන රෝගීන් පළමුව ලියාපදිංචි කරලා ඊළඟට නියමිත ක්‍රමවේදයකට අනුව ඔවුන් පරීක්ෂා කරලා අවශ්‍ය සැත්කම් සඳහා යොමු කරනවා. දැනටමත් මේ සඳහා විශාල පිරිසක් මෙහි ලියාපදිංචි වෙලා සිටිනවා. ඔවුන් ලියාපදිංචි වෙන පිළිවෙළට අනුව ප්‍රතිකාර සඳහා අපි ප්‍රමුඛතාවය ලබා දෙනවා." රෝගීන් ඇතුළත් කර ගන්නා ක්‍රමවේදය පිළිබඳවද විශේෂඥ වෛද්‍ය ප්‍රනාන්දු මහත්මිය පැහැදිලි කළාය.

මෙම අක්මා බද්ධ කිරීමේ මධ්‍යස්ථානය රාගම වෛද්‍ය පීඨ සිසුන්ටද සලසන්නේ අනගි සේවාවකි. ඒ අනුව මෙය අක්මා බද්ධ රෝහලක් පමණක් නොව වෛද්‍ය පුහුණු මධ්‍යස්ථානයක් සේම ඉදිරි අනාගතයේ වෛද්‍ය විද්‍යාවේ දියුණුවට අවශ්‍ය පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙසද සැලකිය හැකිය. පුහුණු වන වෛද්‍ය සිසුන්ට මෙන්ම පශ්චාත් වෛද්‍ය උපාධිය සඳහා අවශ්‍ය පුහුණුවද මෙම ස්ථානයෙන් ලබා දෙන අතර විදේශීය රටවල වෛද්‍ය සිසුන් ඇතුළු අක්මා බද්ධ කිරීමේ සැත්කම් සඳහා සම්බන්ධ විවිධ අංශවල ශිල්පීන්ද මෙහි පැමිණ අධ්‍යයන කටයුතු සිදු කිරීමද විශේෂත්වයකි.

දානපති එම්.එච්. ඕමාර් මහතා විසින් ශ්‍රී ලංකාවට ලබා දුන් මේ අක්මා බද්ධ මධ්‍යස්ථානය සෞඛ්‍ය සේවාව සඳහා මේ තරමටම අංශ රැසකින් සුවිශේෂී සේවාවන් සලසාවි යැයි ඔහු එදා කිසිවිටෙකත් නොසිතන්නට ඇත.


අක්මා සැත්කමකට ලක්වූ සිඟිති දරුවෙක්

පුෂ්පකුමාර ජයරත්න - කුරුණෑගල

# කවි දෝත

Hope with a Rhyme

සංස්කරණය - සඳුනි තිලකරත්න

නො. 42, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත,
කොළඹ - 08.
monarakavidotha@gmail.com
WhatsApp - 076 309 309 5

## තුන් බිය

වියරුව ඇවිත්
සුළි කුණාටුව 'දිට්වා'
වැටුණා අනෝරා වැසි
දරාගත නොහැකි විය
ගංගා ඇල දොලවලට
දෙගොඩ තලා යමින්
යටකළා මිනිසුන්ගෙ නිවහන්
නොකර අනුකම්පාවක්
දරාගත නොහැකිව
කඳු ශිකර රූටා ඇවිත් පහළට
මිහිදන් විය
මිනිසුන් පණ පිටින්
සිහිකරවමින්
විශාලා නුවර තුන් බිය

**පී. එල්. ජයවර්ධන, කඹුරුපිටිය**

## බෝනික්කා

නාය ගිය කළල් දියෙන්
හමුවිය
ඇයගෙ බෝනික්කා

**සමන් සුරවීර ආරච්චි, රඹුක්කන**

## දෙපයින්ම නැගිටින්න

කුසට හරි අහර නැති
ඉණට හරි වතක් නැති
හෙට දවස ගැන සිතූ
දයාබර මිනිසුනේ
රටට නිසි වැඩක් කොට
ඉන් යමක් එකතු කොට
හෙටක් ගැන සිහින දුටු
දයාබර මිනිසුනේ
ජීවිතේ කාලයක් ගොඩනැගූ සියලු දෑ
මොහොතකින් අහිමි වී
සිහින බොඳ වී ගලන
දයාබර මිනිසුනේ
වැටුණු තැන්වල නොසිට
යළිත් ඔබ නැගිටින්න
රටවටා සුවහසක් මිනිස්කම මතුවෙමින්
මහා පවුරක් ලෙසට
ඔබට සවියක් වේවි
දෙපයින්ම නැගිටින්න
දයාබර මිනිසුනේ...

**-සෝමදාස කන්දෙගේ, මාතර**

## පසුගිය සතියේ කවි පැනය

**මහ වැසි සුළං ඔය පැත්තට කරපු හෙනේ**
**විමසමි ඉතින් එක එක මට කියනු මැනේ**

### පිළිතුරු කවි

නාය ගියා සුන්දර ලෙස තිබුණු කඳු
මොහොතින් බිමට වැටුණා මහ ගෙවල් හැදු
නෑසියො මිතුරො නැතිවිය එයි කඳුළු බිඳු
මෙවැනි විපත් නොමවේවා යළිත් සිදු

**සුජිත් අජන්ත ජයසූරිය, මඩවල උල්පත**

වහ ගෙන දැයම මහ වැසි නල කරපු විණේ
ගහ කොළ ගෙවල් දොර මහ මගවලද පෙනේ
ඉහ උඩ වැටී ගත් මේ ගිනි නිවන මෙනේ
සහ නය දෙන්න ජාතිය පෙළ ගැසෙනවනේ

**කේ.පී. දුලාරි මධුභාෂිණී දිසානායක, හිරිඹුර-ගාල්ල**

'දිට්වා' නමින් සුළියක් ඇවිදින් අපට
වැස්සක් වැස්සා මුළු රටටම වින වෙන්ට
කෝටි ගණන් දේපල සුනු විසුනු කොට
මිනිසුන් දහස් ගණනක් අවතැන් වෙන්ට

**වෙත්මි, මාතර**

ගංගා දෙකක් උතුරනවා දෙපැත්තේ
වරුසාවත් අනේ ලැබෙනව මේ පැත්තේ
වපුරපු කුඹුරු වරුසාවම බිළිගත්තේ
ඕකයි කිව්ඳි ඔබහට කීමට ඇත්තේ

**ආරියවංශ කිතලගම**


සුළඟයි වැස්සයි නායයි මාරක චණ්ඩයි
ගම් බිම් වනසයි ගස් ගල් නිවාස පෙරලයි
පවුල් පිටින් ජීවිත මහපොළවේ වලලයි
භේද නැතිව හැමටම අප වෙන්නෙමු පිහිටයි

**එම්.එල්. විජේවර්ධන, මතුගම**

## මේ සතියේ කවි පැනය

ලස්සන හීන මල් හිත අස්සට කැන්දා
ඉන්නට හේතු ඔබ ළඟ එක එක ඇන්දා
යන්නට හේතු දහසක් එකවර කැන්දා
ඇයි දැයි කියන් මගෙ හිත රැවටුවෙ අන්දා

'කවි දෝත' සමග නිබඳ අත්වැල් බැඳ සිටි, දැනට රෝගාතුරව සිටින ගාල්ල උඩුගම කවියාට ඉක්මන් සුවය ලැබේවායි මොනරා 'කවි දෝත' අපි පතමු!



## වැහි කඳුළු

පාන්දරට හමන සුළඟ සමගින් මන බැන්දූ
නාන්නාඳුනන වැස්සට ලියැවුණි කවි සින්දූ
දාස් ගණන් හිත් අස්සට දුක් කඳුළැලි කැන්දූ
වාන් දමන තරමට ඇයි රුදු වුණෙ වැහි බින්දූ

තතු නොමදැන යන එනකොට නිම් නැති භව සසර
නතු විය යුතුමය ලොව දම වෙතනම් මගෙ මිතුර
ගතු කීවට අහස් ගැබට ගැන රුදුවුණු වතුර
සිතූ දෙය පමණක් නොව සිදුවන්නේ මේ කතර

බිම් කඩකට පෙර දවසක වී තිබුණත් සතුරු
එකම අහසකදි මිතුරන් වුණානෙ පස මිතුරු
මනුස්සකම පිරි කුටියක වී දොරගුළු යතුරු
ගුණදම් වපුරමු මිහිපිට එච්චරයිනෙ ඉතුරු

**-හෂාන් සම්පත්, සමනලවත්ත**

## නැගිටිමු

ඇසේ පස් කඳු යටින් තවමත්
පුතේ! කියනා බිඳුණු හඬවල්
සීතලට ගල්වෙලා නිහඬයි
වැසී සැඟවුණු බිලිඳු හදවත්

හිස අත බදා වැළපෙයි
කඳුළු බිඳුවක හැඩය තවමත්
වැටුණු මුත් නොවැටුණු හදින්
තව වරක් නැගිටින්න පුළුවන්

**-ෂර්මිලා බංදුනී දංවත්ත**

## අතීතය ඔබ ඉන්ද්‍රඛීලය

අහස ගුගුරයි සුළි කුණාටුව
අකුණුසර හඬ පමණි සවනට
අහිමි වී ඇත සතු සියල්ලම
නොසෙල්වෙයි ඔබ ඉන්ද්‍ර ඛීලය

මහා වැසි වැස දෙරණ ගිලගෙන
හඬා වට මාපියන් හැම තැන
වඩා දිරි සිත් ලෙයින් පණ ගෙන
දරාගෙන යමු නව හිරු උදෑසන

**-සුමුදු හේවාවසම්**

## දිව ඔසුව

සිතින් බෝසත් මිනිස්සුන්ගේ
හදවතේ තෙතමනෙන් පැළවෙන
'මිනිස්කම' නම් යෝධ ගහ යට
වැටෙන සෙවණැලි යටට වෙන්නට
අපට හැකිනම්...
ශුෂ්ක නොපනත්
අකටයුතුකම්, අසම්මතකම්
නමැති හිරුගෙන්
තැලී පොඩි වී ඉරිතැලී ගොස්
ගිනි අරන් ඇති ගතට මනසට
ලැබෙන සිහිලස
දිව්‍ය ඔසුවක්ම වෙනු ඇත

**-නිමල් විජේසේකර, සූරියවැව නගරය**

## විදෙස් කවිය

අනේ... මගේම ආදරණීය මිනිසුනේ,
අතීත කනගාටු සහ අනාගත බිය පිස දමන
අද මදු විතෙන් ජීවිත වීදුරුව පුරවා ගනු.
කුමට සිහින දකිනවා ද හෙටක් ගැන? උදාවූවායින් පසු
එහි ඇත්තේ ද අතීතය තුළින් බිහි වූ මේ මම ම ය.

Omar Khayyam විසින් රචිත The Rubaiyat නම් පද්‍ය සංග්‍රහයේ එන කවියක ඉංග්‍රීසි පරිවර්තනයේ සිංහල පරිවර්තනයයි.

**සුමිත් ධනංජය**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (ඉංග්‍රීසි)**
**ත්‍රිකුණාමල මණ්ඩපය**
**නැගෙනහිර විශ්වවිද්‍යාලය**

## සුළඟත් විපතක පැටලිලා ද ?

කන්ද නග්න -දුක දරාන
මුරුගසන් වැස්ස -ඉවසාගෙන
කඩතොලු වූ සියලු තැන්හි
ගල් පර්වත හිරකරගෙන

නොතකා ජන දුක - විලාප
විදුලි අකුණු කැරලි ගසයි
ගහ වැල අත් පා හකුළා
වැහි සීතල පොරවාගෙන

වැහි කිතියෙන් - මුසපත්වී
නිම්න කිහිලි - දඟකවමින
අසුබ හැඟුම් ගවසාගෙන
දිය ඇලි සළු මුදාගෙන

නෙත කඳුළින් බර කරගෙන
තේ දලු අහසට - හිනැහෙන
පහත් තැනින් පැන පැන යති
දිය වැල් සර්පයන් වෙසින

මවකගෙ තනපුඩු වගෙයි - අහස
කූඩැල්ලන් - තරුකැට මෙන
නරි රැල හාහුවක් නැත
දරුවන් බිය වේ සිතාන

සියොත් ගීත නොඇසේ අද
උන් කොයි අත සැඟවෙලා ද
සුළඟ බෝසැරෙන්.. හඬන්නෙ...
සුළඟත් විපතක පැටලිලා ද..?

**කීර්ති එස්. කුමාර**

## නරයෙකුට මිනිසකු වීමට...

විප තට පත් අයෙකු විපතින් මුද වන්න
කැප වීමෙකින් මතුවී එනැ හද තැන්න
උප කාරයෙක් කළ හැකි නම් සතු ටින්න
එප වත් පමණි නරයෙකු මිනිසෙකු වෙන්න

**කැප්පිටියාගොඩ කල්‍යාණවංස හිමි**

## ඇස් දෙකෙනුත් ගංවතුර ගලයි

මහ වැහි සමග මරු ඇවිදින් ගම තුළට
නෑසිය මිතුරු කැල දැම්මා පස් යටට
කොච්චර හෙව්ව මුත් දුටුවේ නැහැ ඇහැට
තාමත් කඳුළු මතුවෙයි ඇතිවුණ දුකට

ලස්සන කඳුවලින් වටවුණ ගම්පියස
අද නෑ හොයාගන්නට තිබු තැන නිවස
නැති වුණ නමුත් මොහොතින් නියදම විලස
සිහිවෙයි ඔබව හැමදා උදයේ හවස

දහසක් පැතුම් මොහොතින් පස් යටට වුණා
ඇවිලෙයි පපුව ඇයි වැදුණේ මෙහෙම හෙණා
කිව්වේ නැතත් කිසිවකුටත් මතක බණා
නිවනින් නිවේවා! මියගිය සියලු දෙන

**-සුජිත් අජන්ත ජයසූරිය, මඩවල උල්පත**

## රණවිරු පුතුනි ඔබටයි මේ...

ලක්දිව සිව් දෙසින් ආ මේ ගංවතුර
වළකන්නට සමත් කිසිවකු නෑ ඉපිද
දියබිඳු එකතු වී සිදුකළ මහ විපත
කෙතරම් බිහිසුණුද අයියෝ බිහිසුණුද

රණවිරු පුතුන් ආවේ සුළඟක් වාගෙයි
දිය ගොඩ සැමතැනම තිබුණේ ඒ බලයයි
හැම කෙනකුගෙම අදිටන රට රැක ගැනුමයි
උපහාරය අපේ ඒ රණවිරු කැලටයි

යන්නට නොහැකි සැමතැනකම දුව පැන්න
යුතුකම අකුරටම ඉටුකරමින් ඉන්න
රණවිරු පුතුනි ඔබ සැමහට පින් දෙන්න
අපි කළ පින් මදියි එය සිහියට ගන්න

කළ සේවයට පින් දෙන්නම් හැමවාරේ
ඉපදෙන හැම භවයකදි මේ සංසාරේ
මේ කළ පිනම ඇති යන්නට නිවන් පුරේ
රණවිරු පුතුනි ඔබටයි මේ උපහාරේ!

**-ඉන්ද්‍රානි සූරියආරච්චි, රාගම**

## මිනිස් දම් වැඩූ සතියක්

ආපදාව රට බිලිගත් දා රිසි සේ
මොනරා කවි දෝත යුතුකම ඉටුකළ සේ
කවි කිවිඳියෝ තොරතුරු විමසුව රහසේ
තව තව සෙනෙහෙ දම් වැඩි වූවා මෙලෙසේ

ශනි ඉරු සදු තෙදින මොනරා මිලදී ගන්න
නොලැබුණු සිතට කම්පාවක් නොදැනෙන්න
ජන ආපදාවට සරණක් ලැබ දෙන්න
ගත වූ සතිය කැපවුනි අතහිත දෙන්න

ගමේ පන්සලේ සත්කාරයක් කරා
දහම් පාසලේ ගුරු සිසු වෙහෙස දරා
හතර පේරුවේ වාහන ගමන් කරා
වියළි ආහාර රෙදිපිළි එකතු කරා

මෙවන් විපත් යළි දෑසින් නොදකින්න
වඩවමු දැහැමි පින්සිත් පුරවා ගන්න
දාන ශීලයෙන් හදවත් පිනවන්න
එතැනදි විපත් නොමවෙයි සිහියට ගන්න

**ඩබ්. විජේදාස**
**මාදොළුවාව**

## තවම නොලියූ කවිය

හිතේ තෙරපෙන හැඟුම් කලතා
ලිහාගෙන හදවතේ රස තැන්
මෙතෙක් නොලියූ පද රටාවක්
ලියන්නට මට හිතෙනවා...
හදේ දොරගුළු වසා ගත්ත ද
හිත පුරා නුඹ මැවෙනවා ...

ඉඳහිටක නුඹ ඇවිත් හෙමිහිට
රිදෙන තැන් ප්‍රේමයෙන් පිරිමැද
ගළපන්න බැරි පද අරුත් ළඟ
ස්වරය වෙන්නට අහනවා...
දන්නව ද නුඹ නුඹට රහසින්
තුන් හිතම ඉකිබිඳිනවා...

ඇරඹුමක් මිස නිමාවක් නැති
කතාවක් පිටු පුරා පද බැඳි
මිහිරි ස්වරයෙන් ගයන්නට බෑ
හදවතේ තත් බිඳෙනවා...
ඉතින් තවමත් නොලී කවියට
පද අරුත් මම සොයනවා...

**නිලූකා පතිරණ**
**ඇඹිලිපිටිය**

# පන්සිල් රැකීමේ මහා ආනිශංසය



**භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ කසීරට බරණැස් නුවර ඉසිපතනාරාමයේ වැඩ වසන සමයේ මහා සංඝරත්නය නිතිපතා නගරයේ පිඬුසිඟා හැසිරෙන්නාහ. දිනක් එක්තරා බ්‍රාහ්මණයකුගේ නිවස ඉදිරියෙන් තරුණ ස්වාමීන් වහන්සේ පිඬුසිඟා වඩින විට ඒ බ්‍රාහ්මණයාගේ කේසකාරී නමැති දියණිය ඇගේ මවගේ හිසේ උකුණන් බලමින් සිටියාය. මේ තරුණ ස්වාමීන්වහන්සේ දෙස වුවමනාවෙන් බලා සිටි මේ කේසකාරී කුමරිය තම මවගෙන් මෙසේ ප්‍රශ්න කළාය. "මෑණියනී මේ භික්ෂුන්වහන්සේ නව යොවුන් වයසේ පසුවන්නෝය. ලස්සන රූපශ්‍රීයෙන් යුත් සුකුමාල ශරීර වර්ණ ඇත්තෝය. මේ ලෝකයේ මහණවීමට නම් පරිහානි හතරක් තිබිය යුතුය. මා සිතන්නේ ඒ එක පරිහානියක්වත් මේ පැවිදි අය කෙරෙහි නෑ. එහෙනම් මේ අය කුමක් දැක කුමක් පිණිස මහණ වුණාද?"**

දියණියගේ එම පැනයට මව මෙසේ පිළිතුරු දුන්නීය. ''දියණියනි, මේ ලෝකයේ මහා සම්මත රජුගේ පටන් එක දිගට පැවතගෙන ආ ශාක්‍යකුලතිලක සුද්ධෝදන මහා රාජෝත්මයාණන්ගේ පුත්‍ර වූ උදාරතර මහා සම්පත් ඇති සත් දවසකින් ලබන්නට තිබූ සක්විති රාජ්‍ය හැරදමා මහේශාක්‍ය රාජ කුලයෙන් නික්ම පැවිදිව සර්වධර්මයන් සර්වකාරයෙන් දත්තාවූ ගෞතම නම් බුදු කෙනෙක් මේ ලෝකයෙහි පහළ විය. ඒ සියල්ල දත් බුදුරජාණන්වහන්සේ බුද්ධ ශ්‍රාවකයන්ගේ චර්යාව යැයි කියන ලද බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කෙරෙමින් ජනයන් කෙරෙහි පතළ කරුණාවෙන් ධර්ම දේශනා කරන සේක. ඒ ශාක්‍යකුලතිලක වූ බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනාව අසා මහත් රාජශ්‍රී සම්පත් පවා අතහැර බොහෝ දෙනා පැවිදිවන්නේය.''

මව දියණිය අතර මේ කතාබහ කෙරෙන අතරවාරයේ සෝවාන් මාර්ගඵලලාභී එක්තරා උපාසක අයෙක් මේ නිවස ඉදිරියෙන් ගමන් කරන්නේ දෙදෙනාගේ කතාබහ ඇසී එහි නතර වූවේය. එවිට ඒ කුමාරිකාව මේ උපාසක තැනගෙන් මවගෙන් ඇසූ පැනය යළි විමසන්නට වූවාය. ''උපාසකතුමනි, ඥාති ව්‍යසනාදී කිසිදු පරිහානියක් නැතිව, ඉඩකඩම් ගව මහිසාදී ධන ධාන්‍යාදි මහත් වූ උපභෝග පරිභෝග සම්පත් හැරදමා බොහෝ කුල පුත්‍රයෝ ශාක්‍ය පුත්‍රවූ බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි පැවිදිවෙති. ඊට හේතු මොනවාද? කුමන අර්ථයක් පිණිස, කුමන වැඩක් දැක, කුමන ප්‍රයෝජනයක් පිණිස පැවිදි වේද?''

එවිට ඒ උපාසක තෙමේ පඤ්චකාමයෙහි ආදීනව සහ නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිශංසද ඇයට කියා දුන්නේය.


''කුමරිය, පඤ්චකාම සම්පත්තිය කියන්නේ බොහෝකල් නොපවතින අතට ගත් දියත්තක් වගෙයි. සිහිනෙන් අනුභව කළ භෝජනයක් වගෙයි. ශෝකය, දුක, දෝමනස්සය, උපායාසය යනාදී මහත් ඝෝර සංසාර දුකට හේතුවන හෙයින් මහත් ගිනි අඟුරු වළක් වගෙයි. දරුණු විෂඝෝර සර්පයෙක් වගෙයි. පපුවේ ඇණුන උලක් වගෙයි. එනිසා පඤ්චකාම සම්පත් හැර ගිහි ගෙයින් නික්ම පැවිදිවීම නම් සසර දුකින් මිදීමට කාරණා වන හෙයින් සිරගෙයින් නිදහස් වුණා වැනිය. අති භයානක වූ අක් මුල් නැති සසර දුකින් මිදීමට කාරණා වන හෙයින් උවදුරු සහිත සිංහ, ව්‍යාඝ්‍රාදි නපුරු සතුන් සිටිනා වනාන්තරයකින් පිටවී නිරුපද්‍රිත තැනකට පැමිණි කෙනෙක් වගෙයි'' යනාදි පඤ්චකාම සම්පත් අතහැර පැවිදිවීමේ ආනිශංස ප්‍රකාශකොට විස්තර කළේය. ''තවද මේ ත්‍රිවිධ රත්නය හිරුට වඩා තේජෝ බලයෙන් යුක්තය. සඳුට වඩා සෞම්‍ය ගුණයෙන් යුක්තය. ආකාශය මෙන් අනන්ත ගුණයෙන් යුක්තය. මහ මුහුද සේ ගැඹුරු ගුණයෙන් යුක්තය. මේ ත්‍රිවිධ රත්නය කෙරෙහි ප්‍රසන්න වූ තිරිසන් සතුන්ට පවා ස්වර්ග සම්පත් අත්වන්නේය.'' මේ ආදී වශයෙන් ත්‍රිවිධ රත්නයේ ගුණද පඤ්චශීල රක්ෂා කිරීමෙන් අත්වන මහත් ආනිශංසද කියා දුන්නේය. ඒ සියලු විස්තර ඇසීමෙන් පසු පන්සිල් සමාදන් වූ ඒ කුමරිය ''ආචාරින්වහන්ස, මින් ඉදිරියට මා කුමක් කළ යුතුද'''යි උපාසකතුමාගෙන් විමසීය. ඇය නුවණ ඇති බව තේරුම්ගත් උපාසක තෙමේ ඇයට කයේ නියම ස්වභාවය දක්වමින් කායගතා සතියත්, අනිත්‍යතා දර්ශනයත් පහදා දුන්නේය. අනතුරුව ඇය ඒ උපාසකතුමා කියාදුන් පරිදි සියල්ල සිතේ ධාරණය කරගෙන විදර්ශනා වඩා නොබෝ කලකින් සෝවාන් ඵලයෙහි පිහිටියාය. අවසානයේ ආයු කෙළවර කාලක්‍රියා කළ ඇය එම කුසලානුභාවයෙන් තව්තිසා භවනෙහි සක්දෙවිඳුන්ට පරිචාරිකාව උපන්නීය. ඇයට පරිවාර ස්ත්‍රීහු ලක්ෂයක් පමණ වූහ. ආශ්චර්යවත්වූ රූපශ්‍රීයෙන් දිළිහි දිළිහි සිටි මේ දෙවඟන දැක ඉමහත් සතුටට පත් සක්දෙවිඳු තෙමේ ඇගෙන් මෙලෙස විස්තර විමසීය. ''මාගේ මේ ශක්‍රපුරයෙහි මාගේ කර්ම විපාකයෙන් පහළවූ ලක්ෂයක් පමණ වූ දිව්‍යාංගනාවන් මධ්‍යයේ රූපශ්‍රීයෙන් හා ශරීරාලෝකයෙන් දසදෙස ඒකාලෝක කරමින් සිටින ඔබ කොහේ සිට ඇවිත් මාගේ මේ දිව්‍යභවනෙහි උපන්නේද? කවර කුසලයක් කොට මෙබඳු සම්පත්තියක් ලැබුවේද?''

එවිට ඒ දිව්‍යාංගනාව මෙසේ විස්තර කළාය. ''ශක්‍රදේවයන්වහන්ස, මිනිස්ලොව කසීරට බරණැස් නමැති නුවරක් ඇත්තේය. මම ඒ නුවර කේසකාරී නම් බමුණු කුමාරිකාවක්ව සිටියෙමි. එවිට බුද්ධ රත්නය, ධර්මරත්නය, සංඝරත්නය යන ත්‍රිවිධරත්නය කෙරෙහි පැහැදුන සිත් ඇතිව

**මම ඒ නුවර කේසකාරී නම් බමුණු කුමාරිකාවක්ව සිටියෙමි. එවිට බුද්ධ රත්නය, ධර්මරත්නය, සංඝරත්නය යන ත්‍රිවිධරත්නය කෙරෙහි පැහැදුන සිත් ඇතිව නොකඩවා පන්සිල් ආරක්ෂා කළෙමි. ත්‍රිවිධ සංයෝජනයෙන් දුරුව සෝවාන්ඵලයෙහි පිහිටා නිවන්මඟට පැමිණ නිරෝගිවීමි. සුවපත්වීමි.**

නොකඩවා පන්සිල් ආරක්ෂා කළෙමි. ත්‍රිවිධ සංයෝජනයෙන් දුරුව සෝවාන්ඵලයෙහි පිහිටා නිවන්මඟට පැමිණ නිරෝගිවීමි. සුවපත්වීමි.'' එවිට සක්දෙව් රජතුමා ඇය පසසමින් මෙසේ කීවේය. ''බුද්ධරත්නය, ධම්මරත්නය, සංඝරත්නය යන මේ ත්‍රිවිධ රත්නය කෙරෙහි පහන් සිත් ඇතිව අචල ශ්‍රද්ධාවෙන් යුක්තව සෝවාන් ඵලයට පැමිණි භද්‍රාවනි, ඔබ මේ දිව්‍ය භවනට පැමිණීම ඉතා යහපත් දෙයකි.'' අනතුරුව මුගලන් මහතෙරුන්වහන්සේ දේව චාරිකාවේ වැඩම කළ අවස්ථාවක සක්දෙවිඳු මේ දෙවඟන පිළිබඳ සියලු ප්‍රවෘත්තිය උන්වහන්සේට දන්වීය. මහතෙරුන්වහන්සේ ඒ සියල්ල බුදුරජාණන්වහන්සේට සැලකර සිටියහ.

විමානවස්තු ප්‍රකාශනය ඇසුරිනි
ආරියනන්ද දොඹගහවත්ත



# "හේතු දෙකක් - නම් තුනක් - එකම ගමක්"

## සිරිපා වන්දනාවේ පිවිසුම් ද්වාරය නල්ලතන්නිය

ශ්‍රී ලංකාවේ රට මැද කඳුකරයේ පවතින භූ විෂමතාව විස්මයජනකය. නැංගුරමක හැඩයෙන් යුතුව, ඒ තුළ ව්‍යාප්තව ඇති ප්‍රධාන කඳුවැටි අතර, නැංගුරම් පාදයේ නිරිත දෙසින් විහිදී පවතින්නේ සමනල කඳුවැටියයි. මෙරට ජීවයේ හදවත ලෙසින් අවිවාදයෙන්ම හඳුන්වාදිය හැකි සමනල කඳුවැටිය ප්‍රමුඛ සමනල අඩවිය, ස්වාභාවික ජල මූලාශ්‍ර බොහෝමයක තිඹිරිගෙය වන්නා සේම ජීවී විශේෂ රැසක නිවහන ද වෙයි.



එකී සමනල අඩවියේ අඩි 7359ක උසකින් යුක්තව ප්‍රතාපවත්ව නැගී සිටිනා, උතුම් සම්බුදු සිරිපා පහස ලත් සමනල ගිරි හිස ලක්දිව පූජනීයම ගිරි ශිඛරය ලෙසින්ද හඳුන්වා දිය හැකිය.

පසුගිය දිනෙක සීතල උඳුවප් මහේ පුර පසළොස්වක සඳ උදා වූයේ මෙවර සිරිපා වන්දනා වාරයේ ඇරඹුම සනිටුහන් කරමිනි. එළැඹෙන වෙසක් පුන් පොහෝ දින තෙක් සිරිපා වාරය තුළ ලක්ෂ සංඛ්‍යාත වන්දනාකරුවන් පිරිසක් සිරිපා කරුණා කරනු ඇත.

මුනි සිරිපා වන්දනාව සඳහා ප්‍රධාන මාර්ග ත්‍රිත්වයක් පැවතියද, සමනල ගිර උඩමළුව කරා ප්‍රවිෂ්ට වීමට ඇත්තේ මාර්ග දෙකකි. ඉන් පළමු වැන්න ''රත්නපුර පාර" ලෙසින් හැඳින්වෙන සමනල කන්දේ බටහිර බෑවුම ඔස්සේ විහිදෙන මාර්ගයයි. සමනල අඩවියට නෑකම් කියන සබරගමුවේ, රත්නපුර - පලාබද්දල සිට ආරම්භ වී උඩමළුව කරා විහිදෙන මෙම මාර්ගය ඉතා දිගු ඉතිහාසයක් සහිත පැරණිතම සිරිපා වන්දනා මාර්ගයද වෙයි. එකල රාජ රාජ මහාමාත්‍යාදීන් පවා සිරිපා වන්දනා කළ, ප්‍රවාද, ඉතිහාස කතා, මං සලකුණු රැසකින් සමන්විත රත්නපුර-පලාබද්දල මාර්ගය, ''සිරිපා රජ මාවත" නමින් ප්‍රකටව පැවතිණි.

උඩමළුව කරා ප්‍රවේශවීමට ඇති අනෙක් මාර්ගය වන්නේ ''හැටන් පාර" නමින් ප්‍රචලිත මාර්ගයයි. සමනල කන්දේ උතුරු හා නැගෙනහිර බෑවුම් ඔස්සේ ඉහළට විහිදෙන මේ ''හැටන් පාර" වර්තමානයේ සිරිපා වන්දනාවේ යෙදෙන බොහෝ දෙනා අතර සුප්‍රසිද්ධ හා වඩාත් ප්‍රචලිතම මාර්ගය බවට පත්ව ඇත්තේ හේතු ගණනාවක් මුල් කර ගනිමිනි. රත්නපුර-පලාබද්දල පාරට සාපේක්ෂව දුර අඩු වීම, පහසුකම් වැඩි වීම හා සිරිපා වන්දනාවේදී වෙහෙස අඩුවීම ඒ අතර ප්‍රධාන වේ.

හැටන් පාර ලෙසින් ව්‍යවහාරයේ පැවතියද මෙම සිරිපා වන්දනා මාර්ගය ඇරඹෙන්නේ නල්ලතන්නිය නගරයෙනි.

මධ්‍යම පළාතට අයත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි නල්ලතන්නිය නගරය, හැටන් සිට කිලෝමීටර් 33ක් දුරින් (B-149 මාර්ගය ඔස්සේ) හා මස්කෙළිය නගරයේ සිට කිලෝමීටර් 14ක් දුරින් පිහිටා ඇත. දිගු කලක් පුරා අඹගමුව කෝරළයට අයත්ව තිබූ නල්ලතන්නියේ හිමිකාරීත්වය, නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හිමි වන්නේ 2023 වසරේදී සිදුකළ නව පරිපාලන සීමා බෙදීම් සමඟිනි. සිරිපා වන්දනාවේ සුප්‍රසිද්ධ පිවිසුම් ද්වාරය වන නල්ලතන්නිය ප්‍රදේශය හැඳින්වීමට නම් ත්‍රිත්වයක් භාවිත වීම සුවිශේෂී වුවත් බෙහෙවින් අප්‍රකටය. සැඟවගිය රසවත් තොරතුරු මතින් දිගහැරෙන ඒ කථා පුවත අපූරුය.



නල්ලතන්නිය ප්‍රදේශය අතීතයේදී හඳුන්වා ඇත්තේ ''සීතගඟුලගම" නමිනි. සිරිපා අඩවියේ සුපිරිසුදු සිසිල් දිය උල්පත්වලින් උපත ලබා මාවුස්සාකැලේ ජලාශයටත්, එතැනින් මස්කෙළිය ඔයටත් ගලායන හැටන් පාරේ සීත ගඟුල, මේ නගරය මධ්‍යයේ වූ නිම්නය ඔස්සේ ගලායාම ඊට මූලිකම හේතුව ලෙසින් හැඳින්විය හැක. වර්තමානයේද එම නාමයට අදාළ බොහෝ සාක්ෂි නල්ලතන්නියෙන් හමුවේ. නල්ලතන්නිය අයත් ග්‍රාම නිලධාරි වසම, ''320-B සීතගඟුලගම" ලෙසින් හා නල්ලතන්නියේ පිහිටි උප තැපැල් කාර්යාලයේ සීතගඟුලගම ලෙසින් දක්වා තිබීම අතීත ග්‍රාම නාමයේ මතකයන් සිහිගන්වන ශේෂයන් අතර වේ.

බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී ලංකාවේ කඳුකර ප්‍රදේශ බොහෝමයක් තේ වගාව විසින් අතික්‍රමණය කරන ලද කාල වකවානුවක් විය. රටේ මැද එසේ තේ දල්ලෙන් වැසී යද්දී සීතගඟුලගම ප්‍රදේශයේ පැවති ඉහළ උන්නතාංශයත්, තේ වගාවට ඔබින උෂ්ණත්වය හා දේශගුණික තත්ත්ව සලකා බැලූ සුදු ජාතිකයන්, 1885දී පමණ මෙහි ඉහළ භූමි ප්‍රදේශයේ තේ වගාබිමක් ඇරඹූ අතර, එය නම් කරන ලද්දේ ''ඩෙල්හවුස්" (Delhouse) නමිනි. එහි ඉදිකරන ලද වතු බංගලාව ඩෙල්හවුස් බංගලාව ලෙසින් හඳුන්වනු ලැබිණි. මේ නිසා සීතගඟුලගම, නාමය යටපත්ව ඩෙල්හවුස්/ඩැල්හවුසී යන නම් ප්‍රදේශය හැඳින්වීමට ව්‍යවහාර විය. ශ්‍රී පාද පිවිසුම අසල සීත ගඟුල හරහා දිවෙන පාලම ''ඩැල්හවුසී පාලම" ලෙස හැඳින්වීමත්, හැටන් සිට මස්කෙළිය හරහා නල්ලතන්නිය තෙක් විහිදෙන B-149 මහාමාර්ගය ''හැටන්-මස්කෙළිය ඩැල්හවුසී මාර්ගය" ලෙසත් නාමකරණය කර තිබීම ඒ අතීතය සිහිපත් කරනා මතක සටහන්ය.

ඩැල්හවුසී ඇතුළු මේ ප්‍රදේශය වසා පැතිරුණු තේ වගාබිම්වල වැඩ කටයුතු සඳහා මෙහි පැමිණි බොහෝ දෙනා දකුණු ඉන්දීය දමිළ ජනතාව විය. ඔවුන් සිරිපා අඩවියෙන් ජීවය ලද පිරිසුදු සිසිල් ජලය තම දෛනික අවශ්‍යතා වෙනුවෙන් භාවිත කරන්නට ඇත. එම සුපිරිසුදු ජලය ඔවුන් විසින් දෙමළ බසින් හඳුන්වන්නට ඇත්තේ ''නල්ල (හොඳ/නැවුම්), තණ්ණීර් (වතුර)" යනුවෙනි. නල්ල තණ්ණීර් යන්න පසුකාලීනව බිඳී යමින් ''නල්ලතන්නි" ලෙසින් ව්‍යවහාරයට පැමිණි බවට අනුමාන කළ හැකි අතර, වර්තමානයේ නල්ලතන්නියේ, නල්ල තණ්ණීර් මූලාශ්‍ර සොයා ගැන්ම නම් උගහටය.

ශීඝ්‍ර නාගරීකරණයත් සිරිපා වන්දනාවේ පැමිණෙන්නන්ගේ අත්තනෝමතික ක්‍රියාකලාපයන් හා ඇතැම් විට වතුයායන්ගේ අපජලය මිශ්‍රවීමත් වැනි සාධක ඊට හේතූන් ලෙසින් හඳුනා ගත හැකිය.


තවත් සිරිපා වන්දනා වාරයක් ආරම්භව ඇති මේ කාල වකවානුවේදී හැටන් -නල්ලතන්නිය දෙස් විදෙස් වන්දනාකරුවන්ගෙන් පිරී ඉතිරී යනු ඇත. මෙහි වන ඩැල්හවුසී වතුයායේ පැවැත්ම කෙසේ වෙතත් සීතගඟුලගම, සීත ගඟුලෙන් නා, පේවෙන සියලුම දෙනා මේ අඩවියේ ''නල්ල තණ්ණීර්" (නැවුම් ජලය) මූලාශ්‍ර සුරැකීමට තරයේ සිහිතබා ගත යුතුමය.

**(අන්තර්ජාලය හා ප්‍රදේශවාසී තොරතුරු ඇසුරෙනි)**

තිලංග උදාර - අඹේපුස්ස

# පරම්පරා වෙනස කියන යුග පෙරළිය





## යමුනා මාලිනී පෙරේරා

**විවිධ කාලවකවානු තුළදී එක් එක් සමාජවල මතු වන නොයෙක් ආකාරයේ ගැටලු හා ප්‍රශ්නවලට මුහුණදීමට ඒ ඒ සමාජයන්හි ජීවත් වන්නන්ට සිදු වනු ඇත. කලකට පෙර මෙරට සමාජයේ ද තදින් බලපැවැත්වූ, එමෙන්ම වැඩිපුර කතාබහට ලක්වූ මාතෘකාවක් වූයේ පරම්පරා පරතරයයි. නැතහොත් පරම්පරා ගැටුමයි. විශේෂයෙන්ම සාම්ප්‍රදායික සමාජ රටාවකට අනුගත වෙමින් ජීවත් වූ මිනිස් සමාජයක් පරම්පරා කිහිපයක් ගෙවා ඉදිරියට යද්දී, පරම්පරා අතර අදහස් හා ක්‍රියාමාර්ග අතින් ද හැසිරීම් රටා හා අන්‍යොන්‍ය ප්‍රතිචාර මගින් ද පරස්පර විරෝධී බවක් ඇති වීම වැළැක්විය නොහැකිය. විශ්ව සමාජය පොදුවේ ගත් විටදී ද එලෙසටම පරම්පරා අතර විවිධ විෂමතා දැක ගත හැකිය.**

නිර්මාණ කාර්යයෙහි යෙදෙන ලේඛකයකු හෝ ලේඛිකාවක්, තම සාහිත්‍ය කෘති රචනයේදී විවිධ කර ගන්නා මාතෘකා විමසා බලන විට පරම්පරා අතර දක්නට ලැබෙන විෂමතාව පරම්පරා පරතරය, නැතහොත් පරම්පරා ගැටුම විශේෂත්වයක් පෙන්නුම් කරයි. සිංහල නවකතා ඉතිහාසයේ එවන් වස්තු විෂය අලළා රචිත නවකතා දක්නට ලැබුණා. මෑතකදී ප්‍රකාශයට පත්වී ඇති 'යුග පෙරළිය' නම් නවකතාව තවත් අලුත් මුහුණුවරකින් පරම්පරා අතර වෙනස්කම් පිළිබිඹු කරන්නකි.

විවිධාකාර රසවත් සාහිත්‍ය කෘති රැසක් ප්‍රකාශයට පත් කරමින් මේ වන විට සිංහල පාඨකයන් අතර ජනප්‍රියත්වයට පත් වී සිටින යමුනා මාලිනී පෙරේරා පසුගියදා සරසවි ප්‍රකාශනයක් ලෙසින් පාඨකයා අතට පත් කර ඇති, 'යුග පෙරළිය' නම් නවකතාව මෙතෙක් පරම්පරා පරතරය විෂය කර ගනිමින් ලියැවුණ අනෙක් නවකතාවලින් තරමක් වෙනස් වූ මගක යමින් රචනා කර ඇත. පිටු 152කට සීමා වන සේ රචනා කරන ලද මෙම කෘතිය පාඨකයාට වෙහෙසකර බවකින් තොරව ඉතා ආශාවෙන් කියවිය හැකි වන සේ නිර්මාණය කර ඇත.

''අපේ සීයා නම් දෙවියෙකි. සීයාගේ අතේ සල්ලිත් නැත. ඒත් සීයාගේ හිත කවදාත් පෝසත්ය....'' (යුග පෙරළිය, 32 පිට)

මෙම නවකතාවට විෂය කරගෙන ඇති කතාව තුළට පරම්පරා කිහිපයක සාමාජිකයෝ ඇතුළත් වෙති. ඒ අතර පවුල් තුළ හටගන්නා නානාප්‍රකාර ගැටුම්, අරගල, හැලහැප්පීම්වලට මැදි වෙමින් ඒ සියල්ල ඉවසා දරාගනිමින් ඉදිරියටම යන සීයාගේ චරිතය කැපීපෙනෙන සේ ඉස්මතු කරලන්නට කතුවරිය ගෙන ඇති උත්සාහය මල්පල දරා ඇත.

පරම්පරා තුනක සාමාජිකයන් එක නිවසක් තුළ කල් ගෙවීමේදී ඇති වන සහසම්බන්ධතා අතරට විටින් විට මතු වන ගැටුම්කාරී අවස්ථාවන් ද කතුවරිය මැනවින් නිරූපණය කර ඇත. රෙජිනෝල්ඩ් මැදවත්ත නම් වූ සීයාගේ චරිතය දෙස ඉතා හොඳින් නිරීක්ෂණය කර බලන මුනුබුරා වන සුනිල් මැදවත්ත මෙහි කථකයා ලෙස පෙනී සිටින අතර ඔහුගේ දෘෂ්ටි කෝණයෙන් මෙහි අන්තර්ගත සියලු චරිත විනිවිද දැකීමට පාඨකයාට අවස්ථාව සලසා දී ඇත.

සීයා විසින් ලියන ලද දින පොත ඉතා උද්‍යෝගයෙන් කියවන සුනිල්, එහි අන්තර්ගත සිදුවීම් හා වාර්තා ඇසුරෙන් පරම්පරා අතර ඇති වන ගැටුම්, හැල හැප්පීම් ආදිය ගැන සිතන ආකාරය විශ්වසනීයත්වයෙන් යුතුව පාඨකයා වෙතට ගෙන ඒමට කතුවරිය සමත් වී ඇත.

මෙහි අන්තර්ගත චරිත සමූහය මගින් වසර ගණනාවක් තුළ සමාජයේ සිදු වූ විවිධාකාර සංසිද්ධීන් හා එක් එක් චරිත ඒවාට මුහුණ දෙන ආකාරය ද පාඨක රුචිය දිනා ගනිමින්, විශ්වසනීයත්වය ද ඇති වන පරිද්දෙන් නිර්මාණය කර ඇති ආකාරය අගනේය.

එකට ජීවත් වන පරම්පරා කීපයක සාමාජික සාමාජිකාවන් අතර නිරන්තරයෙන් හටගන්නා මතභේද හැලහැප්පීම්, අවුල් වියවුල්, සිත්තැවුල් යනාදිය පාඨ, සිත් තුළට කා වැදී යන සේ ප්‍රාණවත් බස් වහරක් යොදා ගනිමින් ඉදිරිපත් කිරීමට ලේඛිකාව සමත් වී ඇත.

## පත් ඉරුව

පූර්ව පරම්පරාවන්හි පවුල් තුළ හටගත් විවිධ ගැටුම්, වත්මන් පරම්පරාවලට අයත් සාමාජිකයන් අතර ද ඒ අයුරින්ම හෝ ඊට තරමක් සමානව හෝ සිදු වන බව කතාව අවසානයේදී කතුවරිය ඉදිරිපත් කර ඇති ආකාරය වැදගත්ය.

''ගල් පරයෙන් මම ද නැගී සිටිමි. මගේ සිත හොඳටම සැහැල්ලුය. දැන් මා ගෙදර යා යුතුය. ජයන්ති බලාගෙන සිටිනවා ඇත. මා එනතුරු ඇය තේ පානය කරන්නේත් නැතිව බලා සිටිනවා ඇත. පිරිමි සිතක හයිය මට සැබෑවටම පෙන්වා දුන් ඇය නිසා නොවේද මගේ යුග පෙරළිය ලියවුණේ !''

(152 පිට)

ගිගුරුම් සහිත මහා ධාරානිපාත වැස්සක් අවසානයේදී අවට පරිසරය ද සන්සුන් වී, නිසංසල වන ආකාරය පාඨක සිත් තුළ දනවමින් කතාව අවසන් කර ඇත.

යුග තුනක් අතර මතු වෙමින් යට වෙමින්, නැගෙමින්, බසිමින්, ආ විවිධාකාර හැලහැප්පීම් සහිත යුග පෙරළිය මෙලෙසින් නිමා වන අතර, සාහිත්‍ය නිර්මාණකරුවකුගේ කාර්යය වන සමාජය පිළිබිඹු කිරීමේ කර්තව්‍යය ද මෙලෙසින් යමුනා මාලිනී පෙරේරා නම් ප්‍රවීණ ලේඛිකාව අතින් සාර්ථක ලෙස ඉටු වී ඇති බව කිව හැකිය.

පාඨකයාගේ රසවින්දනය උදෙසා ප්‍රකාශයට පත් කෙරෙන කෘතියක් නිමාව අතින් ද සාර්ථක විය යුතු බව අවබෝධ කර ගත් කතුවරිය 'යුග පෙරළිය' පිළිබඳ ඉඟියක් ද මතු වන සේ මෙම නවකතාවේ පිට කවරය ඉතා සිත් ගන්නාසුලු ආකාරයෙන් නිම කරවා තිබීම මෙහි තවත් විශේෂත්වයකි. පිට කවරයේ යොදා ඇති වර්ණවත් හා කලාත්මක සටහන් මෙන්ම සිත්ගන්නාසුලු වර්ණ සංයෝජනය ද මෙම කෘතිය වඩාත් ඉහළ තලයකට නංවාලීමට හේතු වී ඇති බව කිව හැකිය.

**මහාචාර්ය කුසුමා කරුණාරත්න**

## සාහිත්‍ය තීරුව

# ගුණදාස අමරසේකර මරණ මංචකයේ දුටු සිහිනය

ආචාර්ය ගුණදාස අමරසේකර මෙරට සුජීවත්ව සිටින අදීන ලේඛකයෙකි. ඔහු 1929 නොවැම්බර් මස 12 වැනිදා ගාල්ල බද්දේගමට සමීප යටලමත්ත ගමෙහි උපත ලැබුවේය. යටලමත්ත රජයේ පාසලේ මූලික අධ්‍යාපනය ලබා, පසුව ගාල්ලේ මහින්ද විද්‍යාලයේද, කොළඹ නාලන්දා විද්‍යාලයේ ද සාරසිප් ප්‍රගුණ කළේය. මේ පාසල් දෙකෙම බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ ප්‍රතිඵලයෝ වෙති. සිංහල බෞද්ධ මධ්‍යම පාන්තික දරුවෝ මෙහි උගත්හ. අමරසේකරගේ බෞද්ධ ජාතිකවාදී චින්තනය ගොඩනැගෙන්නට මේ පාසල් දෙකෙහිම අධ්‍යාපනය යම් තරමකට හේතු වන්නට ඇත. ඔහු පසු කලෙක උසස් පෙළ විභාගය සමත්ව දන්ත වෛද්‍ය විද්‍යාව ඉගෙනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූයේය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ඇසුරු කිරීමට ලැබෙන්නේ එහිදීය. ඒ කාලයේදී අමරසේකර සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය පිළිබඳ හදාරමින් උන්නේය. දන්ත ශල්‍ය වෛද්‍යවරයකු වූ අමරසේකර පශ්චාද් උපාධි අධ්‍යයනය සඳහා එංගලන්තයට ගියේය. ඒ අත්දැකීම් අමරසේකරගේ ඇතැම් කෙටිකතාවල පරිකල්පනයෙන් තොර අමුද්‍රව්‍ය මට්ටමෙන් ගොඩනංවා තිබේ. ඔහුගේ යම් පමණින් හෝ සාර්ථක කෙටිකතා එකක් දෙකක්වත් හමුවන්නේ මුල් කාලීන කෙටිකතා සංග්‍රහවලදී ය. හැත්තෑව දශකයේ මුල් කාලයේදී සමාජ දේශපාලන විචාර ලියන්නට පෙලඹුණු අමරසේකර බණ්ඩාරනායකගේ ප්‍රතිසංස්කරණවාදී දේශපාලන ක්‍රමය ද ප්‍රතික්ෂේප කරමින් උන්නේය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර රචනා කළ ධර්මිෂ්ට සමාජය කෘතිය ඉහළින්ම අගය කළ අමරසේකර ජේ.ආර්. ජයවර්ධනගේ ධනේශ්වර දේශපාලන ක්‍රමය ද ප්‍රතික්ෂේප කළේය. වාමවාදී දේශපාලනයට නතු වුව ද ඒ සඳහා පෙනී සිටි හැම පක්ෂයක්ම දුර්වල වූයෙන් අසූව දශකයේ මුල් කාලයේ සිටම රෝහණ විජේවීරගේ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ප්‍රතිපත්ති ප්‍රසිද්ධියේම අගය කිරීමට පෙලඹුණේය. ඔහු 1988 දී රචනා කළ 'ගනඳුර මැදියම දකිනෙමි අරුණලු' කෘතියේදී මෙසේ ලීවේය.

''මෙරට අනාගතය කවදා හෝ භාරගෙන සමාජවාදී සමාජයක් බවට පත් කරනු ලබන්නේ මේ රටේ ගම් නියම්ගම්වලින් පහළ වන උගත් ගැමි තරුණයන් විසිනි. ඔවුන් අතින් පමණි, අපට සරිලන සමාජවාදයක් බිහි වී මෙරට සමාජය සමාජවාදී සමාජයක් බවට පත්වනු ඇත්තේ. මා සිත ඒ අවධියෙහි පිළිසිඳ ගත් මේ සිතුවිල්ල එතෙක් මෙතෙක් මගේ මනස අත්නොහැර ඒ තුළ දැවටෙමින් ජීවත් වී ඇත. මෙව අවුරුදු විසිපහකට පසු යළි අර අනාවැකිය මාක්ස්වාදී අර්ථකථනයක් සහිතව ලියා පළ කළ යුතු යැයි මා ඉටා ගත්තේ ඔවුන් කෙරෙහි මසිත වූ අති භක්තිය හා විශ්වාසය පසුගිය අවුරුදු කීපය තුළ නොමඳව ලියලා වැඩුණු බැවිනි. ඉතිහාසය විසින් පාදා දෙනු ලබන තීරණාත්මක මොහොතක් වෙත මේ තරුණ පෙළ දැන් එළැඹ ඇතැයි මට සිතේ.''

එකල තිබූ වාමවාදී දේශපාලන පක්ෂ සියල්ලම ධනවාදය හමුවේ දිය වී යන බැව් වාසුදේව නානායක්කාර, ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න ප්‍රතිසංස්කරණවාදී දේශපාලනයට නතුවීමෙන් පෙනේ. මේ අවබෝධය මත පිහිටි අමරසේකර ජනතා විමුක්ති පෙරමුණ දේශපාලනයට සෘජුව සම්බන්ධ නොවුවද සෙසු වාමවාදී පක්ෂවලට වඩා ජනතා විමුක්ති පෙරමුණ බලවත් බැව් අවධාරණය කළේය.

''ඒ දේශපාලන පක්ෂය අපට ප්‍රියමනාප වුවද නොවුවද දේශපාලන නැඹුරුවකින් යුත් මෙරට තරුණයන්ගේ මන නුවන් බැඳගෙන ඇත්තේ ඒ පක්ෂයයි. සංඛ්‍යාත්මක වශයෙන් බලන කල මෙරට ඇති පැරැණි අලුත් සෑම මාක්ස්වාදී පක්ෂයකටම වඩා බලවත් පක්ෂය ද එය වෙයි. ජනතා විමුක්ති පෙරමුණට බැඳී ඇති තරුණයන් මෙන්ම ඉන් බැහැර සිටින තරුණ පෙළ ද සිය ආධ්‍යාත්මයට ඔබින මේ රටේ ජනතාවට ඔබින සමාජවාදයක් සොයා යන පිරිසක් ය යන්න මගේ විශ්වාසයයි. මාක්ස්වාදය දේවභාෂිතයක් ලෙස සලකා එයින් දෑස - මනස අඳ කරගෙන චින්තනයෙන් වියුක්තව ජීවත්වීමට තැත් කරන පිරිසක් නොවෙති ඔවුහු.''

එකල එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ මැර දේශපාලනයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ තරුණයෝ ආයුධ අතට ගත්හ. ඊට හේතු අමරසේකරයෝ නොදුටුහ. ආණ්ඩුව ඝාතනය, භීෂණය, දූෂණය යන තුන්බියම ඇති කරමින් නාඳුනන තුවක්කුකරුවෝ ගම්වලට එව්හ. ගෝනිබිල්ලෝ ගම්වල රැක සිටියහ. ගම් දනව්වල ද නගර මධ්‍යයේ ද මිනී කඳු ගොඩගැසූහ. මේ භීෂණ යුගයත් සමඟ අමරසේකර ජනතා විමුක්ති පෙරමුණ විෂයයෙහි තැබූ විශ්වාසය අතහැර දැමුවේය. ඊට පසුව ඔවුහු ජනතා විමුක්ති පෙරමුණ මිනීමරු සංවිධානයක් යැයි කීහ. දේශප්‍රේමී ජාතික ව්‍යාපාරයේ සභාපතිවරරයා වූ අමරසේකර එවකට කැලණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය නලින් ද සිල්වා සමඟ එක්ව 'ජාතික චින්තන ව්‍යාපාරය' ආරම්භ කළේය. එතැන් සිට ඔහු රචනා කළ කෙටිකතා, ජාතික චින්තන න්‍යාය ජනගත කරන අමු දේශපාලන ප්‍රවාද බවට පත් විය. එහෙත් 1988 දී රචනා කළ 'ගල් පිළිමය හා බොල් පිළිමය' කතාවෙහි බොල් පිළිමය පුපුරුවා හරින තරුණයා ජනතා විමුක්ති පෙරමුණ සාමාජිකයෙකි. ඔවුන්ගේ අරගලය සැබෑම විමුක්ති ව්‍යාපාරයක් ලෙස හඳුන්වාදීමට පෙලඹුණු අමරසේකර තමා මංමුළා වී ඇති බව 88.89 ජනතා විමුක්ති පෙරමුණු කැරැල්ලෙන් අවබෝධ කරගත්තේ ය. ගල් පිළිමය හා බොල් පිළිමය අසම්පූර්ණ යැයි වසර දාහතරකට පසු වටහා ගත් ඔහු 'පිළිම ලොවයි පියෙවි ලොවයි' රචනා කළේ දෘෂ්ටිමය මායාව නිවැරැදි කර ගන්නටය. ඒ සඳහා වසර දාහතරක් ගත වුවද ඒ පොත් දෙකම එකම ආඛ්‍යානයකි. පිළිම ලොවයි පියෙවි ලොවයි කතාව ආරම්භ වන්නේ පුපුරා ගිය බොල් පිළිමයේ කැට කැබිලිතිවලට යට වී සිටි ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරකයකු වූ විජේසුන්දරගේ මරණයෙනි.

ගුණදාස අමරසේකර 1998 දී 'මරණ මංචකයේ දුටු සිහිනය' කතා සංග්‍රහයෙහි අන්තර්ගත කතා මගින් ජනතා විමුක්ති පෙරමුණ මිනීමරු සංවිධානයක් ලෙස හඳුන්වා දීමට පෙලඹුණේය. පුතාගේ ශිෂ්‍යත්වය කෙටි කතාව ජාතික චින්ත දේශපාලනය ජනගත කිරීමටත්, ජනතා විමුක්ති පෙරමුණ විවේචනයට හසු කිරීමටත් රචනා කර ඇත. කොතෙක් අවලාද නැඟුවද රෝහණ විජේවීර එදා කී පරිදිම ''අපේ හඬ මරා දැමීමට නොහැකිය'' ජනතා විමුක්ති පෙරමුණ තරුණයෝ ෆීනික්ස් පක්ෂීන් මෙන් අළු මතින් අවදි වෙති. ටයර් සෑයවල් මත පිලිස්සුණු ඒ සහෝදරයන්ගේ සිහින සැබෑ වී ඇත. අමරසේකර මරණ මංචකයේ දුටු සිහින 'බොඳ වී' ඇත. 'ගනඳුරු මැදියම දකිනෙමි අරුණලු' කෘතියේදී දුටු ජනතා විමුක්ති පෙරමුණේ අනාගතය පිළිබඳ විශ්වාසය එල දරා ඇත. ධනේශ්වර දේශපාලන පක්ෂ සියල්ලම එකම පොකුරට තබා පරාජය කිරීමට ජනතා විමුක්ති පෙරමුණට හැකියාව ලැබී ඇත. දැන් අමරසේකරයන්ට මරණ මංචකයේ සිහින පසෙක තබා එක්ව ගොඩනැගෙන යහපත් රටක අනාගතය දෙඇසින්ම දකින්නට පුළුවන. එතැන ජාතිවාදී, ආගම්වාදී ගැටුම් නැත. ඉන්නේ අපි ටික පමණි. අප අතර උස් පහත් කියා භේදයක් නැත. රටේ සියලුම ජනතාව සමානයෝ වෙති.



**ආචාර්ය මහේෂ් ක්‍රිශාන්ත**

# අපේම මිනිසුන්ගේ ජීවිත රැකගන්න ස්වර්ණ ශ්‍රී සහන සත්කාර











ජාතික රුධිර මධ්‍යස්ථානය සමග ස්වර්ණවාහිනී මාධ්‍ය ජාලය එක්ව සංවිධානය කරන ලද 'අපේම මිනිසුන්ගේ ජීවිත රැකගන්න ස්වර්ණ ශ්‍රී සහන සත්කාර ලේ දන්දීමේ කඳවුර' ඉකුත් 2 වැනිදා දවස පුරා දෙමටගොඩ ඔරායන් සිටි ස්වර්ණවාහිනී ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්විණි.

නාරාහේන්පිට ජාතික රුධිර මධ්‍යස්ථානය, කොතලාවල ආරක්ෂක රෝහල, ජයවර්ධනපුර රෝහල, යුද හමුදා රෝහල සහ කළුබෝවිල මහ රෝහලෙහි ලේ බැංකු එක්ව මෙම රුධිර දන්දීමේ කඳවුර පවත්වන ලදී. ජාතික රුධිර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ වෛද්‍ය ලක්ෂ්මන් එදිරිසිංහ මහතා මෙම කඳවුර සම්බන්ධීකරණ කෙරිණි. දැවැන්ත කාර්ය මණ්ඩලයක පූර්ණ සහයෝගයෙන් මෙම කඳවුර සාර්ථකව පවත්වන ලදී.

එම ලේ දන්දීමේ කඳවුරේ සමාරම්භක අවස්ථාවට එක්වූ ස්වර්ණවාහිනී මාධ්‍ය ජාලයේ සමූහ ප්‍රධාන විධායක නිලධාරි නීතිඥ සුසාර දිනාල් මහතා, ''රටේ ජාතික ව්‍යසන තත්ත්වයක් යටතේ සිදු වූ විපත්වලට මුහුණ පෑ අපේම මිනිසුන්ගේ ජීවිත රැකගන්න ස්වර්ණ ශ්‍රී සහන සත්කාරක වැඩසටහන මේ වන විටත් සාර්ථකව සිදු කරනවා. ඊට සමගාමීව දහස් ගණනක් පිරිසකට සෞඛ්‍යාරක්ෂිතව පිසූ ආහාර පාර්සල් පිරිනැමීමද සිදුකරනවා. මෙම රුධිර පරිත්‍යාග කිරීමේ කඳවුරත් එලෙස විපතට පත්වූවන්ගේ ජීවිත රැකගන්න විශාල පිටිවහලක්'' වන බවද පැවැසීය.

එම රුධිර දන්දීමේ කඳවුරේ විවිධ අවස්ථා මෙලෙස කැමරා ඇසට ලක් විය.

**ඡායාරූප - නිමල් දයාරත්න**





ස්වර්ණවාහිනී මාධ්‍ය ජාලයේ සමූහ ප්‍රධාන විධායක නිලධාරී නීතිඥ සුසාර දිනාල් මහතා

# "...ඉදෙන්නට හැකිනම් බතක් වී... බතක් නොඉදෙන පැලක රහසින්.."

## තානායම්පල්ලාගේ සටහන

ගිලන්පස වීදුරුව නැවතිල්ලේ තොල ගාමින් හඬ අවදි කළ භික්ෂූන් වහන්සේ දෙස තානායම්පල්ලා බලා සිටියේ ගෞරව පූර්වක දෑසිනි. භික්ෂුව සමග පැමිණ සිටි දැලි රැවුලවත් හරි හැටි කලු නොගැසුනු කොලු ගැටයා යටහත් ලීලාවෙන් තානායම්පල්ලාගේ කාර්යාල කාමරයේ උළුවස්ස අසලට වී බිම බලා හුන්නේය.

".. කිව්වාම මොකද මැනේජර් මහත්තයා... මට නම් ගමේ පන්සලෙන් අම්පාරෙ පන්සලට උනාට පස්සේ අවුරුද්දට දෙගමනකට වඩා ගමට වඩින්නවත් වෙන්නේ නැහැ..

ඉතින් මේ තමයි මම අර කීව කොළුවා.. නම උපසේන.."

තමාගේ නම තරම් මිහිරි වදනක් මිහිපිට කිසිවෙකුට නැතැයි තානායම්පල්ලා කියවා තිබුණේ ඔහු කුඩා සන්දියේ කියවූ මොකක්දෝ පොතකිනි.

තමාගේ නම ඇසෙත්ම බිම බලා හුන් කොළුවා සෙමෙන් හිස ඔසවා තානායම්පල්ලා දෙස කෘතවේදී සිනාවක් පෑවේය.

".. පෙනුම ඒතරම් මෝරපු පාටක් නැති වුණාට උසස් පෙළ කලාවලින් විභාගෙ පාස් කරලයි ඉන්නේ.. ඉතින් රස්සාවක් නැතිව මහ පොළව එක්ක හැප්පෙන මේ වගේ ගැටවුන්ට පාඩුවේ දැතෙ රැකියාවක් කරගෙන ඉන්ට කුඩු වෙළෙන්දෝ ඉඩ දෙන්නේ නැහැ නෙව මැනේජර් මහත්තයා..

අන්න උන්ගෙන් බේර ගන්නයි මම තානායමේ කානු සුද්ද කරන්න හරි මේ කොලුවා ඔබතුමාට බාර දෙන්න මේ එක්ක ආවේ.."

තරුණවිය ඉක්මවමින් සිටි භික්ෂුව තානායම්පල්ලා අමතන්නේ හදවතේ ගැඹුරුම තැනින් බව උන් වහන්සේගේ හඬ සමග මුහුණෙන් පළවන ඉරියව් සමුදාය පුන පුනා සපථ කළේය.

".. මෙවුන්ගේ තාත්තා සාදිරිස් වගේම මේ කොලුවාත් කැත්තෙ උදැල්ලේ වැඩට හරි හපනා.. මේ කොලුවා පොඩිඑකා සන්දියෙදිම සාදිරිස් කොටින්ට අහුවෙලා ආගිය අතක් නෑ..

පඩිපෙළ වගේ පොඩි එවුන් රොත්තක ගෙන් වැඩිමලා තමයි මේ උපසේන..

..අපිත් ඉතින් පන්සලෙන් මේ වගේ අසරණ පවුලට පුළුවන් තරමින් උදව් පදව් කෙරුවා. ඒත් ඉතින් කවදා වෙනකම් කියලද මහත්තයා?.. අනික මිනිසුන්ට තිබිලා එපායැ පන්සලට තියෙන්න...."

භික්ෂුව වටාපත සුරතට ගෙන සිවුර සකසා තමා සමග පැමිණි උපසේන කොලුවා තානායම්පල්ලාට භාරදී ආපසු යෑමට අසුනෙන් නැගී සිටියහ.

"..හුඟක් දවසට මමයි පොඩි දෙනමයි අපේ දානෙ වේලත් අපිමයි පන්සලේ උයා පිහා ගන්නේ.. ඒ වැඩටත් අත්උදව්වට හිටියෙ මේ උපසේන කොලුවාම තමයි..

..ඉතින් ලබන දෙසැම්බර් මාසෙ විසිඅට ඒ කොළුවා ඉන්න ගෙදර වහල අලුතින් හදලා උළු තියන්නත් යොදාගෙන තියෙනවා මයෙ හිතේ.. ඒවාටත් ඉතින් නැහැයි බැහැයි කියන්න බැහැනේ මැනේජර් මහත්තයා.."

තානායම් කාර්යාල කුටියෙන් පිටවීමට පියවර එසැවූ හිමි නම වෙත දෙදන නමා නමස්කාර කළ තානායම්පල්ලා භික්ෂුව වඩිනා පෙරමග ඉඩදී එකත්පස්ව බලා සිටියේය.

"..සුවපත් වේවා.. එහෙනම් කොලුවා මහත්තයලට බාරයි.. කන්න ටිකක් දීලා වත්තෙ පිටියෙ වැඩ ටික ඕන විදියට කරගෙන මාසෙ අන්තිමට පුළුවන් නම් ඔය කීයක් හරි සුළු මුදලක් අතට දෙන්න.. ඒකත් අනිවාර්ය නෑ..

පරිසරෙයි වගකීමයි නුහුරු නිසා අඩුපාඩු එමට ඇති වේවි.. කරුණාවෙන් පෙන්වලා දෙන්න.."

තානායම්පල්ලා භික්ෂූන් වහන්සේගේ උපදේශ සියල්ලට හිස සැලුවේය. උපසේන හාපුරා කියා ඉදල අතට ගත්තේය.

ඒ හරියටම මීට මාස දෙකකට ඉහතදීය.

මිනිසෙකුට ඉදලක් අයිති වීමේත් ඉදලකට මිනිසෙකු අයිති වීමේත් සුවිසල් පරතරය පිළිබඳව හාංකවිසියක් නොදත් උපසේනගේ මුවග රැඳී තිබෙන්නේ ජයග්‍රාහී සිනාවකි.

කාලය දින සති මාස වලින් ගෙවී වර්තමානය වෙත ගලා ආවේය. මේ වන විට තානායමේ මුළුතැන් ගෙයිත්, වත්ත පිටියේත්, ඉලෙක්ට්‍රික් වැඩ සහ ප්ලම්බර් වැඩ කරනා මේන්ටේනන්ස් අංශයේත් කාට කාටත් නැතිවම බැරි බඩී චරිතය බවට පත් වී ඇත්තේ උපසේනය.

ඒ කවුරු කවුරුත් උපසේනට මුදලින් උපකාරයක් කළේ ඔහු තානායමේ කාඩරයට අයත් සේවකයකු නොවනා නිසාය.

තානායම්පල්ලා වහ වහා ඔහුව නගරයේ පිහිටි බැංකුවකට කැඳවාගෙන ගොස් බැංකු ගිණුමක් ආරම්භකොට එහි එම මුදල් තැන්පත් කිරීමට සැලැස්වූයේ තානායමේ කාර්ය මණ්ඩලයේ රහසිගත මත්පැන් සාදවලට උපසේනටද දායක වීමට සිදුවන බව දැනගත් පළමු අවස්ථාවේදීමය.

තානායම්පල්ලා උපසේනට උපදෙස් දී තිබෙන්නේ තමා අතේ රුපියල් පන්සියකට වඩා වැඩි මුදලක් කිසිවිටකත් අතේ තබා නොගන්නා ලෙසයි.

උපසේනද ඉතිරි කිරීමට උපන් රුසියෙකි. ඒ ඔහු උසුලනා දරිද්‍රතාවයේ මහගිරිදඹ ගැන හොඳ අවබෝධයක් ඔහු සතු නිසාය.

"..කාමර තියෙනවද?.."

තානායම් ගේට්ටුවෙන් පිටත නතර කළ විසාල ට්‍රක් රථයෙන් බැස ආ ව්‍යාපත් අමුත්තා පිළිගැනීමේ කවුන්ටරයට ළං විය.

පිළිගැනීමේ නිලධාරියා ටයි ගැටය සකසමින් නැගී සිටියේය.

".. සේරම අපි අටක් ඉන්නවා.. ඒත් අපි බිම හරි නිදාගෙන කාමර දෙකකින් මැනේජ් කර ගත හැකියි.. මොකද අපි මේ ගංවතුර වියළි සහනාධාර වගයක් බෙදන්න නැගෙනහිර පළාතට යන ගමන්.. අපි ආවෙ මාතර දිහාවේ ඉඳන්.."

ව්‍යාපත් මහත්මයා සාවධාන හඬින් කීවේය. පිළිගැනීමේ නිලධාරියා තානාම්පල්ලා හට වේටර්වරයෙකු හරහා පණිවිඩය පිටත් කළේය.

"..ඉතින් මැනේජර් මහත්තයා.. අපි මේ වියපැහැදම් කරන්නේ සම්මාදම් මුදල්. ඒ නිසයි මෙහෙම පිරිමහගන්න බලන්නේ..

මීට අඩුවට වෙනත් තැන් කීපයකම අපි කාමර බැලුවා.. ඒත් පරහකට තියෙන්නේ සම්මාදම් ආධාර බඩු පුරවපු අපේ මේ විසාල ට්‍රක් එක ආරක්ෂාකාරීව රාත්‍රියට ගාල් කර තබන්න ඒ තැන්වල පාකින් ඉඩ පහසුකම් නෑ.."

තානායම්පල්ලා සියල්ල ශ්‍රවණය කළේය.

".. හොඳයි.. ඔයාලා සම්මාදම් කරලා බෙදන සහනාධාරවලට අපිත් දායක වෙන්නම්.. ඒ කියන්නේ ඔබතුමා ඉල්ලන්නේ කාමර දෙකයිනේ.. අපි අපේ ගාණෙත් එක කාමරයක් නොමිලේ දෙන්නම්..

ඒ වගේම කෑමවලින් සියයට විසිපහක ඩිස්කවුන්ට් එකකුත් දෙන්නම් ස්වේච්ඡා වැඩකට යන නිසා.."

තානායම්පල්ලා සුහද ලෙසින් කියා සිටියේය. ව්‍යාපත් මහත්තමා පස්වනක් ප්‍රීතියෙන් පිනා ගියේය.

පසුදා උදෑසන තානායම් මිදුල අමදින උපසේන දුටු දැවැන්ත ට්‍රක් රථයේ රියදුරා අත්පාලසන් හඬක් නගා ඔහු ට්‍රක් රථය අසලට කැඳවා ගත්තේය.

".. අනේ මල්ලි මේ බැනර් එක වාහනේ ඉස්සරහ එල්ලගන්න පොඩි සපෝට් එකක් දෙන්න.."

උපසේන වහා ට්‍රක් රථය අසළට ළංවිය.

බැනරයේ අකුරු පෙළ දුටු උපසේන තුෂ්නිම්භූත වී ගියේය.

"..අඩේ.. අය්යලා ආධාර බෙදන්න යන්නේ මේ බැනර් එකේ තියෙන ගමටද?.. මේ අපේ ගමට අල්ලපු ගම.. හොඳ වෙලාවට අපේ ගමට ගංවතුර ආවේ නෑ.. අපේ ගමේ පන්සලේ නායක හාමුදුරුවො තමයි මාව මෙහේ රස්සාවට දැම්මේ.."

".. එතකොට මේ මල්ලි අම්පාරටත් එහාද?.."

".. ඔව් අය්යේ.."

සංවාදය ඇරඹිණි. කාස්ටක හේන් ගොවිතැන් ජීවිතයේ දුඃඛිත තිත්ත ඇත්ත ට්‍රක් රථ රියදුරු ඉදිරියේ කෙමෙන් පෙළ ගැසිණි.

".. ඉතින් මල්ලිත් යමු අපිත් එක්ක ගමට ආධාර බෙදන්න.."

ට්‍රක් රථ රියැදුරා උපසේනට කීවේ හදවතින්මය.

".. අපෝ බෑ.. මම ගිහිල්ලා බෑ.. හෙට අනිද්දා දෙකේම මෙහේ වෙඩින්.. හෙට එකසිය පණහක එකක්ලු.. අනිද්දා සීයක එකක්ලු.." උපසේන කීවේ වේදනාවෙනි.

".. ගමේ ගොහින් එන්න තිබුණා නම් මටත් ඒක ගොඩක් වටිනවා.. මොකද අපේ ගෙයි වහලෙ ටකරං ගලවලා දෙපියස්සට පරාල ගහලා උළු තියන වැඩේ පටන් ගන්න නැකතත් මාසෙ අන්තිමට.. නමුත් කරන්න දෙයක් නෑ..."

උපසේන සුසුමක් හෙළුවේය.

"..වහින්නට හැකිනම් ගිගුම්දී.. වියළි ගම් බිම්වලට ඉහලින්.."

ට්‍රක් රථ රියදුරා වාහනය තුළ තිබූ කුඩා ප්‍රමාණයේ ශබ්ද විකාශන යන්ත්‍රය ක්‍රියාත්මක කළේය.

".. මොනවටද අය්යේ ඒ සින්දු..?"

"..ඒ වගේ සින්දු තමයි ආධාර බෙදද්දි දාන්නේ.."

ශබ්ද විකාශන පෙට්ටියෙන් පැතිරුණු ගී හඬ තානායම් මිදුල පුරා නින්නාද වන්නට විය.

".. අපරාදෙ මටත් එන්න තිබුණා නම් මරු.."

උපසේනට නොදැනීම කියවුණේය.

තානායම් මිදුලේ නවතා ඇති මෝටර් රථ කීපය අතරේ පඩු පැහැයෙන් නැගී සිටි යෝධයෙකු මෙන් දිස්වන සම්මාදම් ආධාර බඩු පිරවූ ට්‍රක් රථයේ ඉදිරියේ එල්ලූ බැනරයේ සඳහන් වන්නේ තමාගේ ගමට අල්ලපු ගමේ නම නොවේදැයි උපසේන උජාරු හැඟීමෙන් කල්පනා කළේය.

සමුගැනීමේ මොහොත උදාවී තිබේ. උපසේන ශෝකාකුල දෑසින් ට්‍රක් රථය දෙස හැරී බැලුවේය.

එය පණ ගැන්වී ආධාර බෙදීම සඳහා යාමට ගේට්ටුව දෙසට හැරෙමින් තිබිණි.

හදිසියේ යමක් සිහිවූ උපසේන පිම්මේ තම නිදන ඇඳ අසල ලොකර් එක වෙත දිව ගොස් එහි තමා සන්තකයේ තිබූ එකම රුපියල් පන්සියයේ නෝට්ටුව රැගෙන යළි ට්‍රක් රථය වෙත දිව ආවේය.

පිටත් වන්නට සූදානම් වන ට්‍රක් රථයේ රියදුරු අසුන අසල අසුන්ගෙන සිටින්නේ තානායම්පල්ලා සමග කතා බස් කළ ව්‍යාපත් මහත්මයාය.

"..අනේ ඩ්‍රයිවර් අය්යේ.. මෙන්න මේ රුපියල් පන්සීය ඔය ගංවතුර ආධාර බෙදන ගමේ නායක හාමුදුරුවන්ට දෙන්න.. මේ තානායමට වැඩට දාපු උපසේන දුන්නා කියන්න.. අපේ ගෙදර වහල රෙපයාර් කරන වැඩේට ගන්න කියලා.. අනේ මතක ඇතිව දෙන්න ඩ්‍රයිවර් අය්යා.. ලොකු උදව්වක්.."

රුපියල් පන්සියය අතට ගත්තේ රියදුරු අසුනට යාබද අසුනේ සිටි ව්‍යාපත් මහත්තයාය.

"..එතකොට මේ පන්සීයත් එකතු වෙන්න ඕනෑ අර.. මේ තානායමේ කළමනාකාර මහත්මයා ස්ටාෆ් එකත් එක්ක එකතු කරලා වහලක් හදන වැඩකට හාමුදුරුවන්ට බාර දෙන්න කියපු සල්ලිවලටම නේද ඩ්‍රයිවර් මහත්තයා..?"

රියදුරු හිස සලා එය අනුමත කළේය.

ව්‍යාපත් මහත්මයා රියදුරුගෙන් විමසූ පැනයෙන් උපසේන අන්දුන් කුන්දුන් වී ගියේය.

තම හාම්පුතා සහ සේවක පිරිස තමාටත් නොදැනෙන ලෙස හොර රහසේම තම නිවසේ වහලය සෑදීමට මුදලක් රැස් කොට එය තම මවගේ අතට ලැබීමට පවා කටයුතු යොදා ඇතුවා නොවේද?

උපසේනගේ දෑසට කඳුළු ඉනුවේය.

**රන්ජන් ගාමිණී ජයවර්ධන**

# AIA Wellness Day සමඟින් සුවපත්, සැපවත්, දිගුකල් දිවියක් ගත කිරීමට සිය කාර්ය මණ්ඩලය සවිබල ගන්වයි



AIA ඉන්ෂුවරන්ස් ලංකා, සිය කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ සෞඛ්‍ය සම්පන්න බව සහ සුබසිද්ධිය වෙනුවෙන් සමාගම දක්වන කැපවීම විදහා පාමින් 2025 AIA Wellness Day නොබෝදා සාර්ථකව පවත්වන ලදී. AIA Tower හි පිහිටා ඇති AIA ශ්‍රී ලංකා ප්‍රධාන කාර්යාලයේ දී දිනක් පුරාවට පැවති මෙම වැඩසටහන සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින්, වෛද්‍යවරුන්, මූල්‍ය උපදේශකයින් ඇතුළු කණ්ඩායමක් සහභාගී වී සිටි අතර සමස්ත සුවතාවය අරමුණු කරගත් අත්දැකීමක් ඊට සහභාගී වූ සියලු දෙනා වෙත ලබාදෙන ලදී. එහිදී ප්‍රධාන වශයෙන් කායික, මානසික සහ මූල්‍යමය සුවතාවය ප්‍රවර්ධනය කිරීම මූලිකව අරමුණු කෙරුණ අතර AIA සමගින් අත්වැල් බැඳගෙන සිටින විවිධ සුවතා සහකරුවන් විසින් මෙම වැඩසටහනට ඔවුන්ගේ දායකත්වය දැක්වීය. එම සේවාවන් අතරින් නොමිලේ ඇස් පරීක්ෂාව සඳහා Vision Care ආයතනය ද පූර්ණ සෞඛ්‍ය පරීක්ෂාවක් Hemas රෝහල විසින් ද ලබා දෙන ලදී. මේ සඳහා සහභාගී වූ කාර්යමණ්ඩල සාමාජිකයින් හට ECG පරීක්ෂාවකට ලක්වීමට ද අවස්ථාවක් ලැබුන අතර ඒ පිළිබඳ තොරතුරු ලබාදීම වෙනුවෙන් MBBS සුදුසුකම් ලත් වෛද්‍යවරුන්ද වැඩසටහනට සහභාගී වී සිටියහ.

ඊට අමතරව Hemas FMCG's කුමාරිකා කණ්ඩායම හිසකෙස් පිළිබඳව විශ්ලේෂණයක් o Adora by Hemas මගින් සම පිළිබඳව ඇගයුමක් සිදුකරන ලද අතර කාර්යමණ්ඩල සාමාජික සාමාජිකාවන් හට සිය සම සහ හිසකෙස් හරියාකාරව නඩත්තු කිරීම පිළිබඳව වටිනා අදහස් සහ දැනුවත් බවක් ලබා ගැනීමට අවස්ථාව උදා විය. එමෙන්ම Aayu by Nawaloka Premiere වෙතින් සෞඛ්‍ය සම්පන්න අයුරින් ආහාර ලබා ගැනීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා ආහාර පිළිබඳ විශේෂඥවරයකු විසින් උපදේශන සැසියක් ද පවත්වන ලදී.

සුවැති ජීවිතයක් ගත කිරීම සඳහා මූල්‍යමය සුවතාවය වඩාත් වැදගත් බැවින් කොමර්ෂල් බැංකුව සහ NDB බැංකුව විසින් උපදේශන සැසියක් පවත්වන ලද අතර මූල්‍යමය වශයෙන් සුරක්ෂිත අනාගතයක් උදාකර ගැනීම සඳහා පුද්ගල මූල්‍ය කළමනාකරණය, ඉතුරුම් සහ ආයෝජනය සඳහා ඇති විවිධ මෙවලම් පිළිබඳව ද කාර්යමණ්ඩල සාමාජිකයින් දැනුවත් කරන ලදී.

AIA සුවතා දිනය කාර්යමණ්ඩල සාමාජිකයින් හට වඩාත් සතුටෙන් සැමරීමට අවස්ථාව සලසා දී තිබිණි. මානසික සුවතාවය ඇතිකිරීම උදෙසා සැමදෙන එක්ව සතුටින් සිදුකල හැකි Musical VR Game, Hammer Strength Challenge වැනි ක්‍රීඩා මෙන්ම AIA Wellness Wheel of Fortune වැනි ක්‍රියාකාරකම් රාශියක් මෙහි දී කාර්යමණ්ඩලයට අත්දැකීමට හැකි විය. දෛනික ජීවිතයේ දී සරල ක්‍රියාකාරකම් ඔස්සේ සිත සන්සුන්ව තබා ගැනීමේ වැදගත්කම මතක්කර දෙමින් තම

නිර්මාණශීලිත්වය ඉස්මතු කරමින් සහභාගී වූ අයට ත්‍රිමාන චිත්‍රයක් තමන් කැමති අයුරින් පාට කිරීමට ද අවස්ථාව ලබා දී තිබිණි.

තවත් කැපී පෙනුන වැඩසටහනක් වූයේ Flash Health App එක ආධාරයෙන් සිදු කෙරුණ AIA Walk & Win Step Challenge ක්‍රියාකාරකමයි. මෙමඟින් කාර්යමණ්ඩල සාමාජිකයින් හට දින 14ක් පුරාවට වඩාත් ක්‍රියාශීලීව සිටිමින් තමා ඇවිදින පියවර ප්‍රමාණය Flash Health App එක ඔස්සේ මැන බැලීම අභියෝගයක් ලෙස ලබා දී තිබිණි. මේ සඳහා සාමාජිකයින් විශාල පිරිසක් සහභාගී වූ අතර සියලු දෙනා ඇවිදින ලද පියවර ප්‍රමාණය එකතුවක් ලෙස ගත්කල මිලියන 12ක් ලෙස වාර්තා විය. මෙහි දී වැඩිම පියවර ප්‍රමාණයක් හිමිකරගෙන ජයග්‍රහණය කළ සාමාජිකයා හට ත්‍යාග වශයෙන් තායිලන්තයේ බැංකොක් නගරයට සංචාරය කිරීමට ගුවන් ටිකට් පත් 2ක් දිනා ගැනීමට හැකි වූ අතර වැඩි පියවර

ප්‍රමාණයක් හිමිකර ගත් ඉතිරි ජයග්‍රාහකයින් හතර දෙනාට ක්‍රියාශීලීව සිටීම වෙනුවෙන් ඔවුන් දැක්වූ කැපවීම වෙනුවෙන් Smartwatch එකක් බැගින් ත්‍යාග කෙරිණි.

2025 AIA සුවතා දිනය වඩාත් සාර්ථක වැඩසටහනක් ලෙස නිමා වූ අතර එමඟින් සිය කාර්යමණ්ඩල සාමාජිකයින් හට සුවපත්, සැපවත්, දිගුකල් දිවියක් උදාකර ගැනීම සඳහා ජනතාවට සහාය වීම යන සමාගමේ සන්නාම ප්‍රතිඥාව තහවුරු කරමින් ඒ සඳහා සැබෑ අරුතක් උදාකරලීමට සැමට හැකි විය.

# BUSINESS ROUNDUP
මොනරා

## IT Gallery විසින් සංවිධානය කළ 'IT Gallery - HIKVision Partner 2025' සමුළුව සාර්ථකව පැවැත්වේ



මෙරට තොරතුරු තාක්ෂණික මෙවලම් බෙදාහැරීමේ වෙළෙඳපලේ ප්‍රමුඛ සන්නාමයක් වන IT Gallery Computer (Pvt) Ltd විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන IT Gallery - HIKVision 2025 හවුල්කාර සමුළුව පසුගිය දා සාර්ථකව නිමා විය. දේශීය ආරක්ෂක තාක්ෂණික කර්මාන්තයේ විශිෂ්ටත්වය, නවෝත්පාදනය සහ හවුල්කාරීත්වය මෙම සමුළුව මඟින් උත්කර්ෂවත්ව සමරනු ලැබේ. 2017 වසරේ දී මෙම සමුළුව මුල් වරට පැවැත්වුණු අතර එතැන් සිට අද දක්වා එය තොරතුරු තාක්ෂණික බෙදාහැරීම් ක්ෂේත්‍රයේ වැඩි අවධානයක් දිනාගත් අවස්ථාවක් බවට පත්ව ඇත. මෙම අවස්ථාව සඳහා දිවයින පුරා විහිදී සිටින කලාපීය අලෙවි නියෝජිතයන් සහ අගය එකතු කළ විසඳුම් සපයන්නන් ඇතුළු හවුල්කරුවන් 400කට අධික පිරිසක් එක්ව සිටියහ.

## පීපල්ස් ලීසිං සමාගම සිය 112 වැනි ශාඛාව දෙමටගොඩදී විවෘත කරයි



ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකු නොවන මූල්‍ය ආයතනයක් හා මහජන බැංකුවට අනුබද්ධිත සමාගමක් වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (PLC), 111 කින් යුත් ශාඛා ජාලය තවත් පුළුල් කරමින් සිය 112 වැනි ශාඛාව 2025 නොවැම්බර් මස 10 වන දින දෙමටගෙ ාඩදී අංක 430, ඩැනිස්ටර් ඩී සිල්වා මාවත, කොළඹ 09 යන ස්ථානයේදී විවෘත කිරීම සිදු විය. මෙම විවෘත කිරීමේ උත්සවය සඳහා පීපල්ස් ලීසිං සමාගමේ සභාපති මහාචාර්ය අජන්ත සමරකෝන් මහතා, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සංජීව බණ්ඩාරනායක මහතා, සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයින්, ශාඛා කාර්ය මණ්ඩලය, රාජ්‍ය ආයතන නිලධාරීන්, පාරිභෝගිකයන් ඇතුළු සම්භාවනීය අමුත්තන් පිරිසකගේ සහභාගීත්වයෙන් අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.

## සිංගර් සමාගම 2030 දක්වා ESG සැලසුම දියත් කරයි




සිංගර් (ශ්‍රී ලංකා) පීඑල්සී, ගෘහභාණ්ඩ අලෙවියේ වසර ගණනක විශ්වාසය දිනූ සමාගමක් වන අතර හේලීස් සමූහයේ ප්‍රධානතම සාමාජිකයෙකු ද වේ. "අරමුණ තුළින් ප්‍රගතිය" යන අදහස සමඟ 2030 වසර සඳහා පරිසරය, සමාජය හා පාලනය (Environmental, Social and Governance) (ESG) ගැන සමාගමේ සැලසුම මේ වන විට එළි දක්වා තිබේ. දියුණුව වෙනුවෙන් සමාග මේ වැඩපිළිවෙළත්, සෑම අංශයකම තිරසර බවත් ඇති කිරීම සඳහා සිංගර් සමාගම දක්වන කැපවීම මේ තුළින් පෙන්නුම් කර ඇත. ලෝකයත්, ජනතාවත් යන දෙකම සමඟ සහයෝගයෙන් හා වගකීමෙන් දිගටම කටයුතු කිරීම සමාගමේ බලාපොරොත්තුවයි. සැලකිල්ල මූලික කරගත් සේවයක් තුළින් දියුණුව වෙත ළඟා වීමේ ක්‍රියාවලියක් මේ තුළින් ඉලක්ක කර ඇත.

## ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, 2025 ජාතික සැපයුම් දාම විශිෂ්ටතා සම්මාන උළෙලේදී ගෞරව සම්මානයට පාත්‍ර වේ




ශ්‍රී ලංකාවේ විශාලතම සහ ශක්තිමත්ම රක්ෂණ සමාගම වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගම (SLIC) 2025 ජාතික සැපයුම් දාම විශිෂ්ටතා සම්මාන (National Supply Chain Excellence Awards) උළෙලේදී, 'සේවා සැපයුම් කාණ්ඩය යටතේ හොඳම සැපයුම් භාවිතයන් පෙන්නුම් කළ ආයතනය' ලෙස ගෞරවනීය ඇගයුම් සම්මානයට පාත්‍ර විය. කර්මාන්ත අමාත්‍යාංශය සහ සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය (Institute of Supply and Materials Management - ISMM) එක්ව සංවිධානය කරනු ලැබූ මෙම සම්මාන උළෙල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි, මොනාක් ඉම්පීරියල් හෝටලයේදී පසුගිය ඔක්තෝබර් මස 24 වන දින වර්ණවත් අයුරින් පැවැත්විණි.

මෙම ජාතික ඇගයීම තුළින් SLICys වගකීම් සහ ආයතනික පාලනය හා මෙහෙයුම් විශිෂ්ටත්වය තහවුරු වන අතර රක්ෂණ ක්ෂේත්‍රය තුළ පමණක් නොව, ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාව අතරද ප්‍රමුඛයකු වීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයට හැකි වී තිබේ.



# අචින්ති තම්පි හවති - චින්තිතම්පි විනස්සති

# "නොසිතන දේ වෙනවා. සිතන දේ වැනසෙනවා."

මේ දිනවල ඉතාමත්ම ජනප්‍රිය වී ඇති දහම් පාඨයක් වන්නේ "අචින්ති තම්පි හවති - චින්තිතම්පි විනස්සති." යන්නයි. එහි තේරුම විදිහට ප්‍රසිද්ධ වී තිබෙන්නේ "හිතෙන දේ වෙන්නේ නැහැ. වෙන දේ හිතා ගන්න බැහැ." යන්නයි. නමුත් එය එහි සැබෑ අදහස නොවේ. බුදු රජාණන් වහන්සේ මෙවැනි අදහසක් දේශනා කරන්නේ නැත. එයට හේතුව භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වී චතුරාර්ය්‍ය සත්‍ය ධර්මය, පටිච්ච සමුප්පාද ධර්මය සහ පට්ඨාන ධර්මය දේශනා කිරීමයි. මේ ලෝකයේ තියෙන ඕනෑම දෙයක් තියෙන තත්ත්වයෙන් තවත් තත්ත්වයකට වෙනස් කරන්න පුළුවන්. එයට උත්සාහය අවශ්‍යමයි. මේ ලෝකයේ සියල්ලම ඇති වෙන්නේ හේතුන්ගෙන්. ඒ හේතුඵල ධර්මයන්ගේ ක්‍රියාකාරීත්වය තමන්ට අවශ්‍ය අරමුණ උදෙසා හැසිර වූ විට ඉතාමත්ම උසස් ප්‍රතිඵල ලබා ගන්න පුළුවනි.

ඉහත සඳහන් පේළි දෙකේ සම්පූර්ණ ගාථාවත් එහි අදහසත් වන්නේ මෙයයි.

"අචින්තිතම්පි හවති - චින්තිතම්පි විනස්සති.

න හි චින්තාමයා භොගා - ඉත්ථියා පුරිසස්ස වා."

"නොසිතන දේ වෙනවා. සිතන දේ වැනසෙනවා. ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ සිතූ පමණින්ම සම්පත් ලැබෙන්නේ නැහැ." සම්පත් ලබන්න නම් නැවත නැවත උත්සාහ කළ යුතුයි. සරභ මිග ජාතකයේ දී, එහි සඳහන් වන ඒ රජතුමායි එහෙම කියන්නේ.

මෙම ගාථාව සඳහන් වන්නේ සූත්‍ර පිටකයේ ජාතක කථාවල 'සරභ මිග ජාතකයේත්, මහා ජනක ජාතකයේත්' ය. එසේම සැරියුත් මහරහතන් වහන්සේගේ මහා ප්‍රඥාව පෙන්වා දී අග්‍රතනතුරු ලබා දුන් සිදුවීම සඳහන් 'ඒතදග්ග පාලියෙත්' මෙය සඳහන් වේ. විශේෂයෙන්ම වටිනා දහම් කාරණාවක් සඳහන් වන ගාථාවක සැබෑ අදහස වෙනස් කර, වෙනත් අදහසක් මේ දිනවල ජනප්‍රිය වී ඇත. එය සම්පූර්ණ බුද්ධ භාෂිතය ගැන වැරදි වැටහීමක් ඇති කරන්නකි.

ඉහත ගාථාවෙන් කියවෙන්නේ,

පිරිමියකුට හෝ කාන්තාවකට සිතූ පමණින් සම්පත් ලැබෙන්නේ නෑ. සම්පත් ලබන්න නම් ඔවුන් වීර්ය කරන්න ඕන. වීර්ය කරද්දී සාර්ථක නොවෙන්න පුළුවන්. ඒත් නැවත නැවත වීර්ය කරන්න ඕන. එතකොටයි සම්පත් ලැබෙන්නේ."

ඉහත සඳහන් කාරණාව හැර 'හිතන දේ වෙන්නෑ. වෙන දේ හිතාගන්න බෑ...' යැයි අදහසක් සමාජගත වීම බරපතළ වරදකි. හේතුඵල ධර්මයන්ගේ ක්‍රියාකාරීත්වය ගැන දේශනා කරන බුදු දහම බරපතළ ලෙස විකෘති කිරීමකි. මේ කාරණාව නිවැරදිව තේරුම් ගන්නට නම් අදාළ ජාතක කථාවේ අදාළ සිදුවීම ගැන දැන ගත යුතු වේ. සූත්‍ර පිටකයේ, ඛුද්ධක නිකායේ, ජාතක පාලියේ, තේරසක නිපාතයේ එන දහවන ජාතක කථාව වන්නේ සරභ මිග ජාතකයයි. එහි සාරාංශ කථාව සහ අදාළ ගාථාව පහත සඳහන් කරමි.

## සරභ මිග ජාතකයේ නිධාන කථාව

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි, තමන් වහන්සේ විසින්ම, කෙටියෙන් ඇසූ ප්‍රශ්නවලට ධර්ම සේනාධිපති සැරියුත් මහරහතන් වහන්සේ විසින් විස්තර සහිතව විවරණය කිරීම අරභයා, සරභ මිග ජාතකය දේශනා කළ සේක.

රජගහනුවර සිටුතුමා රත් සඳුන් පාත්‍රයක් සාදා උණ ගස්වලින් සෑදූ විශේෂ උස් තැනක තැන්පත් කර, මේ නුවර රහතන් වහන්සේලා සිටී නම් මේ පාත්‍රය අහසින් ගොස් ගන්නැයි අණ බෙර ගැස්වීය. පිණ්ඩපාතයේ වැඩම කරමින් සිටි මුගලන් මහරහතන් වහන්සේ මෙය අසා පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් වහන්සේට අහසින් ගොස් මේ පාත්‍රය අතට ගන්නැයි අණ කළේය. මහ රහතන් වහන්සේ එය අතට ගත් පසුව විශාල මහජන ප්‍රසාදයක් ඇති වුණි. මෙය මුල් කරගෙන බුදුරජාණන් වහන්සේ ඍද්ධි ප්‍රාතිහාර්ය නොකරන ලෙස ශික්ෂා පදයක් පැනවී ය. එය දැනගත් අන්‍ය තීර්ථකයෝ ප්‍රාතිහාර්ය කරන්නැයි බුදු රජාණන් වහන්සේට අභියෝග කළේය. එම සිදුවීම නිසා බිම්බිසාර රජතුමා ප්‍රාතිහාර්ය කරන්නැයි බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේය.

ඒ ආරාධනාව අනුව ගණ්ඩබ්බ ගස මුල දී යමා මහා ප්‍රාතිහාර්ය පෑ බුදු රජාණන් වහන්සේ, ඉන්පසුව තවුතිසා දෙව්ලොව වස් වසා වැඩම සිට වස් පවාරණයෙන් පසුව සංකස්ස නුවරට වැඩම කළහ. එම දේවාවරෝහණ අවස්ථාවේ දී, භාග්‍යවතුන් වහන්සේ සැරියුත් මහ රහතන් වහන්සේගේ මහා ප්‍රඥා ගුණය මතු කරමින් ප්‍රශ්න ඇසූහ. තෙරුන් වහන්සේ ඒවා විසඳූ සේක. ඉන්පසුව දම්සභා මණ්ඩපයේ දී සැරියුත් මහා රහතන් වහන්සේගේ පුළුල්, ගැඹුරු, තියුණු, විනිවිද දක්නා ප්‍රඥාව නිසා, ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අග තනතුර ලබා දෙමින් "සරභ මිග ජාතකය" දේශනා කළ සේක.

## අතීත කථාව

අතීතයෙහි බෝසතාණන් වහන්සේ "සරභ" නම් මුව වර්ගයට අයත් සරභ මුවෙක්ව උපත ලැබීය. මේ කාලයෙහි සිටි රජතුමා මුව දඩයමට දැඩි සේ ලොල් වුණ ශක්ති සම්පන්න දක්ෂ රජ කෙනෙක් විය. එක් දිනක් මේ රජු ඇමැතිවරුන් සමඟ මුව දඩයමෙහි ගොස් ඒ ඇමැතිවරුන්ට මෙසේ කීය. "කවුරු හරි කෙනෙක් ළඟින් මුවා පැන ගියොත් ඔහුම මුවාව අල්වා දිය යුතුයි." මෙය ඇසූ ඇමැතිවරු කතිකා කරගෙන සරභ මුවාව රජු සිටින දිසාවටම පන්නන්නට විය. රජු හීයක් විද්දත් සරභ මුවා එය වළක්වාගෙන පැන යන්නට විය. තමන් ළඟින්ම පැන ගිය නිසා රජුටම මුවාව අල්ලන්නට පසුපස පන්නන්නට සිදු විය.

සරභ මුවා පැන යන මාර්ගයෙහි තණකොළවලින් වැසුණ අති විශාළ වතුර පිරුණු නරා වළක් තිබුණි. සරභ මුවා ඒ ජලයෙහි සුවඳ ආඝ්‍රාණය කර ජලය පිරුණු වළක් බව දැනගෙන එය මඟ හැර පැන යන්නට විය. නමුත් මුවා පසුපස පන්නාගෙන ආ රජු එම වළ දැක්කේ නැත. රජු එම වළට වැටුණි.

පැන යන සරභ මුවා රජුගේ පියවර හඬ නොඇසෙන නිසා, රජු වළට වැටෙන්න ඇතැයි සිතා ආපසු හැරී විත් බලන්නට විය. ගැඹුරු ජලයට වැටී ක්ලාන්ත වී සිටින රජු දැක, තමන්ට කළ අපරාධය ගැන නොහිතා කරුණාව හිතේ ඇති කරගෙන "ඇස් පනාපිටම රජු නොමැරේවා!" කියා සිතාගෙන අසල ඇති ගල් එම වළට දමා රජුව බේරා ගන්නට විය. ඉන්පසුව පාර පෙන්වා වනයෙන් බැහැර කර පන්සිල් උගන්වා නැවතත් වනයට යන්නට විය.

රජු තමන්ගේ පිරිසට එකතු වී නැවතත් නගරයට පැමිණෙන්නට විය. එදිනම තමන්ගේ නගර වැසියන්ට පන්සිල් රකින්නට අවවාද කරන්නට විය. රජතුමා බෝසතාණන් වහන්සේ තමන්ට කළ උපකාරය ගැන කිසිවකුට නොකියා එදින රාත්‍රී ආහාර ගෙන නිදා

> පිරිමියෙක්ට හෝ කාන්තාවකට කිසි දෙයක් සිතූ පමණින් ලැබෙන්නේ නෑ. ඒක සාර්ථක කරගන්න නම් ඔවුන් වීර්ය කරන්න ඕන. වීර්ය කරද්දී සාර්ථක නොවෙන්න පුළුවන්.

ගන්නට විය. අලුයම අවධි වූ රජතුමා සරභ මුවා තමන්ට කළ උපකාරය මතක් කරමින් ඉතාමත්ම සතුටින් ගාථා හයකින් ප්‍රීති වාක්‍ය කියන්නට විය. ඉහත ගාථාව සඳහන් වන්නේ එම ප්‍රීති වාක්‍යයේය.

1. ආසීසෙථෙව පුරිසො - න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො
පස්සාමි වොහං අත්තානං - යථා ඉච්ඡිං තථා අහු.

"නුවණැති පුද්ගලයා පටන් ගත් කටයුත්තෙහි ආශාව අත් හැරීම නොකළ යුතුයි. බලාපොරොත්තු තබාගත යුතුයි. කලකිරීමට පත් නොවිය යුතුයි. මමත් එහෙමයි. මමත් කැමැති වීමි. එය එසේම විය. ඒ මම මා දිහා බලමි."

මමත් මුවාව මරන්නම හිතාගෙන මුවාගේ පසු පස්සේම ගිහින් ඒ වතුර පිරුණු නරා වළට වැටුණා. කරුණාවන්ත ඒ සරභ මුවා වළට ගල් තල්ලු කරලා මැරෙන්න ගිය මාව මරණයෙන් බේර ගත්තා.

2. ආසීසෙථෙව පුරිසො - න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො
පස්සාමි වොහං අත්තානං - උදකා ථලමුබ්භතං.

"නුවණැති පුද්ගලයා පටන් ගත් කටයුත්තෙහි ආශාව අත්හැරීම නොකළ යුතුයි. බලාපොරොත්තු තබා ගත යුතුයි. කලකිරීමට පත් නොවිය යුතුයි. ඒ මම දියෙන් ගොඩ එන ලද තමන් දකිමි."

3. වායමෙථෙව පුරිසො, න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො;
පස්සාමි වොහං අත්තානං, යථා ඉච්ඡිං තථා අහු.

"නුවණැති පුද්ගලයා පටන් ගත් කටයුත්තෙහි උත්සාහ කළ යුතුය. කලකිරීමට පත් නොවිය යුතුය. යමක් කැමැතිවීම්ද, එසේම වූයේය. මම ඒ තමන්වම දකිමි."

4. වායමෙථෙව පුරිසො - න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො
පස්සාමි වොහං අත්තානං - උදකා ථලමුබ්භතං.

නුවණැති පුද්ගලයා පටන්ගත් කටයුත්තෙහි උත්සාහ කළ යුතුය. කලකිරීමට පත් නොවිය යුතුය. දියෙන් ගොඩ එනලද මම තමන්ව දකිමි.

5. දුක්ඛූපනීතොපි නරො සපඤ්ඤො - ආසං න ඡින්දෙය්‍ය සුඛාගමාය
බහූ හි ඵස්සා අහිතා හිතා ච - අවිතක්කිතා මච්චමුපබ්බජන්ති

"නුවණැති පුද්ගලයා දුකට පැමිණියත්, සැපයට පැමිණීම සඳහා වූ ආශාව (බලාපොරොත්තුව) නැති කර නොගත යුතුය. අහිතවත් වූත් හිතවත් වූත් බොහෝවූ ස්පර්ශයෝ නොසිතාම මිනිසා වෙත පැමිණේ."

6. අචින්තිතම්පි භවති, චින්තිතම්පි විනස්සති;
න හි චින්තාමයා භොගා, ඉත්ථියා පුරිසස්ස වා.

නොහිතන දේ වෙනවා. හිතන දේ වැනසෙනවා. ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ සිතූ පරිදිම සම්පත් ලබැන්නේ නැහැ. (රජතුමා උදන් ඇනී ය.)

පුරෝහිතතුමා උදෑසනම රජතුමාගේ සුවසේ නිදා ගැනීම ගැන විමසීමට පැමිණ දොර අසල සිටියේය. පුරෝහිතතුමා රජුගේ ප්‍රීතිවාක්‍ය ගීතයෙහි හඬ අසා එහි තේරුම දැන ගන්නට විය. ඔහුට වැටහුන අදහස මෙයයි. "රජතුමා ඊයේ දින මුව දඩයමට ගියේය. එහිදී සරභ මුවාට ඊතලයක් විදින්නට විය. ඉන්පසුව ඌ මරාගෙන එන්නෙමියි ක්ෂත්‍රිය මානයෙන් ඌ លුහුබඳින්නට ගොස් රියන් සැටක් වූ නරාවළෙහි වැටී ඇත. දයාබහුල වූ සරභ මුවරජු, ඒ රජුගේ වරද ගැන නොසිතා රජුව වළෙන් උඩට ගෙන ඇත. රජතුමා ඒ නිසා මේ ප්‍රීතිවාක්‍යය ප්‍රකාශ කළේ යයි සිතමි."

බමුණා රජතුමාගේ ප්‍රීතිවාක්‍යයේ අදහස හොඳින්ම දැනගෙන, ඉන්පසුව නිය අගින් දොරට ගැසීය. රජු "මේ කවරෙක්දැයි" අසන්නට විය. "දේවයන් වහන්ස, මම පුරෝහිතයා වෙමි"යි කීය. රජු දොර හැර "ආචාර්යතුමනි, ඇතුළට එන්න" යැයි කීය. පුරෝහිත තුමා ඇතුළට ගොස් රජුට ජයපතා එකත්පස්ව සිට, "මහරජතුමනි, මම ඔබ විසින් වනයෙහි දී කළ කරුණ දැන ගත්තෙමි. ඔබ එක් සරභ මුවකු ලුහුබඳිමින් ගොස් නරාවළකට වැටුනා නේද? ඉන්පසුව ඒ සරභ මුවා වතුරට ගල් දමා ඔබව නරා වළෙන් උඩට ගත්තා නේද. ඒ ඔබ, උගේ ගුණ සිහිකර උදන් ඇනුවා නේදැ"යි ගාථා දෙකක් කීවේය.

ඒ මොහොතේ රජතුමා "ඔබ මාත් සමඟ මුව දඩයමේ ආවේ නැහැනේ. ඒත් මේ සිදුවීම දැන ගත්තේ කෙසේදැ" යි ඇසීය. "මහරජතුමනි, මම ඊයේ මුව දඩයමේ ආවේ නැහැ. කවුරුත් මට මේ සිදුවීම කීවෙත් නැහැ. එහෙත් ප්‍රඥාවන්තයෝ මනාව කියන ලද ගාථා පදයන්ගේ අර්ථය සොයා ගනිති." යැයි කීවේය. රජු සතුටු වී ඔහුට බොහෝ ධනය දුන්නේය.

එතෙකින් මේ ජාතක කථාව අවසන් වන්නේ නැත. ශක්‍ර දිව්‍යරාජයාගේ මැදිහත් වීමෙන් සිදුවන තවත් සිදුවීමක්ද මෙහි ඇතුළත් වේ. ඉන්පසුව මේ ජාතක කථාව අවසානයේ දී "සැරියුත් මහ රහතන් වහන්සේ දැන් පමණක් නොවේ, අතීතයෙහිදී ද කෙටියෙන් කියන ලද දෙය විස්තර වශයෙන් දැන ගත්තා." යැයි දේශනා කරමින් ජාතක කථාව අවසන් කළ සේක. මේ ජාතකයේ දී එකල රජතුමා වූයේ ආනන්ද තෙරුන් වහන්සේය. පුරෝහිත තුමා වූයේ සැරියුත් තෙරුන් වහන්සේය. සරභ මුවා වූයේ බුදු වූ බුදුරජාණන් වහන්සේ යැයි දේශනා කළ සේක.

මේ දිනවල ප්‍රසිද්ධියට පත්වී ඇති ගාථාවට අදාළ සම්පූර්ණ සිදුවීම මෙය යි. එහි අදහස "හිතන දේ වෙන්නෑ. වෙන දේ හිතාගන්න බෑ.." කියන එක නෙමෙයි. "නොහිතන දේ වෙනවා. හිතන දේ වැනසෙනවා. ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ සිතූ පරිදිම සම්පත් ලැබෙන්නේ නැහැ. සම්පත් ලබන්න නම් උත්සාහ කළ යුතුයි." යන්නයි. මේ කාරණාව නිවැරදිව සමාජගත නොවීම නිසා මෙතරම් වටිනා දහම් පදයක් ගැන වැරදි අදහසක් සමාජගත වී තිබේ.


පිරිමියෙක්ට හෝ කාන්තාවකට කිසි දෙයක් සිතූ පමණින් ලැබෙන්නේ නෑ. ඒක සාර්ථක කරගන්න නම් ඔවුන් වීර්ය කරන්න ඕන. වීර්ය කරද්දී සාර්ථක නොවෙන්න පුළුවන්. ඒත් නැවත නැවත වීර්ය කරන්න ඕන. එතකොටයි සම්පත් ලැබෙන්නේ. හිතුවා විතරක් කියලා සම්පත් ලැබෙන්නේ නැහැ. සම්පත් ලබා ගන්න නම් නැවත නැවත වීර්ය කරන්න ඕන. එතකොටයි හැමදේම ලැබෙන්නේ.

මේ ගාථාවම සඳහන් වන මහා ජනක ජාතකයේ කියන්නෙත් මේ අදහසමයි. එම ජාතකය මෙහිදී විස්තර කරන්නේ නැත. නමුත් එම ගාථාවේ අදහස මෙයයි.

අචින්තිතම්පි එසේ වීර්ය කරනු ලබන්නන් නොසිතූ දේ සිදු වේ. සිතූ දේ ඉටු නොවේ. මම ද යුද නොකර රාජ්‍යය ලබා ගැනීමට නොසිතුවෙමි. ස්වර්ණභූමියෙන් ධනය උපයාගෙන අවුත් යුදකොට රාජ්‍යය ගනිමියි සිතුවෙමි. එසේ වුවත් මා එසේ සිතූ දේ නොසිදු විය. නොසිතූ දේ සිදුවිය. නහිචින්තාමයා ලෝක සත්ත්වයන්ට සම්පත් පිළිබඳ ආසාවක් ඇති වුවත් සිතූ පමණකින් පමණක් එය සිදු නොවේ. ලෙස එහි සඳහන් වේ. එම නිසා වීර්යය වැඩීමෙන්ම සම්පත් සාදාගත යුතුය. වීර්යවන්තයා නොසිතූ යහපතක්ද ඇතැම් විට සිදුවේ.

ඒ නිසා උත්සාහවන්තව භාවනා කරන්න. සමථ විදර්ශනා දෙකෙන්ම ප්‍රතිඵල මේ ජීවිතයේදීම ලබන්න පුළුවනි.

**තපෝවනයේ රතන ස්වාමින් වහන්සේ**
**රත්නපුර දිසාවේ ප්‍රධාන සංඝනායක ත්‍රිපිටක වාගීශ්වර, සද්ධර්ම ශිරෝමණී මිණීපුර අමා ශාන්ති තපෝවනය, පැල්වාඩිය, රත්නපුරය.**



# කිසිදු විද්‍යාඥයකුට අද දක්වා සොයාගත නොහැකි වූ බුදුන් වහන්සේ සොයා ගත් මහා විශ්ව සත්‍යය

**විද්‍යාඥයෝ යනු කවුද? කෙනකු විමසිය හැකිය. විද්‍යාත්මක දේවල් පිළිබඳ පරීක්ෂණ, නිරීක්ෂණ හා නිගමන කරන්නා ලෙස ද, එසේම ලෝකයේ නව දේවල් සොයා ගන්නා තැනැත්තා ලෙස ද විද්‍යාඥයා හැඳින්විය හැකිය. ඒ අනුව ගුරුත්වාකර්ෂණය සොයාගත් අයිසෙක් නිව්ටන්, රූපවාහිනිය සොයාගත් ජෝන් ලොගී බෙයාඩ් ආදීහු විද්‍යාඥයෝ ලෙස ලෝකය විසින් පිළිගනු ලබති.**

> **මේ ඇත්තක් ලෙස පෙනෙන මිථ්‍යාව ප්‍රත්‍යක්ෂ කිරීම සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීමයි. 'මම' යනුවෙන් කෙනකු නැති බව ප්‍රත්‍යක්ෂ කිරීම සත්‍යය නිවන ප්‍රත්‍යක්ෂ කිරීමයි. සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීමේදී ආලෝකය වෙනම සොයා යා යුතු නැත. කළ හැක්කේත්, කළ යුත්තේත් 'මම' නම් වූ අවිද්‍යාව, සක්කාය දිට්ඨිය, අන්ධකාරය දුරු කිරීමයි. එවිට නොමනස, මම නොවන ස්වභාවය. නොකිසිවක් බව තමාව දැකීම තුළින් එකනෙහිම නිවනට පත්වෙයි. මහා නිවන් සුවය විඳින්නෙකු රහිතව විඳිය හැකි වෙයි. "නිබ්බානං පරමං සුඛං" වන්නේ එවිටය.**

මේ එක එකත් සොයාගත් අය කුඩා කුඩා සීමිත විද්‍යාඥයන් වන නමුදු මේ සියල්ල ඇතුළත් සමස්තය වන මූලික විශ්ව යාන්ත්‍රණය, විශ්වය හා සම්බන්ධ එකම පූර්ණ සත්‍යය සොයාගත් මහා විද්‍යාඥයා වීම ඉතා පහසු කාර්යයක් යැයි ඔබ සිතන්නේ ද?

නැත. එය කිසිසේත් මේ ලෝකයේ අනෙක් කිසිදු සොයා ගැනීමකට වඩා අද්විතීයය. නොදෙවැනිය. සැබෑ ලෙසට කිවහොත් මේ පොළවේ නොව සමස්ත විශ්වයේම ගැඹුරුතම අති ශ්‍රේෂ්ඨ හා ප්‍රමුඛතම දුෂ්කරම කාර්යය වන්නේ එකම මූලික, පොදු 'විශ්වයේ පරම ඒකායන සත්‍යය' සොයා ගැනීමයි. 'පොදු විශ්ව සත්‍යය' සොයා ගැනීමයි.

ඉදින් එය සොයා ගැනීමට විවිධ නේක බාහිර දේවල් සොයාගත් බටහිර කිසිදු මහා විද්‍යාඥයකුට හැකි වී යැයි සිතන්නේද? විසිවන සියවසේ මහා විද්‍යාඥයා ලෙස ලෝකය හඳුන්වන සාපේක්ෂතාවාදය පවා සොයාගත් භෞතික විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින් එය සොයා යනු ලැබුවේ ද? වර්තමාන මහා විද්‍යාඥයා යැයි ලොව පිළිගත් හෝකින්ස් විසින් එය සොයා ගනු ලැබුවේ ද? එසේත් නැතිනම් වර්තමාන ක්ෂුද්‍ර අංශු පිළිබඳ ඉතා සියුම් පරීක්ෂණ පවත්වන ක්වොන්ටම් භෞතික විද්‍යාඥයන් විසින් මෙතෙක් එය සොයාගනු ලැබුවේ ද? නැත. ඒ කිසිවකුත් ඒ විසල් හැකියාවල ප්‍රඥාව කරා මනස මෙහෙයවීමට කිසිසේත් සමත් වූයේ නැත. ඒ අති දුර්ලභ සමත්කම, භාග්‍යය, වාසනාව, ප්‍රඥාව ඔවුන් කිසිවකුද ලැබුවේ නැත.

එහෙත් අති නවීන විද්‍යාත්මක දැනුමෙන් උපරිම වශයෙන් සන්නද්ධ යැයි සලකනු ලබන, පෘථිවියෙන් පිට වෙනත් ග්‍රහලෝක තරණයට පවා හැකියාව ලැබූ බහුතර රටවල් ලෝකය විසින් අද දක්වාත් මහත් ගෞරවයෙන් කෘතඥතාවයෙන්, අතිශය වැදගත් බවින් සලකනු හා පිළිගනු ලැබීමට තරම් ඔවුන් භාග්‍යවන්ත නොවුණ ද මීට වර්ෂ 2560 ගණනකට පෙරදී අපට නුදුරු ඉන්දියාව නම් දේශයේ, ලෝකයේ උසම කන්ද පාමුල බිහි වූ ලෝකයේ උසම අධ්‍යාත්මික මිනිසා වූ මහා අධ්‍යාත්මික විද්‍යාඥ ගෞතම බුදුන් වහන්සේ විසින් මේ 'අසමාන මහා විශ්ව සත්‍යය' ජීවිත කැපකිරීම මධ්‍යයේ සොයා ගන්නා ලදී. වැඩූ මහා ප්‍රඥාව තුළින් දැනගත්තා නොව ප්‍රත්‍යක්ෂ කරන ලදී. එම සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීමත් සමඟ බුදුන් වහන්සේ සහ එම සත්‍යය ඒකත්වයක් බවට, ඒකාත්මක බවට පත්වෙන ලදී. 'ධර්මය දකින්නා මා දකියි' යනුවෙන් පසු කලෙක උන්වහන්සේ ප්‍රකාශ කළේ එහෙයිනි. එනම් ''සෝ ධම්මං පස්සති සෝ මං පස්සති'' යනුවෙනි. සත්‍යය සහ එය පසක් කළ බුදුන් වහන්සේ එකක්ම වූහ. අනන්‍ය විය.

වර්තමානයේ පමණක් නොව, අන්ධකාර අනන්ත අතීතයේ සිට දැක හෝ නොදැන මිනිසා විසින්, මිනිස්සු, චින්තකයන්, දාර්ශනිකයන්, ආගමික ශාස්තෘන්, නේක විද්‍යාඥයන් විසින් කලින් කල සොයාගිය එහෙත් සොයා ගැනීමට අපොහොසත් වූ මෙම 'මහා විශ්ව ඇත්ත' උත්තම බුදුන් වහන්සේ විසින් තමා තුළින්ම සොයා ගත්තා පමණක් නොව, එය ලෝකයේ ආලෝකය වෙනුවෙන්, අධ්‍යාත්මික ආලෝකය වෙනුවෙන් නිර්ලෝභීව, නිස්සරණාධ්‍යාශයෙන් බෙදා දීමට ස්වකීය මුළු ජීවිතයම කැප කරන ලද්දේය. ඒ වෙනුවෙන් එදා ජේතවනාරාමය, නිග්‍රෝධාරාමය වැනි පින්බිම් විශ්ව සත්‍යය විශ්වයට මුදා හරින විකාශනාගාර බවට පත් වුණේය. ඒවා ඇසූ එදා බුද්ධ භූමියේ සිටි භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා පමණක් නොව ඒ අවට සිටි ගහකොළ, සතුන්, කඳු ගංගා පමණක් නොව දිව්‍ය ලෝක පමණක් නොව සමස්ත විශ්ව ධාතුවම ද කම්පනයට මෙන්ම සැනසීමට ද පත් වුණේය. සියලු දිව්‍ය තලවල සියලු දෙවියෝ සාදු හඬ පැවැත්වූවෝය. එසේ වූවේ කෙසේදැයි පහත විස්තර කරන හෙයින් ඒවා මොන බොරු ද කියා එක්වරම කලබල නොවී සමස්ත ලිපියේ අවසානය දක්වා කියවා ගැටලු නිරාකරණය කරගන්නා මෙන් කරුණාවෙන් කියා සිටිමු.

මෙම අනන්ත අගනා විශ්ව සත්‍යය පසක් කළ ඉන් පසු බුදුන් වහන්සේ විසින් ලෝක සත්ත්වයා වෙත මහා කරුණාවෙන් දේශනා කරන ලද්දේ එය තවත් අවශ්‍ය අයට සොයා ගත හැකි, ළඟා විය හැකි න්‍යායයන් ද, ක්‍රම සහ විධි ද මෙත් සිතින් පෙන්වා දෙමිනි. එයට සාක්ෂි ලෙස 'ත්‍රිපිටකය' තවමත් අපට ඉතිරිව පවතී.

ඉදින් දැන් අපි නැවත විමසා බැලිය යුත්තේ, අවධානය යොමු කළ යුත්තේ ලොව එතෙක් මෙතෙක් කිසිදු ජගතෙකුට සොයා ගත නොහැකි වූ බුදුන් වහන්සේ විසින් පමණක් සොයා දැන වදාළ 'මහා විශ්ව සත්‍යය' කුමක්ද? යන්නයි. එය නම් 'මම' යනුවෙන් කෙනකු, මිනිසකු, පුද්ගලයකු නැති බවයි. එසේම මගෙන් පිටත ලෝකය විශ්වය යථාර්ථයම සත්‍යයක්, ඇත්තක් නොව දෘෂ්ටි මායාවක් පමණක් බවයි. පරමාර්ථ සත්‍යය නැති බවයි. එසේම මගෙන් පිටත ලෝකය, විශ්වය යථාර්ථයම සත්‍යයක් ඇත්තක් නොව දෘෂ්ටි මායාවක් පමණක් බවයි. පරමාර්ථ සත්‍යය නිවන පමණකි. එයයි බුදුන් වහන්සේ සොයාගත් මහා විශ්ව සත්‍යය වන්නේ.

නිවන යනු කුමක්ද? මේ සම්මුති ලෝකයේ කිසිදු භාෂාවකින් කිසිදු ලේඛනයකින්, කිසිදු ආකාරයකින් ඍජුව පැහැදිලි කළ නොහැකි නිර්වචනය කළ නොහැකි කිසියම් වචනයක් තිබේද? ඒ වචනය වන්නේ නිවනයි. නිවන යනු විශ්වයේ යථා ස්වභාවයයි. විශ්වයේ නිමාවයි.

බුදුන් වහන්සේ දැන වදාළ විශ්ව සත්‍යය කෙබඳු ආකාර ද යනුවෙන් වඩාත් වචනවලින් විස්තර කරන්නේ නම් සත්‍යය යනු මේ ලෝකය 'මම' නම් වූ අවිද්‍යාවට, සක්කාය දිට්ඨියට, පංච උපාදානස්කන්ධ මිථ්‍යාවට සාපේක්ෂ වූ දෘෂ්ටි මායාවක්, සිහිනයක්, මිරිඟුවක්, පෙණ බුබුලක් මෙන් වූ කිසිවක් පමණි. යථාර්ථමය වශයෙන් දකින්නෙකු නැති දකින දෙයක්ද නැති සත්‍යයකි මේ. කාලයෙන් අතිශය කුඩා වූ කාලයක් වන 'ක්ෂණය' යන්න ගතහොත් සියලු සංස්කාර (පවතින මෙන් පෙනෙන සියල්ල) ක්ෂණයක කාලයක් වත් නොපවතී. සියලු විශ්වය නිසැක ලෙසම අනිත්‍ය වන හෙයින් අධිවේගී චලන විපර්යාස සහිත හෙයින් අතීත, වර්තමාන, අනාගත යන කිසිදු කාලයකට අයත් නොවී අකාලිකව උත්පාද තිථි භංග වේ. එනම් උපත පැවැත්ම මරණය අකාලිකව සිදුවේ. මේ පරම සත්‍යයට එහා තවත් කිසිවකු සොයා යා යුතු යා හැකි කිසිදු විශ්ව සත්‍යයක් මේ විශ්වයේ නොපවතී. පරමාණුව ගවේෂණය කළ විද්‍යාඥ විග්‍රහයද මීට ආසන්න තත්ත්වයක පවතී.

සත්‍යය ලෙසම මේ සමස්ත විශ්වයම වූ කලී මහා ඇත්තක් ලෙස පෙනෙන මහා ව්‍යාජයකි. 'මම' නම් වූ මායා නිරීක්ෂකයාට සාපේක්ෂ මායා විශ්වයකි. 'මම' යනුවෙන් කෙනකු, පුද්ගලයකු අයකු කවදාවත් කොහේවත් නැත. එසේ නම් 'මම' යන්නෙන් පිටත කිසිවක් තිබේද? නැත කිසිසේත්ම නැත. සත්‍යාවබෝධය යනු 'මම' යන්න මායාවක් බව නිසැක අත්දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කිරීමයි. 'මම' යනුවෙන් කිසිවකු නැති බව වැඩූ ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කිරීමයි. ඒ බව දැන ගැනීම නොව තමාගේම ප්‍රත්‍යක්ෂය විය යුතුමයි.

ඒ අනුව බුදු පියා පසක් කළ ඒ මහා විශ්ව සත්‍යය ඒ ආකාරයටම, එලෙසම (සත්‍යය දෙයක් නැත) එයම ප්‍රත්‍යක්ෂ කිරීමට තවත් මිනිස් වීරයකු කැමැති වන්නේ නම් ඔහු හෝ ඇය කළ යුත්තේ 'මම' යනුවෙන් කිසිවකු නැති බව. 'මම' ශූන්‍ය බව වැඩූ සමථ විදසුන් භාවනා මඟින් ප්‍රත්‍යක්ෂ කිරීමයි. 'මම' නැත යන මහා සත්‍යය මහා ඇත්ත පසක් කිරීම එක් ආකාරයකින් මේ ලෝකයේ ඉතාම පහසුම කාරණයයි. එහෙත් තවත් ආකාරයකට අනුව මේ සමස්ත විශ්වයේම ඇති අපහසුම, අමාරුම, දුෂ්කරම කාර්ය ද එයමයි.

ඒ අනුව 'මගේ සිත' යන මායාව තුළින් දිස්වෙන සමස්ත සතුන්, ගහකොළ, කඳු, මුහුදු, ඉර, හඳ ආදී සියල්ල ඇතුළත් මේ විශ්වය අවසාන විග්‍රහයේදී නැති දෙයක් ඇති දෙයක් මෙන් පෙනී සිටීමක් පමණකි. එය බුදුන් වහන්සේ තහවුරු කර ඇත්තේ පුද්ගලයා යනු රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන ස්වභාවයන්වල එකතුවක් ලෙසය. එහෙත් රූපය පෙණ පිඩක් මෙන්ද, වේදනාව දිය බුබුලක් මෙන්ද, සංඥාව මිරිඟුවක් මෙන්ද, සංස්කාර කෙසෙල් ගසක අරටුව මෙන්ද, විඥානය මායාවක් මෙන්ද ශූන්‍ය යනුවෙනි. ඊට සාපේක්ෂ සමස්ත විශ්වය ද ශූන්‍ය වීම, හිස් බවට පත්වීම නිසැක බව කිව යුතු නොවේ.

මේ ඇත්තක් ලෙස පෙනෙන මිථ්‍යාව ප්‍රත්‍යක්ෂ කිරීම සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීමයි. 'මම' යනුවෙන් කෙනකු නැති බව ප්‍රත්‍යක්ෂ කිරීම සත්‍යය නිවන ප්‍රත්‍යක්ෂ කිරීමයි. සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීමේදී ආලෝකය වෙනම සොයා යා යුතු නැත. කළ හැක්කේත්, කළ යුත්තේත් 'මම' නම් වූ අවිද්‍යාව, සක්කාය දිට්ඨිය, අන්ධකාරය දුරු කිරීමයි. එවිට නොමනස, මම නොවන ස්වභාවය. නොකිසිවක් බව තමාව දැකීම තුළින් එකනෙහිම නිවනට පත්වෙයි. මහා නිවන් සුවය විඳින්නෙකු රහිතව විඳිය හැකි වෙයි. ''නිබ්බානං පරමං සුඛං'' වන්නේ එවිටය. සත්‍යය ප්‍රත්‍යක්ෂයත් සමඟ සියලු සම්මුතීන් විරහිත, කිසිදා කෙනකු සිහිනෙන්වත් නොපැතූ නොදුටු නොමනසකට, නිවනකට, සදාකාලික සැප සැනසීමකට, නිවීමකට, සියල්ල නැතිව සියල්ලම ලැබීමට නොමනස පත්වෙයි.

සත්‍ය ප්‍රත්‍යක්ෂය යනු සමස්ත සම්මුති විශ්වය තම දෙපා මුල දණ ගැස්වූ මහා විශ්ව වීරයා බවට පත්වීමය. ලෝක විදූ, විශ්වාධිපති බවට පත්වීමය. අජරාමර අමරණීය, සදාතනික සැනසීම දිනා ගත්තා වීමය. සියලු සම්මුති දිව්‍ය ලෝක, සතර අපාය, භූත ලෝක සදාකාලයටම පරාජය කිරීමය. බුදුපියා පෙන්වා දුන් 'මූලික ප්‍රභාෂ්වරය' (ශූන්‍යත්වය) ඒකාත්මික වීමය. අනිර්වචනීය වූ කිසිදා පෙරාතුව උපකල්පනය කළ නොහැකි අධ්‍යාත්මික ශූන්‍ය තලයකට පත්වීමය. දැනුමෙන් නොව සත්‍යාවබෝධි අත්දැකීමෙන් පමණක් එහි ඇතුළු වීමය.

අප සම්මුති භාෂාවෙන් කතා කරන්නේ නම් කිසියම් පුද්ගලයකු සත්‍යයේ සීමාව කරා, ඉසව්ව කරා පැමිණීම යනු මේ සම්මුති විශ්වයේ ඇති දුෂ්කරතම කාර්යයයි. අනවරාග්‍ර සසර ගමනකට ඔහු අවිද්‍යා මමත්වය නිසා කොටුවී, නියත වී සිටියදී විශ්වය පවත්වන මායා ශක්තිය වන මාරයා එහිම ඔහු කොටුකර, සීමා කර උපත, දුක, මරණය නැවත නැවත ලබා දෙන්නට භාවිත නොකරන කිසිදු උපක්‍රමයක් නොමැත්තේය. ඔහු භවගාමී කිරීමට, මමත්වයේ මායාවෙන් දෑස් අන්ධ කර තබා ගැනීමට මාරයා හැකි හැම හැකියාවක්ම උපක්‍රමයක්ම යොදනු ලබයි. ඔහු සසර ඇවිදමින්, දුකම උරුම කරමින්, කුඩා සීමිත පංච ඉන්ද්‍රිය සැපෙහි වහලෙකු බවට පත් කරමින්, ලෝක මිනිස් සමාජයට හඬා වැටෙන්නට සලස්වමින් ක්‍රියා කිරීම මාරයාගේ විශ්ව වගකීමයි. කාර්ය භාරයයි. සත්‍ය ගවේෂී වීරවරයා, උත්තමයා සත්‍ය ගවේෂණය සඳහා ජීවිත පූජාවෙන් ක්‍රියා කරද්දී, මාරයා ද ඔහු ඇය අවිද්‍යාව තුළම, සංසාරය තුළම කොටුකර, සිරකර තැබීමට දිවි පරදු තබා ක්‍රියා කරන්නේමය. අත් නොහැර සටන් කරන්නේමය.

එම කාරණය සනාථ කරන අප දන්නා නිසැක සාක්ෂිය වන්නේ සිදුහත් තාපසතුමා බුද්ධත්වය, විමුක්තිය, සත්‍යය, නිවන සාක්ෂාත් කිරීම සඳහා එදා ශ්‍රී මහා බෝධි මූලයේදී දරන ලද ජීවිත පූජා පෙරදැරි උත්සාහයයි. එහිදී එතුමාගේ සත්‍යාවබෝධය වළකා ගන්නට මාරයා තනිව නොව දස මාර සේනාවක්ම පිරිවරා සටනට පැමිණෙයි. අවසන මාර දූවරු ද සටනට යොදවයි. මේවා බාහිරව සිටින මාරයෙක් නොව විශ්ව ශක්තිය ආශ්‍රිත මාර බලය සෑම පුද්ගල මනසක් තුළම ක්‍රියාත්මක වීමයි. මාරයා බලවත් වන්නේ මෙන්ම බලපෑම් කරන්නේද පුද්ගලයා මමත්වය තුළ සක්කාය දිට්ඨිය තුළ මනස පැවතීම නිසාමයි.

මාර බලවේගය යනු මාරයා යනු කිසිසේත් සුළුකොට තැකිය නොහැකි සම්මුති විශ්වය මෙන්ම මමත්ව මනස ඇසුරු කොටගෙන පවතින විශ්ව මායා ධර්මතාවයි. ලෝක සත්ත්වයා පංචේන්ද්‍රිය සැප පෙන්නා රවටනු ලබන්නේ සහ ඉන් පිටත කිසිසේත් යා නොදී ආරක්ෂා කරන්නේ මාරයා විසින්ය. ලෝකයේ කෝටි ප්‍රකෝටි අතීත, වත්මන්, අනාගත අනන්ත ප්‍රජාවක් රවටා තැබීම ඉතා සරල කාරණයක් ලෙස සිතිය හැකිද? ලෝකයේ අඳුර, අවුල, වියවුල, දුක, මරණය, යුද්ධ, විනාශ, වසංගත, අපරාධ, ඝාතන, භීෂණ, කුමන්ත්‍රණ, සියලු මානව පරිහානි, නොමිනිස්කම් නිර්මාපකයා වන්නේ මාරයාය. එහෙත් මාරයා මිනිසා තුළදී නිබඳ වාසය කරන්නේ මමත්ව අවිද්‍යා මනස තුළ වන අතර මාරයා පරදා කෙනකු මමත්ව මායාව නසා සත්‍යාවබෝධය කළ පසු මාරයා ද පැමිණ ඔහු වන්දනය කරයි. මෙතෙක් මාරයාගේ වහලක වූ පුද්ගලයා මාර පරාජයෙන් පසු මාරයා තම දෙපා සෝදන වහලෙකු බවට පත් කරයි. එපමණක් ද? එතුමා සමස්ත සම්මුති විශ්වයේ පූජනීයත්වයට සුදුස්සෙක් බවට පත්වෙයි.

ඒ අනුව මමත්ව මාරයා පරාජය කරමින්, සත්‍යාවබෝධ කිරීම යනු සම්මුති විශ්වයේ අසීරුතම, දුෂ්කරතම කාර්යය වන්නේ එහෙයිනි.

එහෙත් පරෝපකාර කුසල් සහිතව, සසර දුකෙහි භය දැක, සත්‍යය සඳහා ජීවිතය වුව කැප කරමියි. වහ වහා නොපමාව සමථ විදසුන් වඩා, ප්‍රඥාව උපදවා ගන්නා ගිහි හෝ පැවිදි මානව වීරයකු පරදවන්නට මේ විශ්වයේ කිසිදු මායා බලවේගයකට නොහැකි බව අවසන් වශයෙන් කිව යුතුය.

අපි මමත්වය ප්‍රඥාවෙන් නසමු. ඒ සමඟම අනිර්වචනීය සදා සැප සැනසීමැති සදානන්ද කෙම්බිම වූ නිර්වාණයට නොමනසින් ප්‍රවේශ වෙමු. එමගින් මහා අනන්ත මිනිස් වීරයෙකු වී සකල සම්මුති විශ්වය ඒ අති උත්තම, අති ශ්‍රේෂ්ඨ, අති පූජනීය මානව වීරයා ළඟ දණගස්වා විශ්වාධිපති බවට පත් වී සියලු විශ්වයේ සදා

විමලසේන ජයලත්



# සාලිය-මාලා පෙම් පුරාවත සැඟව යන ගල්ගිරියා කන්ද

**'ඉතිහාසය පදනම්ව අනාගතය නිර්මාණය වනු ඇත' යන්න යථාර්ථය වුවද එය දරාගත නොහැකි සීමාවන් තුළ සිරකර ඇත. එම ඛේදවාචකයේ අඳුරු සෙවණැලි සාලිය - අශෝක මාලා ප්‍රේම වෘත්තාන්තයේ සංසිද්ධීන් ස්පර්ශ කළ ගල්ගිරියා කන්ද ද වසා පැතිරී ඇති බව සක්සුදක් සේ පැහැදිලිය.**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සොබා සෞන්දර්යයෙන් අනූන පරිසරයක පිහිටි මෙම කන්ද අඩි 1,568ක පමණ උසකින් යුතු අතර දුර කි.මී. 07කි. ශ්‍රී ලංකාවේ දිගම කන්ද ලෙස වාර්තා වී ඇති හෙයින් අතීතයේදී දිග දරු කන්ද යනුවෙන්ද භාවිත විය. මෙහි නැගෙනහිරට දිශාභිමුඛව ගල්ගිරියාව ගම ප්‍රධානව අළුත්ගම වතුවත්තේගම, ඇඹෝගම, ඇහැටුවැව සහ කඳුරු වැවද අනෙක් පසට කරගස් වැව, කම්බුවටවන, කුඩුක්කඩවල මුදියන්තගම සහ දිවුල්ගනේ යන ගම්මාන ද ඇතුළුව පරිවාර ගම්මාන ලෙස 135ක් පමණ ඇත.

ශ්‍රී ලාංකේය රාජාවලියේ අද්විතීය යුග මෙහෙවරක් කළ ශ්‍රේෂ්ඨ නරපතියෙක් වූ සූර්ය වංශික දුටුගැමුණු රජුගේ (ක්‍රි.පූ. 161-137) එකම පුතා වන සාලිය කුමරු තම පෙම්වතිය වන අශෝක මාලා සමඟ අනුරාධපුර රජ මැඳුරෙන් පලාවිත් ගල්ගිරියා කන්ද තම වාසභූමිය කොට ජීවත් වූ බවට එහි ඇති පුරාවිද්‍යාත්මක සාක්ෂි මෙන්ම ජනශ්‍රැති සහ ජනප්‍රවාද සනාථ කරයි.

ප්‍රාදේශීය පාලකයකු ලෙස ඔහු ඉටු කළ කාර්යභාරය අනුරාධපුර රාජාංගණයේ සිට යාපහුව දක්වා ජනතාව අදත් සිහිපත් කරනුයේ මහත් භක්තියෙනි. කුඩා වැව් 400ක් පමණ එල්ලංගා පද්ධතිය ඔස්සේ ඉදි කොට ගැමි ජීවිත සුඛිත - මුදිත කර ඇත. මෙම වැව් ඉදිකිරීමේදී රූ සපුවෙන් මෙන්ම මහත් ප්‍රඥාවකින් යුතු අශෝක මාලාගේ සැලසුම් සහ තාක්ෂණික දැනුම් ප්‍රධාන තැනක් ගන්නා ලදී. දුටුගැමුණු රාජ සභාවේ සිටි 'අරිට්ඨ' නමැති සාලියගේ කලණ මිතුරාගේ සම්බන්ධීකරණයෙන් ඉහත සංවර්ධන කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීමට හැකි වූයේ මෙම ආදර අන්දරයට පිය රජුගේ නිහඬ ආශිර්වාදයක් පළකර තිබීම හේතුවෙනි.

එහෙත් මහාවංශ කතුවරයා ඉතා නිර්දය ලෙස මෙම ප්‍රාදේශීය පාලකයාගේ නම ඉතිහාසයට එක් කළේ කිසිදා නොගැලවෙන ලේබලයක්ද ඔහුගේ කරේ එල්ලමිනි. කුලවාදය කරපින්නා ගෙන සිදු කළ මෙම සාහසික අපරාධය අදටත් පාසල් පෙළපොතින් පවා ඉදිරියට ගමන් කරන්නේ 'රොඩී' කෙල්ලක විවාහ කර ගැනීම නිසා රජකම අහිමි කරගත් අයකු ලෙසය.

සැබෑ ලෙසම රාජ්‍ය උරුමය ලැබුණේත් ලැබිය යුතු වන්නේත් සද්ධා තිස්සටය. එය කාවන්තිස්ස රජු විසින් තම දරුවන් දෙදෙනා සපථ කරවා ගත් වාචික එකඟතාවක ප්‍රතිඵලයකි. යම්හෙයකින් රුහුණු මාගම ඇතුළු ප්‍රදේශ වී වගාව ඇතුළු කෘෂිකර්මාන්තයෙන් සන්නද්ධ කළ සද්ධාතිස්සට රජකම නොදී සාලිය නම්කොට තිබුණේ නම් ඔහු සටන් බිම තෝරා නොගනීවි යැයි කොට කිව හැකිද? පියාටත් ව්‍යවස්ථාවටත් අවනත වීම තුළ සියල්ල හොඳින් සිදු විය.

අනුරාධපුර මල්වතු ඔය අසබඩ සැඬොල් ගමක ජීවත් වූ 'බහඳා' නම් ගම්පතියාගේ රූමත් දියණිය වූ අශෝකමාලා සමඟ තම පුතනුවන් රහසේ පලා යාම දුටුගැමුණු රජු එතරම් සැලකිල්ලට ගෙන නැත්තේ ඇතැම් විට ඔහුගේ බිසවද රාජකීය පෙල්පත් උරුමයක් නැති කොත්මලේ ප්‍රදේශයේ ජීවත් වූ රංමැණිකා නමැති ගැමි තරුණියක නිසා විය හැකිය. (ඇයට 'සිරිමල් එතතා' නමින්ද එහි ඇතැම් ගම්මානවල භාවිත වී ඇත. කොස්සගම ලෙන් ලිපියක් 'රමණී බරිය' ලෙස සඳහන්ව ඇත්තේ ද ඇයම විය යුතු වුවද 'රාජිතා' නමින් බිසවක් ගැනද පියන්ගල ලෙන් ලිපියේ තිබේ.)

කෙසේ වුවද සාලිය කුමරු අනුරාධපුර රජ මැඳුරේ සිටි වකවානුවේ තම මිතුරු අරිට්ඨ සමගින් පිය රජුගේ උපදෙස් මත විවිධ ප්‍රදේශවල සංචාරය කර

සංචාරයක සටහන්...

ඇත. එවිට සොබාදම් දිනිතියගේ විස්මිත නිමැවුමක් වූ ගල්ගිරියා කන්ද දෙස බලා "මෙම සුන්දර පරිසරයේ ජීවත් වන්නට ඇත්නම් කෙතරම් අගනේද?" යනුවෙන් අරිට්ඨ කර තිබූ ප්‍රකාශය අතුරුදන් වූ ඔහු සොයා ගැනීමට වැදගත් හෝඩුවාවක් විය.

ගම්වැසියන්ගේ නොමඳ ගෞරවයට පාත්‍රව සිටි සාලියගේ බිසව කුමන කුලකයකට අයත් ද, යන්න කිසිවකුටවත් අදාළ නැති මාතෘකාවක් විය.

රට එක්සේසත් කළ රජකුට සිදුවුණ අවමානයට ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවේ යැයි මරණ බියෙන් සලිත වූ අශෝකමාලාගේ ලේ ඥාතීන් බොහෝ දෙනෙක් රහසිගතව විවිධ ප්‍රදේශවල ඇය සොයා ගොස් අවසානයේ මෙම ගල්ගිරියා කන්දට පැමිණ එහි පහසු ස්ථානයක වාඩිලාගත්හ. 'කුප්පායම් ගල' නමින් හඳුන්වන්නේ එම ගල්තලාවය. පසුව මෙම පිරිස කඳුරුවැව ගම්මානය අසල 'ලෝකුරුගම' නමින් අද හඳුන්වන ස්ථානයේ පදිංචි කරවා ඇත.

ගමත් සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනගා ගත් මෙම යුවල කඳු මුදුනේ මාලිගාතැන්න ලෙස හඳුන්වන ස්ථානයේ තම ප්‍රාසාදයද අනෙකුත් ගල්ගුහා මිනිස් වාසය සඳහා සුදුසු පරිදි ද නිර්මාණය කර තිබූ බව එහි ඇති ගල් කණු, කටාරම්, ගල් පඩි ගඩොලින් ඉදිකළ විශාල ගඩොල් බැම් සහ බිත්ති, පොකුණු මෙන්ම ගොරක, මී වැනි විශාල රුක්ෂයන්ද සාක්ෂි දරයි. මෙම කන්දත් බටහිර බෑවුමින් පිහිටා ඇති කඳුරු වැව කන්දත් අතර පිහිටි විශාල ඉඩ කොටස (දෙබොක්කාව) හරස්කොට ඉදිකළ ජල රැඳවුම වසර පුරාම සීතල දියෙන් පිරී තිබූ අතර එහි නෂ්ටාවශේෂ පමණක් අද දැකිය හැකිය.

මාලිගාතැන්න ප්‍රාසාදයට පහළින් අනුරාධපුරය දක්වා ගමන් කළ හැකි විශාල උමං මාර්ගයක් තිබී ඇතත් ඒ කුමක් සඳහාද යන්න පිළිබඳ නිශ්චිත තොරතුරක් සොයා ගත නොහැක. වවුලන්ගේ වසුරුවලින් පිරී දුර්ගන්ධය හමන මෙහි ගවේෂණ කටයුතු සඳහා ගත් උත්සාහයක්ද ලත් තැනම ලොප් වූයේ විස්මිත වූ ඓතිහාසික සොයා ගැනීමකට සෙනසුරු දසාව උදාකර දෙමින් බව ගම්වාසීහු පවසති.



මෙම පුරාවත සම්බන්ධ කිසිදු මූලාශ්‍රයක් වංශ කතා තුළ දක්නට නොමැති වුවද දේවානම්පිය තිස්ස රජ සමයේ සිට රහතන් වහන්සේලා ඇතුළු යෝගාවචර භික්ෂූන් වහන්සේලා මෙහි වැඩසිටි බවත් එම රජු විසින් ලෙන් පූජාවක් සිදු කළ බවත් 'දෙව් පිය රජත පබත ලෙන' යන ලෙන් ලිපිය තහවුරු කරයි. පුරාවිද්‍යාඥ සෙනරත් පරණවිතාන ශූරීන් විසින් රචිත 'ලංකා ශිලා ලේඛන සංග්‍රහය' යටතේ ඇති කඳුරුවැව ශිලා ලේඛන කොටසේ ද මෙම විස්තර දක්වා ඇත. මෙවැනිම වූ වැදගත් ශිලා ලේඛනයක් දිවුල්ගනේ විහාරස්ථ මහ පොළොව යට නිදන්ව ලොවට රහසක්ව ඇත. එහෙත් වංශ කථා සීමාවෙන් ඔබ්බට ගොස් මුඛ පරම්පරාවෙන් පැවත එන මෙවැනි ජාතික වටිනාකම්වලටද බලධාරීන් සවන් දෙන්නේ නම් අපගේ අතීත ශ්‍රී විභූතිය තව තවත් ඔපමට්ටම් නොවන්නේද?

දිනක් සාලිය කුමරු තම පියරජුන් හමුවී තම මී මුත්තනුවන් වූ දේවානම්පිය තිස්ස රජු ලෙසින්ම තමන්ද එහි ඇති ගල්ලෙන් ඇතුළු දෑ පූජා කිරීමට කැමැත්තෙන් පසුවන බව පවසා ඇත. රට එක්සේසත් කිරීම උදෙසා දිවි දෙවැනි කොට සටන් කළ දස මහා යෝධයන් අතර සිටි ඵුස්සදේව මේ වන විට පැවිදිව රහත් ඵලයට පැමිණ සිටින බවත් ඒ සඳහා උන් වහන්සේ තෝරා ගන්නා ලෙසත් දැන්වූ ගැමුණු රජු අවශ්‍ය සියලු පහසුකම් සපයන ලදී.

නොබෝ දිනකින්ම දහස් සංඛ්‍යාත මහ සෙනඟක්ද සිය ගණනක අලි - ඇතුන්ද සහිත පෙරහරකින් ඵුස්සදේව රහතන් වහන්සේ ප්‍රමුඛ සඟරුවන මහත් හරසරින් වඩම්මවා සුවඳැල් බතින් දන් පිළිගන්වා සාදු නාද මධ්‍යයේ මෙම ගල්ගිරියා කන්ද පූජාකර ඇත්තේ 'දස දෙසින් වඩින යතිවරයන් වහන්සේලාට පූජා වේවා" යනුවෙන් රන් සන්නස්පත් දෙකක ලියා පිළිගන්වමිනි. එම උත්සවයට වැඩි හිමිවරුන්ගේ පා දෝවනය කළ පොකුණ සහ රන් සන්නස්පත් නිදන් කළ ස්ථානය අවට අක්කර භාගයක පමණ තැනිතලා බිමක නැගෙනහිර දිශාවට හැඩ ඇතිව අංශක 45ක ප්‍රමාණයේ එකම කෝණයකට දැවැන්ත අරලිය ගස් සමූහයක් තිබුණි. එහෙත් නිසි විද්‍යාත්මක නඩත්තුවක් නොවීම හේතුවෙන් 2000 වසර පමණ වන විට ඒවා විනාශ වී දිරා ගිය විශාල කඳන් දෙකක් පමණක් ඉතිරිව ඇත.

ඉහත උත්සවය අවසානයේ ඵුස්සදේව හිමියන් විසින් අශෝකමාලා අමතා "ඔබ පුණ්‍යවන්ත මෙන්ම ප්‍රඥාවන්ත කුමරියක වුවද සැඬොල් කුලයේ ඉපදුනේ ඉහත ආත්මයක ඔබ තිවක්ක බමුණුගම ඉපදී තරුණ වියේ සිටියදී ඔබගේ මව සමඟ එහි ඇති අජ්ඨඵල බෝධි මළුව ඇමඳ ඇත්තේ මිරිවැඩි සඟල පැළඳගෙනය. එවිට ඔබේ මව දෝෂාරෝපණය කර ඇත්තේ 'ඔය නොමනා ක්‍රියාව වහාම නතර කරන්න. නොඑසේ නම් සැඬොලියක වී ඉපදේවි' යනුවෙන් කී විට එයට උරණ වූ ඔබ 'මම නොව නුඹයි සැඬොලිය' කියා මවට ද්වේශයෙන් පැවසූ එකයි කළ පාපය." යැයි පවසා ඇත. එවිට "එයින් මිදීමට මා කුමක් කළ යුතුද ස්වාමීනී?" යි අශෝකමාලා පෙරළා විමසුවාය. ඒ සඳහා කළ යුතු වත් පිළිවෙත් සහ පුද පූජා පිළිබඳව උන්වහන්සේ ඇයට දැනුවත් කර ඇත.

ඒ අනුව ගාල වැවෙන් නෙළා ගත් නෙළුම් මල් සහ කොළද සකසාගත් කැවිලි - පෙවිලිද පුරවා ගත් ගැල් සහිතව තිවක්ක බමුණුගම අජ්ඨඵල බෝධිය වෙත ගොස් සිදු කළ යුතු ආගමික වතාවත් ඉටු කළ යුවල ගෙනා කැවිලි වර්ග නෙළුම් කොළ මත තබා එහි පැමිණ සිටි වන්දනාකරුවන්ටත් දුගී - මගීන්ටත් බෙදා දුන්හ. ඒ අතර රැක් සෙවණක හුදකලාව සිටි මහලු මිනිසකුටද කැවිලි පිරවූ නෙළුම් කොළයක් පිළිගන්වා ආපසු හැරෙද්දීම 'පුතණුවනි සාලිය' යන ඇමතුමෙන් වික්ෂිප්තව නැවත ඒ දෙස බලද්දී මහලු වෙස් ගෙන සිටිනුයේ තම පියාණන් බව හැඳින අමන්දානන්දයට පත්ව දෙපා වැඳ ඒ අසලින්ම දෙදණ ඔබා සතුටු සාමීචියේ යෙදුනාහ.

එහිදී අපූරු ඉල්ලීමක් කළ ගැමුණු රජු 'පුත කුලවාදය ජීවිතය කරගත් රජ පෙළපතින් මා නැති කාලයක නුඹලාට වන්නේ නපුරක්මයි. එබැවින් මාගේ මරණයෙන් පසු ඔබ දෙදෙනාම මාගන්තොටට ගොස් එහි වෙරළ පාලකත් සමුද්‍ර පාලකත් හමු වී භාරත දේශයට යන්න. එහි රජතුමා විය යුතු සියල්ල ඉටු කරාවි... දියණියනි, බිය නොවන්න දෙදෙනා සතුටින් සිටින්න. රාජකීය වෛද්‍යවරයාටත් සුව කළ නොහැකි වූ මාගේ කුෂ්ඨ රෝගයත්, නාග විෂත් ඔබ සුව කළ අයුරු විස්මිතයි." යනුවෙන් පවසා මැණික් ඔබ්බවා හැඩ කළ රන් තැල්ලක් සහිත රන් මාලයක් ඇය අත තබා ආශිර්වාද කොට යළි අනුරාධපුරය බලා පිටත් විය.

මෙම රන් මාලය නිමවා තිබුණේ 'තන්තිරියා' යන සමනළ විශේෂයක රූ සටහනක් සහිතවය. අනතුරුව එම තන්තිරි මාලය තිවක්ක බමුණු ගම පුදබිමේම නිදන් කිරීම හේතුවෙන් එම ප්‍රදේශයට 'තන්තිරිමලේ' නම පටබැඳිනි.

ගැමුණු රජුගේ මරණයෙන් පසු ගම්වාසීන් අතරට පැමිණි මෙම ප්‍රාදේශීය පාලකයාත් අශෝකමාලා කුමරියත් අවසන් වරට කන්ද දෙසට හැරී වන්දනා කොට කඳුළු පිරි දෙනෙතින් මාගන්තොට බලා පිටත්වූයේ ගම්වාසීන්ගේ කඳුළු, සෝ සුසුම්, විලාප රැඳි ආශිර්වාද මධ්‍යයේය. කාලයට පියාපත් ලැබී වසර 2000කටත් වැඩි දුරක් රහසේම ගෙවෙද්දී මෙම ඓතිහාසික පෙළ ගැස්ම පිළිබඳව අධ්‍යයනයක යෙදුන 'ඇරැපොල විපස්සි' නම් වූ යතිවරයාණන් වහන්සේ නමක් 1960 දශකයේ අගභාග යේදී මෙහි පැමිණ ගල්ගිරියාවේ විජේරත්න සහ හේරත් බණ්ඩා, වතුවත්තේ ගම සෝපාල බණ්ඩාර, රක්වානේ හේරත් බණ්ඩා යන ගම් ප්‍රධානීන් ඇතුළු කිහිප දෙනකු කැටුව කන්ද තරණය කොට මෙම විස්මිත ඉදිකිරීම් සොයා ගන්නා ලදී. විපස්සි හිමියන්ගේ පැමිණීම මෙම ප්‍රදේශයට 'මහින්දාගමනය' සිදු වූවා සේ විය. උන්වහන්සේද ගල් ගුහාවක නතර විය. ආගමික සංස්කෘතික මෙන්ම සමාජයීය වශයෙන් සාධනීය දිශානතියකට මංපෙත් විවර වූ සාලිය 'ආරණ්‍ය සේනාසනයේ' ආරම්භය එසේ සනිටුහන් විය.

දශකයකට වැඩි කාලයක් වැඩ සිටි ඒ හිමියන් කොළඹ ප්‍රදේශයේ විහාරස්ථානයක් ආරම්භ කිරීමට යාමෙන් පසු පැමිණි මල්වානේ මේධානන්ද හිමියන්ද අපවත්වන තුරුම සිදුකළ මෙහෙවර සදානුස්මරණීයය. වත්මන් සේනාසනාධිපති වනවාසී නිකායේ වයඹ පළාත් ප්‍රධාන සංඝ නායක විතාරන්දෙනියේ සුමේධ නාහිමියන් සාලිය - මාලා කතා අන්දරයේ නිමැවුම් ආරක්ෂා කිරීමට නිරන්තර වෙහෙසක් දරමින් මනා පරිපාලනයකින් යුතුව කටයුතු කරති. එහෙත් මෙහි ඇති ඇතැම් ආරක්ෂිත වැට, පඩි පෙළ, කුටි, ගල්ලෙන් සහ පොකුණු ස්ථිරසාර ලෙස පිළිසකර කර සංරක්ෂණය කර ගැනීමට හැකි අනුග්‍රාහකත්වයක් ලැබෙන්නේ නම් උන්වහන්සේගෙන් ගම්වාසීන්ගේත් මෙම ජාතික සම්පත රැක ගැනීමේ සිහිනය සැබෑවනු ඇත.

වසර 2160ක් තරම් ඉපැරණි ඉංජිනේරු විශිෂ්ටත්වය කියාපාන එල්ලංගා වාරි පද්ධතිය තුළ ඉදිකරන ලද වැව් සියල්ලම පාහේ අද වන විට සාමාන්‍ය වර්ෂාපතනයකදී පවා වාන් දමන තත්ත්වයට ගොඩ වී ඇත. වැසි සමයේ කන්දෙන් ඇදී එන ජල සම්පත රඳවා තබා ගත නොහැක. ඒ පැත්ත බලා මේ පැත්ත බලන විට වැව හිස් වන්නේ කුඹුරුවල වගා කටයුතු අවසන් වීමටත් පෙරය. වසරේ වැඩි කාලයක් වැව දිස්වන්නේ තණ පිට්ටනියක් ලෙසිනි.

රාජ්‍ය මැදිහත් වීමකින් මෙම වැව් තුළ අනාදිමත් කලක සිට තැන්පත්ව ඇති රොන් මඩ තට්ටු ඉවත් කොට පිළිසකර කර දෙන්නේ නම් සාලිය - මාලා යුගයේ තිබූ සශ්‍රීකත්වය යළි ළඟාවනු ඇත. පුරාවිද්‍යාව, ඉතිහාසය, එල්ලංගා වාරි පද්ධති මෙන්ම මානව ශිෂ්ටාචාරය ගවේෂණය කරන අයට ගල්ගිරියා කන්දත් ඒ හා බද්ධ වූ ගැමි සංස්කෘතියත් තරම් වෙතත් සොඳුරු ඉසව්වක් සෙවීම උගහටය.

**(ඡායාරූප ලබාදුන් ශ්‍රීමාලි තෙන්නකෝන්ට විශේෂ ස්තුතිය)**



**වාසල තිලකරත්න - මින්නේරිය**

**බෙංගාල බොක්කේ උතුරු මායිමේ පිහිටි සුන්දර්බන් ලොව ලොකුම කඩොලාන වනාන්තරයයි. බෙංගාලයේ සිට ගලා බසින ගංගා රැ සක ජලයෙන් සැදුණු විසල් ඩෙල්ටාවක පැතිරුණු මෙම විසල් වනාන්තරය බෙංගාලි කොටින් පන්සියයකගේ වාස භවනයයි. එහෙත් මේ සුන්දර්බන් අවට ඇති ගම්මානවල මිනිසුන් මිලියනයකට වඩා ජීවත් වෙති. ඔවුන්ගේ ජීවිත රැක ගැනීම පිණිස කකුළුවන් ඇල්ලීම, මී පැණි එකතු කිරීම, දර කඩා ගැනීම ඇතුළු දහසකුත් එකක් දේ වෙනුවෙන් මේ මිනිසුන් කඩොලාන වනයට ඇතුළු වෙති.**

# සුන්දර්බන් වනයේ කොටියකුට මැදිව...

> සුන්දර්බන් වනාන්තරයේ කොටි නැති වෙලාවක් නැති තරම්ය. රෑයේ සහ උදේ පමණක් නොව ගිනි මද්දහනේද කොටි කඩොලාන කැලයේ සැරිසරන්නේය. ඇතැම්විට අවට ගම්මානවලට පවා ඇතුළු වී ගවයන් එළුවන් වැනි සතුන් ඇදගෙන යන කොටි විටෙක ගෙවල් තුළ නිදාඉන්නා මිනිසුන්වද ඇදගෙන යති.



## ත්‍රාසජනක කතා

එදා පෂූර් ගංගා ඉවුරෙහි පිහිටි ජොයිමොනි ගමේ පදිංචි ජමාල් මොහොමඩ් උණ බම්බුවලින් සාදන ලද නිවෙසේ දොරකඩට වී පායන හිරු දෙස නිහඬවම බලා සිටියේය. කඩොලාන වනය මතින් පෙනුණු පැහැදිලි නිල් අහසෙන් හිරු පායා එන දර්ශනය අලංකාරවත්ය. එහෙත් ඒ ලස්සන බලමින් සිටියදී ඔහුට ඇසුණේ සිය දරුවෙකු හඬන හඬයි.

''මොකද දරුවා අඬන්නෙ?''

ජමාල් හඬ නඟා ඇසුවේ කුස්සියේ සිටි සිය බිරියගෙනි.

''බඩගින්නෙ''

ඇය ගෙතුළ සිට පැවසුවාය.

''ඉතින් මොනවහරි රත්කරල දුන්නනම් ඉවරයිනෙ, එය දරුවා අඬවන්නෙ නැතුව''

ජමාල් කුස්සියට යමින් පැවසුවේය.

''පැල හරියෙ කිසිම දෙයක් නැහැ අනේ''

ඇය කීවේ සිහින් හඬකිනි.

''එහෙමනම මම කඩොලාන කැලේටවත් රිංගලා බලන්නම් කන්න මොනව හරිම හොයාග න්න පුළුවන්ද කියලා.''

ජමාල් බිරියට පැවසුවේය. ''මුකුත් නැති වුණොත් කකුළුවෙක්වත් අල්ලගෙන එන්නම්''

''බලාගෙන. තාම කොටි කැලේ ඇතුළට ගිහින් නැතුව ඇති''

සුන්දර්බන් වනාන්තරයේ කොටි නැති වෙලාවක් නැති තරම්ය. රෑයේ සහ උදේ පමණක් නොව ගිනි මද්දහනේද කොටි කඩොලාන කැලයේ සැරිසරන්නේය. ඇතැම්විට අවට ගම්මානවලට පවා ඇතුළු වී ගවයන් එළුවන් වැනි සතුන් ඇදගෙන යන කොටි විටෙක ගෙවල් තුළ නිදාඉන්නා මිනිසුන්වද ඇදගෙන යති. එසේ වෙතත් බඩගින්නේ හඬන දරුවන්ගේ බඩගිනි නිවන්නට නම් කොටි කටට යනු විනා ජමාල්ට කරන්නට වෙන දෙයක් තිබුණේ නැත.

ඔහු ඇවිද ගියේ පෂූර් ගඟේ දකුණු ඉවුර අද්දරිනි. එහා ඉවුරෙහි වූ කොළ පැහැති උස් තණ කොළ ගොල්ලකි. තබන හැම පියවරක් පාසාම විපරමින් සිටීම මෙගම් වැසියන්ගේ පුරුද්දක් බැවින් ජමාල්ගේ දෙනෙතද හාත්පසට යොමුවිය. එක්වරම තණ කොළ ගොල්ල මතින් ඔහු දුටුවේ කහ පැහැති යමකි.

''කොටියා''

තමන්ටම කියා ගෙන එතැනම නැවතුණු ඔහු පසුපසට හැරුණේ දිවගොස් සැඟ වෙන්නටය.

''එපා''

ඔහුගේම සිත ඔහුට තරවටු කළේ දිවගොස් සැඟවීමට කොටියෙක් ඉඩ නොදෙන බව දැන සිටි නිසාය.

එක්වරම ඔහුගේ මතකයට ආවේ ඉන් සමසකට පමණ පෙර මුහුණ දෙන්නට සිදුවූ කොටි ප්‍රහාරයක උද්වේගකර අවස්ථාවේ මතකයයි.

එදා ඔහු ගං ඉවුර දිගේ ඇවිදයමින් සිටියේය. එක්වරම ඔහු දුටුවේ කොහෙහෝ හෝ සැඟව සිටි කොටියෙක් ඔහු වෙත දිව එන ආකාරයයි. ඔහුට සැඟවෙන්නට හෝ දිව යන්නට කිසිම ඉඩක් නොතැබූ කොටියා සිය නියපොතු දිගු කරගෙන ජමාල් වෙත පැන්නේය. ඒ තියුණු නියපොතුවලට අසුවූයේ ජමාල්ගේ කකුලකි. කකුලෙන් ඇද ගෙනම ගඟට පැන්න කොටියා උත්සාහ කළේ ගොදුර දියේ ගිල්වා අඩපණ කරගන්නටය. එහෙත් ජමාල් යනු දක්ෂ පිහිනුම් කරුවෙකි. ඔහු ගං පත්ලටම කිමිදුනේය...කර කියා ගන්නට කිසිවක් නොවූ කොටියාගෙන් ගොදුර අතෑරිණි. ජමාල් දිය යටින් බොහෝ දුරක් පිහිනා ගොස් දිය මතට මතුව වට පිට බැලුවේ කොටියා ඔහු පසුපසින් ලුහුබැඳ එන්නේදැයි සැකයෙනි.. එහෙත් කොටියා පෙනෙන මානයක නොසිටියේය.

එකම ගැලවුම්කරු වන 'ගාසි පීර්' සිහි කරගත් ජමාල් යටි ගිරියෙන් කෑ ගැසුවේය. ඔහුගේ සෝෂාකාරී හඬ කඩොලාන වනය දෙදර-වමින් පැතිර ගියත් කොටියා තවමත් වලිගය වනමින් ගොදුරට කුරුමානම් අල්ලමින් සිටී.

එදා යන්තමින් දිවි බේරා ගත්තත් දැන් යළිත් ඔහු ඉදිරියේ කොටියෙකි.

කෙසේ හෝ ජීවිතය බේරාගත යුතු බව කල්පනා කළ ජමාල්, කොටියා දෙස ඍජුවම බලා සිටියේය. තවමත් කොටියා වලිගය සොලවමින් ජමාල් දෙසම බලා සිටියේය. ඌ එහා ඉවුරේ සිටියත් මෙහා ඉවුරට පිහිනීම ඌට සුළු දෙයකි.

ගත වූයේ මොහොතකි. සැණින් ගඟ දියට පැනගත් කොටියා ජමාල් සිටි ඉවුරට පිහිනා එන්නට විය.

එකම ගැලවුම්කරු වන 'ගාසි පීර්' සිහි කරගත් ජමාල් යටි ගිරියෙන් කෑ ගැසුවේය. ඔහුගේ සෝෂාකාරී හඬ කඩොලාන වනය දෙදරවමින් පැතිර ගියත් කොටියා තවමත් වලිගය වනමින් ගොදුරට කුරුමානම් අල්ලමින් සිටී.

ජමාල් පෙරටත් වඩා හඬින් සෝෂා කළේය.

එහෙත් හමුවූ ගොදුර හැර යන්නට කොටියාද නොපැකිළුණි. ඌද වහා ගර්ජනා කරන්නට පටන් ගත්තේය.

දැන් දෙදෙනා මුහුණින් මුහුණ බලාගෙන එකිනෙකාට ගර්ජනා කරමින් සිටිති. දෙදෙනාගෙම ගර්ජනාවල හඬ දෙදෙනාම බයකරන තරමට ප්‍රබල බැවින් කොටියාද සිටියේ කිසියම් සැකයකිනි.

එක්වරම ඇසෙන්නට වූයේ මිනිසුන් කණ්ඩායමක් නැගූ මහා සෝෂාවකි. ගල් පොලු රැගෙන පැමිණි මේ පිරිස අත වූ ගල් සහ පොලුවලින් කොටියාට පහර දෙන්නට පටන් ගත්තෝය. ගලක් දෙකක් සිරුරේ වැදෙන්නට වූ විට කොටියා ආපසු හැරී ගං දියට පැන්නේ පලායන්නටය.

''තව පොඩ්ඩක් ගියා නම් මම අද මරු තුරුලේ''

ජමාල් කීවේ ගම් වැසියන් දෙස කෘතඥ පූර්වකව බලමිනි.

''ඔයා කෑ ගහන සද්දෙ මට ඇහුණා. ඒ වෙලාවෙම මම ගමේ කට්ටිය එක්කරගෙන දුවගෙන ආවා''

ජමාල්ගේ බිරිඳ කීවාය.

ජමාල් තවමත් කිසිවක් වටහා ගත නොහැකිව බයෙන් භ්‍රාන්තව බලා සිටියේය.

''නංගි ඇවිත් කිව්වාම මට මතක් වුණේ මීට මාසෙකට කලින් මගෙ ගෙට පැනලා අම්මව අරන් ගිහින් මිදුලෙ මරලා දාලා හිටපු කොටියව. මට බය හිතුණා. ජමාල්වත් ඒ විදිහට මට බලන්න වෙයිද කියලා. මම වටේ පිටේ හිටපු හැමෝවම අඬගහගෙන දුවගෙන ආවෙ ඒකයි''

මොන්ඩෝල් කීවේය.

උණ බම්බුවලින් සාදන ලද පැල්පතේ බිත්තිය බිඳගෙන මොන්ඩෝල්ගේ ගෙට කොටියා ඇතුළුව සිටියේ මැදියම් රැයේය. නින්දේ සිටි මොන්ඩෝල්ට විලාපයක් ඇසිණි. ඒ සිය මවගේ හඬ යැයි සිතූ මොන්ඩෝල් අම්මාගේ කාමරයට ගොස් බලනවිට ඇය ඇඳේ සිටියේ නැත. අතට අසුවූ පොල්ලකුත් රැගෙන මොන්ඩෝල් මිදුලට පැන්නේ මහ හඬින් සෝෂා කරමිනි. ඒ හඬින් බියවූ කොටියා ගොදුර මිදුලේ අතැර පලා ගියේය. හඳ එළියෙන් දිලිසුන මිදුලෙන් ඔහු දුටුවේ සිය මවගේ සිරුරයි. හිස තුවාල වී ලේ ගලන මුහුණක් සහිතව බිම වැතිර සිටි ඇය ඒ වනවිටත් සිටියේ සිහිසුන්වය.

ඒ බිහිසුණු මොහොත ජමාල්ගේ මතකයේ අවදි විය.

ඔහු සිය බිරියගේ පිටුපසින් නිවෙස දෙසට ඇවිද ගියේ කම්පාවෙනි.

''හොඳ වෙලාවට ඔයාට මං කෑගහන සද්දෙ ඇහුනෙ''

ජමාල් කීවේය.

''ඔයා කෑගහන සද්දෙ ඇහුණු හැටියෙම මම මොන්ඩෝල් අයියාට කතා කළා. කොහොම හරි ඔයාව ජීවත් කර නොගත්තොත් මටත් වෙන්නෙ අනික් කොටි වැන්දඹුවන්ට වගේම ගෙදරින් යන්නනෙ. මොකද මිනිහ මළාට පස්සෙ ඒ කනවැන්දුම් ගැනිව නැන්දම්මා ගෙදරින් එළවන එක එයාලගෙ චාරිත්‍රයක්නෙ.. ඊට පස්සෙ ඉතින් මටත් වෙන්නෙ අපා දුක් විඳින්න''


ජමාල්ගේ බිරිඳ කීවේ ඉවත බලාගෙනය.

සුන්දර්බන් වනය අවට ගම්මානවල පවතින කොටි වැන්දඹුවන් අවාසනාවක් ලෙස සලකන එම චාරිත්‍රය මොන තරම් අමානුෂිකදැයි ජමාල් සිතුවේ පළමු වරටය.

ශාන්ත කුමාර විතාන

**යාපන අර්ධද්වීපයේ ඉතා වැදගත් පුරාවිද්‍යා ස්ථානයක් වන කන්දරෝඩෙයි නොහොත් පුරාණ කදුරුගොඩ ස්තූප සංකීර්ණයේ 2025 ජූලි මස කරන ලද කැණීමකින් දැනට තිබෙන චෛත්‍ය අවශේෂයන්ට යටින් වටදාගෙයක පාදමක් මතුව තිබෙන බව පුරාවිද්‍යා ආචාර්ය නිමල් පෙරේරා මහතා දක්වයි. වර්ෂ 1917 දී පී.ඊ.පී. දැරණියගල මහතා විසින් මුල් වරට මෙම ස්ථානය ගවේෂණය කොට ඒ ස්ථානයේ තිබූ බුදු පිළිම, සිරිපතුල් ගල් සහ තවත් නටබුන් කීපයක් යාපනයේ කෞතුකාගාරයේ තැන්පත් කිරීමෙන් පසුව 1965දී හිටපු පුරාවිද්‍යා කොමසාරිස් රෝලන්ඩ් සිල්වා මහතා විසින් මෙම ස්ථානයේ නටබුන් රැසක් සංරක්ෂණය කොට අවසන් කර ඇත. ඔහුගේ වාර්තාවේ මෙම වටදාගෙය පිළිබඳ මූලික අදහසක් ඉදිරිපත් කර ඇත.**





## යාපනය අර්ධද්වීපයේ බෞද්ධ උරුමය නැවත නැවතත් මතු කරමින්

# කදුරුගොඩ කැණීමෙන් වටදාගෙයක අත්තිවාරම මතුවේ

වංශකතා තොරතුරු අනුව යාපනය හඳුන්වා දී ඇත්තේ උත්තරපස්සය යනුවෙනි. වල්ලිපුරම් රන් සන්නස අනුව නකදිව යනුවෙන් තිබෙන ව්‍යවහාරය ඉතා වැදගත්ය. නාග ද්වීපයේ බෞද්ධ සමාජය ඇති වීම සම්බන්ධයෙන් දේවානම්පියතිස්ස රජ දවස උදාහරණ වශයෙන් ගත හැකිය. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම වීමත් සමග සංඝමිත්තා තෙරණියන් වහන්සේ අනුදත් ස්ථානවල බෝධි රෝපණය ද විහාරස්ථාන සකස් කිරීම ආදිය සිදු විය. ජම්බුකෝළ විහාරය, තිස්ස විහාරය, පාචිනාරාමය, වාලුකාරාමය ඇල්ගිරිය වෙහෙර, තිනවේලි වෙහෙර ආදී වශයෙන් මූලිකව විහාරස්ථාන කීපයක් දේවානම් පියතිස්ස රජු විසින් සකස් කළ බව සඳහන්ය. නමුත් කදුරුගොඩ පෙදෙස පූජනීය බවට පත් වන්නේ දෙවනවර බුදුන් වහන්සේ ලංකාවට වැඩම කොට චූලෝදර මහෝදර නා රජුන්ගේ කලහය සන්සිඳුවූ අවස්ථාවේ දී සමහන් සුවයෙන් සිටි ස්ථානයක් වශයෙන්ය. එතැන කිරිපලු වෘක්ෂයක් රෝපණය කළ බව ද ඒ නිසා රාජායතන චෛත්‍ය යනුවෙන් හැඳින්වූ බවද සඳහන්ය. දේවානම්පියතිස්ස රජ දවස දී මේ පෙදෙස තවදුරටත් පූජනීය බවට පත්විය. ඉන්පසුව කනිට්ඨතිස්ස, වෝහාරතිස්ස, දෙවනි අග්බෝ, සතරවන කාශ්‍යප මහා විජයබාහු වැනි නරපතියන්ගේ කාල වකවානුවල දී යාපනය පෙදෙස තුළ ඇතිවූ බෞද්ධ සමාජය ඉතා ශක්තිමත්ය. විහාරස්ථාන තැනීමේ අරමුණු අතර විදෙසින් පැමිණෙන



ආක්‍රමණ වළක්වාගැනීම ද විය. යාපනයේ වල්ලිපුර පෙදෙසේ පැරණි ස්ථානයක අත්තිවාරම් කපන විට හමු වූ වල්ලිපුර රන්සන්නසෙහි එන පියගුකතිස නාමය තුළින් කියැවෙනුයේ පුවගුදිවයිනෙහි තිස්ස විහාරයක් තැනවූ ආකාරයයි. මෙහි රහතුන් වහන්සේලා විශාල සංඛ්‍යාවක් වැඩ සිට ඇත. යාපනයේ වැඩ සිටි රහතුන් වහන්සේලා හැටක් අපවත් වූ පසු උන්වහන්සේලාගේ භෂ්මාවශේෂ සහිත ධාතු කොටස් කදුරුගොඩ විහාර බිමෙහි ස්තූප හැටක් තනවා තැන්පත් කළ බව ද සඳහන්ය. මේ නිසා යාපන අර්ධද්වීපයේ බෞද්ධ සභ්‍යත්වය අප තේරුම් ගත යුත්තේ වෙනස්ම ආකාරකිනි. රහතුන් වහන්සේලා මෙහි වැඩ වසමින් කරුණාව මෛත්‍රිය පැතිරවීම සඳහා කැපවීම මෙහි දී දක්නට ලැබුණු සුවිශේෂී තත්ත්වයයි. උන්වහන්සේලා නිසා විදෙසින් පැමිණෙන සතුරු ආක්‍රමණ වැළකුණි. රටේ සාමය ස්ථාපිත විය.

යාපනයේ ආර්ය චක්‍රවර්තී පාලන සමයේ අවසාන භාගයේ දී සහ පෘතුගීසි යුගයේ දී කන්දරෝඩෙයි නැතිනම් කඳුරුගොඩ විහාරය විනාශයට පත් විය. අනතුරුව පෙර දක්වා ඇති පරිදි විසිවන සියවස මුල් භාගයේ දී මෙහි කළ කැණීමකින් පසුව බුදු පිළිම සහ නොයෙකුත් අවශේෂ කොටස් සොයා ගෙන ඇත. අනතුරුව 1971දී මේ ස්ථානය අක්කර තුනක පුරාවිද්‍යා තහනම් ඉඩමක් බවට පත්කර ඇත. මෙහි ජනාවාස පිළිබඳ මූලික විධිමත් අධ්‍යයනයක් කරන ලද්දේ 2011 වසරේ දී ය. ආචාර්ය නිමල් පෙරේරා සහ පෙන්සෙල්වේනියා විශ්ව විද්‍යාලයේ විද්‍යාඥයන් පිරිසක් එක්ව කරන ලද කැණීම් වලින් නොයෙකුත් පුරාවස්තු මතු කරගන්නට හැකි වී තිබේ. මේ කැණීම් වලින් තහවුරුව ඇත්තේ විශාල ප්‍රදේශයක නටබුන් විසිර ඇති බවයි. 2011 වසරෙන් පසුව 2019 වසරේදී ඉන්පසු 2023 වසරේ ද කළ කැණීම්වලින් ලැබුණු ප්‍රතිඵල වලින් සනාථව තිබෙන්නේ මෙය බෞද්ධ විහාර සංකීර්ණයක් වශයෙනි.



ඉදිකිරීම් ද අවදි කීපයකට අයත්වන අතර මෙහිදී ලැබුණු බුදු පිළිමය ආන්ද්‍රා පෙදෙසේ අමරාවතී පුදබිමේ බුදු පිළිමයන්ට සමාන බව තේරුම් ගත හැකි යැයි පුරාවිද්‍යාඥයන්ගේ අදහසයි. එසේම සාංචි හි තිබෙන විහාර කර්මාන්තවල දක්නට ලැබෙන ගරාදි ස්වරූපයේ හිරිගල් ඉදිකිරීම් ද මෙහි දක්නට ඇත. ආචාර්ය නිමල් පෙරේරා මහතා දක්වන්නේ ඉන්දියාවේ දක්නට ලැබෙන ඉදිකිරීම් වලට සමාන වන පරිදි මෙම පුදබිම ගොඩනංවා ඇති ආකාරයයි.

සාමාන්‍ය ජනප්‍රවාදය අනුව මෙහි දාගැබ් හැටක් තිබී ඇත. සිරිපතුල් ගල් හමුවන පූර්ව අනුරාධපුර අවදියෙන් පසුව දොළොස්වන සියවස දක්වා වූ කාලය තෙක්ම කදුරුගොඩ ප්‍රදේශයේ පැතිරුණු බෞද්ධ සංස්කෘතිය හේතුවෙන් විවිධ ඉදිකිරීම් මෙයට එක්වී ඇත. 2023 වසරේ දී ස්තූප ගොඩැල්ලට පරිබාහිරව ස්ථාන අටක කැණීම් වළවල් මගින් ලැබුණු තොරතුරු අනුව ක්ෂුද්‍ර ශිලා සභ්‍යත්වයක තොරතුරු රැසක් ලැබී ඇත. ඊට අමරතව ක්‍රි.පූ. සත්වන සියවස දක්වා දිවයන ජනාවාස ස්වභාවයක් දකින්නට තිබීම විශේෂය. ක්‍රි.පූ. තෙවන සියවසේ සිට ක්‍රමානුකූලව වැඩී ගිය බෞද්ධ සභ්‍යත්වයක නටබුන් රැසක් ද මේ අතර හමුවෙයි. ඒ අතර බ්‍රාහ්මී අක්ෂර සහිත මැටි බඳුන් කැබලි, කානීලියන් පබළු, වර්ණාලිප්ත මැටි බඳුන් විශේෂිතය. කදුරුගොඩ විහාර පෙදෙසට පරිබාහිරව දැනට ජනාවාසව පවතින ස්ථාන අට අතරින් හත්වන කොටසින් පළමුවන සියවසට අයත් ලක්ෂ්මී කාසි, රෝම කාසි සහස්සමල්ල කාසි වැනි දේ ලැබීම තුළින් ගම්‍ය වන්නේ මේ ස්ථානය සමග පැවති විදේශීය සම්බන්ධයයි. ඊට අමතරව වීදුරු හා මැටි පබළු රාශියක්ද අක්ෂර සංකේත සහිත මැටි බඳුන් කැබලි සහ භාජන මගින් පළ කරන සංස්කෘතිය වෙනමම විග්‍රහ කළ යුතු තත්ත්වයක පවතී. අනතුරුව එකොළොස්වන සියවසට අයත් අවශේෂයන්ද අටවන කැණීම් වළෙන් හමු වී තිබේ. යාපන අර්ධද්වීපය තුළ මහා විජයබාහු රජු සහ මහා පරාක්‍රමබාහු රජු විසින් කළ සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ වංශ කථාවල හමුවන බැවින් මේ හමුවීම් සාධාරණය. පොළොන්නරු කාලය දක්වා මේ ප්‍රදේශයේ බෞද්ධ සමාජ තත්ත්වය වර්ධනය වී ඇති බව පැහැදිලිය. 1971 වසරේ දී කරන ලද කැණීමකදී දතහපතහ නමින් යුක්ත මැටි බඳුන් කැබැල්ලක් හමුව තිබුණි. එය ක්‍රි.පූ. දෙවන සියවසට අයත් අක්ෂර බවට දක්වා ඇත. අනුරාධපුර ඇතුළු නුවර කැණීම්වලින් හමුවූ උපතිස නම් අක්ෂරය සහිත වළන් කැබැල්ලට මෙය සමානය. යාපනය පුරාවිද්‍යා සංගමය මගින් 1973 දී ප්‍රකාශයට පත් කර ඇති පුවර්කලා නම් සඟරාවට මහාචාර්ය කේ. ඉන්ද්‍රපාන් විසින් රචනා කළ ලිපියක මේ ගැන පැහැදිලි විස්තරයක් දක්වා තිබිණ. එසේම කිඹිසි මුහුණ සහිත හිරි ගල් ටැම් කැබැල්ලක් මැටිවලින් තනන ලද කරඬුවක් ආදී වශයෙන් කුතුහලය දනවනසුලු ද්‍රව්‍යයන් ලැබී ඇත. එසේම නව වන සියවසට අයත් සතරවන කාශ්‍යප රාජ්‍ය කාලයට අයත් අත්තාණි කණුවක් සහ ටැම් ලිපියක් දක්නට ලැබීමෙන් සනාථ වන්නේ මේ ස්ථානය අභයගිරි විහාරයට අනුබද්ධ සිද්ධස්ථානයක්ව පවතින්නට ඇති බවයි. 2023 කැණීම් මාස තුනක් පුරා අඛණ්ඩව පැවති අතර මේ සඳහා ජර්මනියේ පුරාවිද්‍යා අධ්‍යයන ආයතනයේ අරියානි සක්සි ක්‍රිස්ටියන් හාර්ට්ල් ඇතුළු විදේශීය පුරාවිද්‍යාඥයන් ද දේශීය පුරාවිද්‍යාඥයන් ද සහභාගි වී ඇත.



2023 කැණීම්වලදී කරන ලද විශේෂිතම විද්‍යාත්මක පෙළගැස්ම නම් කදුරුගොඩ ගුවන් සිතියම්ගත කිරීමයි. ඒ නිසා ඉතාමත් සූක්ෂ්ම භූ රූපණ ලබා ගන්නට හැකි වුණි. ඒ භූ රූපණ අනුව දැනට ස්තූප තිස්හතක අවශේෂයන් පැහැදිලිව දර්ශනය වේ. මෙයට ආසන්නයේ ගලා බසින වාලුකී ආරුව නිසා කන්දර ඕඩෙයි යන නාමය මෙයට ව්‍යවහාර වන්නේ යැයි කියති. නම් පොත හෙවත් විහාර අස්නේ දක්වන්නේ කදුරුගොඩ යනුවෙනි. මෙහි පැවති විහාරය පිළිබඳ සහ බුදුන් වහන්සේගේ ලංකාගමනය අවස්ථාවේ දී සඳහන් රාජායතන චෛත්‍යය පිළිබඳ අපට හෙළි කර ගත හැක්කේ විධිමත්ව දියත් කරන ලද කැණීමකින් පසුවයි. එයට මුලපිරීමක් වශයෙන් 2025 වර්ෂයේ ජූලි මාසය තුළ සපුරා මාසයක් කදුරුගොඩ විහාර පරිශ්‍රය තුළ පවතින ප්‍රධාන චෛත්‍යය ආසන්නයේ පෙර දක්වන ලද පරිදි ආචාර්ය නිමල් පෙරේරා සහ අරියානි සක්සේගේ මූලිකත්වයෙන් කැණීමක් සිදු කරන ලදහ. ඒ මගින් චෛත්‍යයේ පාදම සහ මීට කලින් පුරාවිද්‍යාඥන් සඳහන් කරන ලද වටදාගෙයි පාදමේ ස්තරයන් මතු වීම තුළින් පැහැදිලි වූයේ පෙර නිගමනයන් නිවැරදි බවයි. කදුරුගොඩ දාගැබ් අතර විශාලතම ස්තූපය විෂ්කම්භයෙන් අඩි විසි තුනකි. කුඩාම ස්තූපය අඩි හයකි. මෙම විශාල ස්තූපය අසල මේ වටදාගෙයි පාදම හමු වී ඇත. එනම් මෙම ස්ථානයේ පැවති පුරාණ විහාරය පසු කාලීනව රහතුන් වහන්සේලාගේ අපවත්වීම මත විශේෂ ආදාහන මළුවක් බවට පත් වූ ආකාරය තේරුම් ගත හැකිය. නමුත් මේ පිළිබඳව අවසාන නිගමනයකට පැමිණෙන්නට නම් සම්පූර්ණ භූමිය කැණීමකට ලක් කර කාල වකවානු තීරණය කර විධිමත් වාර්තාවක් නිදහස් කළ යුතු වෙයි. එහෙත් ඊට අවසර නැත. ආචාර්ය නිමල් පෙරේරා මහතා පුරාවිද්‍යා පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ දී කරන ලද දේශනයකදී මෙම නව කැණීම පිළිබඳ අදහස් දැක්වීම සිදු කළ අතර සම්පූර්ණ කැණීම නිසි පරිදි සිදු විය යුතු බවට පැවසීය. උතුරේ බෞද්ධ ඉතිහාසය නිවැරදිව හෙළි කරගත හැකි වන පරිදි කදුරුගොඩ කැණීම පිළිබඳව පරිපාලනමය තීරණ ගැනීමට හැකිවේවා යන්න අපගේ පැතුමයි.




**මතුගම සෙනෙවිරුවන්**



ඔබේ පුදබිමට අපෙන් ඉඩක්

ඔබේ ප්‍රදේශයේ, ගමේ, නගරයේ විහාරස්ථානය, දේවස්ථානය සහ එම ආගමික මධ්‍යස්ථාන විසින් සිදුකරනු ලබන ආගමික වැඩසටහන් සඳහා දීප ව්‍යාප්ත ප්‍රචාරයක් ලබාදීමට ඉරුදින මොනරා "පුදබිම" විශේෂාංගය මගින් ඉඩ වෙන්කර ඇත. වැඩි විස්තර සඳහා 0117006701 දුරකථන අංකයෙන් විමසන්න.

කිරුළ

අපේ ලිපිනය:
සංස්කාරක (කිරුළ/අනන්තය),
ඉරිදා මොනරා,
අපේ ජනහඬ පබ්ලිකේෂන්,
42, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත,
කොළඹ 08.

2025 දෙසැම්බර් 07 ඉරිදා කොළඹ 08, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතේ, අංක 42 හි අපේ ජනහඬ පබ්ලිකේෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් එක්ස්ප්‍රස් නිවුස්පේපර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.